# චින්තන ප්‍රණාම

## නිර්මාණ තරගාවලිය - 2020

# කොරෝනා කාලේ

# පන්හිඳ

සංස්කරණය

ආචාර්ය දේව මයිකල් ද සිල්වා

එන්.එච්.ටී අනුරුද්ධ

සංජු රංගොඩගේ

ls 9600

ප්‍රකාශනය - සංස්කෘතික කෙන්ද්‍රය රුහුණ විශ්වවිද්‍යාලය

# කොරෝනා කාලේ පන්හිඳ

**සංස්කාරකවරු**

ආචාර්ය දේව මයිකල් ද සිල්වා

එන්. එච්. ටී. අනුරුද්ධ

සංජු රන්ගොඩගේ

## රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍ර සම්බන්ධීකාරක තුමාගේ පණිවුඩය

කොවිඩ් - 19 වසංගතය විසින් ලොව දියුණු රටවල මෙන්ම නොදියුණු රටවල ද ක්‍රියාකාරීත්වය මුළුමනින්ම අඩපණ කිරීමට සමත් වූයේය. මෙම දුර්භාග්‍ය සම්පන්න අවිනිශ්චිත වකවානුව තුළ අපේ අදීන සංස්කෘතිය ඔස්සේ බලාපොරොත්තු ගොඩ නගාගෙන එම මොහොත මැනවින් කළමනාකරණය කරගෙන යහපත් අයුරින් ජීවිතය දෙස අපූර්වත්වයකින් යුතුව බලන්නට සමස්ත ශ්‍රී ලාංකේය සමාජයට මෙන්ම ඊට අයත් විශ්වවිද්‍යාල ප්‍රජාවට ද අවස්ථාවක් උදාවිය. මෙම අනගි අත්දැකීම් සමුදායන් නිර්මාණාත්මක ආකාරයෙන් ඉදිරිපත් කිරීමට වේදිකාවක් ඉදිකර දීමේ මාහැඟි පරමාර්ථය පෙරටු කොට ගෙන සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ආදී කතෘවර ආචාර්ය රොනී ද මෙල් සූරීන් හා එය ඉදිකිරීමෙහිලා ගෘහ නිර්මාණ ශිල්පියාණන් වශයෙන් කටයුතු කළ ජෙෆ්රි බාවා මහතාණන්ට ප්‍රණාමය පළකිරීමේ පරම පවිත්‍ර අභිලාෂයෙන් රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍රය විසින් "**චින්තන ප්‍රණාම නිර්මාණ තරගාවලිය**" 2020 වර්ෂයේ ජුනි මාසයේදී ආරම්භ කරන ලදි.

මෙම තරගාවලිය සඳහා රුහුණ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය, අධ්‍යයන, අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ විශාල පිරිසක් විසින් නිර්මාණ රාශියක් ඉදිරිපත් කර තිබුණි. ඒවා අතරින් තෝරාගනු ලැබූ ජයග්‍රාහී නිර්මාණයන් ඇතුළත් "**චින්තන ප්‍රණාම නිර්මාණ තරගාවලිය - 2020 කොරෝනා කාලේ පන්හිඳ**" නම් වූ පොත් පිංච විද්‍යුත් මාර්ගිකව ඔබ වෙත තිළිණ කිරීමට ලැබීම පිළිබඳව සතුටු වන අතර පළමු කොටම මේ උසස් කටයුත්ත සාර්ථක කර ගැනීම සඳහා නිරන්තරව මඟ පෙන්වමින් උපරිම සහයෝගය ලබාදුන් රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති තැන්පත් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුජීව අමරසේන මහතාට හා නියෝජ්‍ය උපකුලපති පී.ඒ. සමන් චන්දන මහතාටත්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨාධිපති මහාචාර්ය උපාලි පන්නිලගේ මහතා ඇතුළු සංස්කෘතික කේන්ද්‍රයේ උන්නතිය වෙනුවෙන් ඇප කැපවී ක්‍රියා කරමින් සිටින සියලුම පීඨ සම්බන්ධීකාරක භවතුන්ට මාගේ උසස් කෘතවේදී ගෞරව පූර්වක ප්‍රණාමය පුද කරනු කැමැත්තෙමි.

තවද, මේ තරගාවලියට ඉදිරිපත්වූ නිර්මාණ ඇගයීමේ භාරදූර කටයුත්තේ දී නිස්සරණාධ්‍යාසයෙන් යුතුව උදව් උපකාර කළ රුහුණ විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ අංශාධිපති ආචාර්ය දර්ශන ලියනගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍යපාද අපරැක්කේ සිරි සුධම්ම හිමි ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සන්ධ්‍යා කහඳගමගේ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්. එම්. බී. විජේසිංහ, රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ දෙපාර්තමේන්තුවේ හිටපු අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කේ. එස්. ජී. එස්. නිශාන්ත, කථිකාචාර්ය පී.ඒ. දහනායක, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නන්දසිරි කීඹියහෙට්ටි, ප්‍රවීන රාජ්‍ය සම්මානලාභී කිවියර වෛද්‍ය අසංග සාගර සහ රුහුණ විශ්වවිද්‍යාලයීය සංස්කෘතික කේන්ද්‍ර පාඨමාලා සම්බන්ධීකාරකවරුන් වන ආර්. එස්. උෂාන්, වජිර බොරලැස්ස හා තාරුක පුෂ්පකුමාර යන මහත්ම මහත්මීන්ට මෙන්ම චින්තන ප්‍රණාම නිර්මාණ තරගවලිය ආරම්භයේ සිටම මෙම වැඩ සටහන සම්බන්ධව වෙබ් පිටුව යාවත්කාලීන කිරීම් සිදු කළ රුහුණ විශ්වවිද්‍යාලයීය මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ පරිගණක අධ්‍යයනාශයේ අංශාධිපති

ආචාර්ය කෝකිල රාමනායක මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් සඟරාව සඳහා IS අංකය ලබා ගැනීමට උදව් කළ රුහුණ විශ්වවිද්‍යාලයේ වැඩබලන පුස්තකාලයාධිපති නිමල් හෙට්ටිආරච්චි මහතාටත් මාගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

තෙවනුව මෙම තරගාවලිය සඳහා නිර්මාණ ඉදිරිපත් කරන ලද රුහුණු විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය, අධ්‍යයන, අනධ්‍යයන ප්‍රජාවටත්, මෙම ග්‍රන්ථය සඳහා පිටකවරය නිර්මාණය කළ රුහුණ විශ්වවිද්‍යාලයේ ආදී විද්‍යාර්ථීයකු වන දමින්ද වාදසිංහ මහතාටත්, අක්ෂර සංයෝජනයෙහිලා කැපවූ සංස්කෘතික කේන්ද්‍ර කටයුතුවලදී ඉහළ දායකත්වයක් ලබා දෙන කළමනාකරණ සංවර්ධන නිලධාරීන් වන එන්. එච්. තරංග අනුරුද්ධ සහ සංජු රංගොඩගේ යන මහත්වරුන් දෙපළට සහ සංස්කෘතික කේන්ද්‍රයේ සියලු කාර්යයන් හිදී දූඩි කැපවීමකින්, උනන්දුවෙන් හා උවමනාවෙන් යුතුව රාජකාරී කටයුතු සිදුකරනු ලබන ඩී.ටී. උක්වත්තගේ, එන්. එච්. එම්. නිශාන්ති, එන්. ජී. ප්‍රදීත් නිලංග යන සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී මහත්ම මහත්මීන්ට සහ සංස්කෘති කේන්ද්‍ර කාර්යාලීය කටයුතු මැනවින් ඉටු කරනු ලබන එච්. ඩබ්. එන්. චරිත් නිමන්ත මහතාටත් වේලාව අවේලාව නොබලා සංස්කෘතික කේන්ද්‍රයේ කටයුතුවලට නොමඳ සහායක් ලබාදෙන මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ පාඨමාලා ඒකකයේ කළමණාකාර සහකාර හයසින්ත් ජයවර්ධන මහත්මියට සේම එහි සේවයේ නියුතු පී.පී. අමිල චන්දන මහතාට මාගේ අවංක ආදර ස්තුතිය පුද කරනු කැමැත්තෙමි.

ආචාර්ය දේව මයිකල් ද සිල්වා
සම්බන්ධීකාරක,
සංස්කෘතික කේන්ද්‍රය,
රුහුණ විශ්වවිද්‍යාලය

## කොරෝනාවත් ප්‍රේමයක්

දවස ගෙවුනෙම හයර් මත්තෙම
ඉරත් එක්කම ඇහැරුනා මිස
මතක නෑ අපි ඇසට ඇස පා
වචන යා කළ වෙලාවක්

දවස් ගණනක් වැහුණු දොරකඩ
ඉන්න ලැබුනම දිවා රෑ යාම
එළිය විහිදුනි හිත පුරාවට
ඇඳිරිනීතිය මුලාවක්

හීන නිර්ධන,යහන අග ඇත
කලාතුරකින් අපිට අපි ඇත
හරි මැදින් පොඩි එකා තිබ්බම
ජීවිතේ හැඩ සිත්තමක්

හාල් තුනපහ නැතිවුනාදෙන්
වාරිකේ පාවෙලා ගියදෙන්
ආදරේ එක මිටට අරගෙන
කවපන් මට බත් කටක්

ගිනිතියාපන් සීට්ටුවෙ හිඟ
සෙල්ෆියක් අරගමුද හැඩකර
ආදරේ වැඩිවුනානම් ඒ
නිරෝදායන කාලයක්

හීන තාමත් හයර් හොයනව
ආයෙමත් මම යන්න යනකොට
පොලීසිය නැති තැනක මවමුද
පරිස්සම් නැති හිනාවක්

ලෝකයක් මර බයේ ඉද්දී
හුස්ම ගන්නා කාලෙකින් අපි
එහෙම බැලුවම ඉතින් සොඳුරිය
කොරෝනාවත් ප්‍රේමයක්

ආයෙමත් අපි හැල්මේ දුවනව
හැම දුකම රෙදිකඩින් වහගෙන
කිසිම දවසක බෙහෙත් නාහන
ජීවිතේ වෛරස් එකක්

**නිසඳැස් - ප්‍රථම ස්ථානය**

**" කොරෝනාවත් ප්‍රේමයක් "**

**සුසිත් නිමන්ත සිරිවර්ධන**

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**



## සඳ නිවෙන් කලින් එන්න

ඉර වපරැස නිවන මොහොතේ
ඇදිරි නීති බලපත්‍රය අතේ තියන්
රතු මරුටිය පාර කොනේ
උණ පදුරට මුවාවෙලා
බොනට්ටුවේ කට ඇරගෙන
බැලුම් හෙලන්නේ
කළු සිල්ලර විසිකරන්නෙ
වගෙ උදුම්බරා එතැයි කියා

බඩින් යට මා අත තබා
රෝද පුටුවට වෙර තියා
පාදෙ මුල මගෙ ධන නමා
වැද මුදුන් දොහොතක් තබා
සමා දෙනු මැන ඇයදුවා

ෆැක්ට්‍රියේ ගාමන්ට් එකේ
හිමි සළු වඩන නාමලී
රෝදෙ ජීවන මං පෙතේ
ලතවෙ නෛතික බත් පතේ
කොවිඩ් මාරක ලිද වටේ
පට ලනුව තන නොළුවුනේ

කුස්සියේ දුම්මැසි කදේ
වේල දෙවෙලින් හිස් වුනේ
කරඬුවේ කිරි වියැලුනේ
පුතුන් මා දැතෙහි රැදේ
පස්ස දොරැහින් පැන ගියේ
පතිපතයි මදහස ඇගේ

හොටෙල් රූම්ස් ලොක් ඩවුන් වනත්
ඩීල් ඇති කළු වැන් වන්නේ
ෆාමසිත් දැන් වහල ඇත්තේ
ජීවිතේ දැන් රැදී ඇත්තේ
වත්තෙ අන්නසි ගැටේ මත්තේ

කනිසමේ දොලහට මැදියමේ
පතුරු ගැලවුනු ලීසතර වැට මතින්
යාත්‍රා කරන විට ඒ මේ අත
රෝද දෙක මැද තනිවූ
හැගුම් නොදැනෙන කකුල් කොට
උළුවස්සේ හපමින්
චූදිතයා කරමි මා

බැන්ද පෙම සෙනසුරුට වරදින්
සුරත පැටළුන මා සුවිප් ලැල්ල මත
දෛව යෝගය අභිසාරිකා නුබෙ
මදුරුවන් කෙළි රූ වදන්
පැණි පිරුණ බාදුරාවක් ගැන
සිහිවුනා තුන්යමේ මා හට

කඳුල් වැව් තාවුල්ල ඉරිතල
කිලිටි වූ කඩමාළු විසිකර
දෝත පැවෙමි ඇගේ දැනට
ඉසුරුමුනි පෙම් යුවල අප අත
ඉඩක් ඇත දු මැණිකකට තව

**නිසඳැස් - දෙවන ස්ථානය**

**''සඳ නිවෙන් කලින් එන්න ''**

**සඳුනි සුලක්ෂිකා ගීගනගේ**

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

**ළාදළු මත ඇස් ලබා**

සිත් අහස මත රැඳුණු සේපාලිකා රහස්

මිරිඟු ඉම් මානයේ සුදු සිහින දකිනවා

තුලාවක අඩු පඩිය රුපියලේ අඟය මත

ඩොලර් හිනැහෙන දවස් අඳුර බිලිගන්නව

මරුකතරෙ පුපුරනා කඳුළු කැට අඳුනගෙන

පොලව මත ඇවිදින්න බලවතුන් නමනවා

ඉරි ඇඳුණු කැඩපතේ වර්ග වූ ලෝකයම

ලෙහී ගිය සැත්කමේ නූල්පට මසනවා

අප අපව නොහඳුනන රූකඩව නටන ගත

දදළු මත ඇස් ලබන සුභ සිහින දකිනවා

සෙනෙහයේ හිරිකඩක ලෝකයම නතරවී

මුබ වාඩමක් යටින් මුදුසිනා සලනවා

**නිසඳැස් - තෙවන ස්ථානය**

**''ළදළු මත ඇස් ලබා''**

**උමංගා කාවින්දි විතානාච්චි**

**මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**



## වෛරසයට නොදෙවෙනි පිය සෙනෙහස

දොහොත් මුදුන් දෙමි මියගිය අම්මාට
දෝණියෙ උඹව අප්පච්චිට දුන්නාට
නැති බැරි වුණත් උඹ යහමගට ගන්නට
උදේ හවා මම වෙහෙසුණෙ ඇද මුට්ට

අප්පච්චිගේ සුභ සිහිනය ඉටු වීලා
ලොකු දූ වසකි සරසවියට සමත් වෙලා
අද ඒ මගට රුදු රකුසෙක් හරස් වෙලා
දින සති ගෙවෙයි සරසවියත් දුරස් වෙලා

පොඩි පුතු හඩයි නිතරම පාසල් යන්න
දුරකථනයක් බැහැ නොවැ මිළයට ගන්න
මුට්ට නැහැනෙ අප්පච්චිට ගෙන යන්න
දුපුපත් නිසා පුතුනේ මගෙ ඉවසන්න

මරණ බියෙන් මුළු ලෝකය ඇළලිලා
ඉවසනු නොහැක උඹලට කුසගිනි දිලා
උදේ ගියේ එළවළු ලොරියක නැගිලා
සුළු මුදලක් ලැබුණා මට පිං තකලා.

දොස්තර අතින් සැමදා ලියු බෙහෙත් පෙතී
කොපමන බියු නමුදු ලෙඩ ඉවරයක් නැතී
කරගැහුවත් මුට්ට මහතුන්ගේ පිනැතී
සිත සව්මුත් ගත දැන් සවියක් නොමැතී

වතුපිටි වල ගොවිතැන් කරන මහතුන්
ලොකු කඩ වල බඩු මලු පුරවන අඟනුන්
මුඛ ආවරණ පළදාගෙන යන තරුණන්
දැක සිත දැවුණි නොදැනිම වැටුණා සුසුමන්

දරුවන් නොදැක වෙහෙසෙන දොස්තර මහතුන්
දිව රැ අප රකින එඩිතර මුර සෙබළුන්
රුදු වෛරසේ ළඟ දන නැමු පිටරැටින්
ලොකු පුතු සිහිව හැඩුවා රැයකදි තනියෙන්

බුදු සම්දුන්ගෙ රැකවරණය ලැබෙන්න
තිස්තුන් කෝටියක් දෙවිවරු රකින්න
පියකුගෙ සුසුම් දුක් කඳුලැලි දකින්න
රෝ බිය දුරල හදවත් ගිනි නිවන්න

**සඳැස් - ප්‍රථම ස්ථානය**

**''වෛරසයට නොදෙවෙනි පිය සෙනෙහස''**

**එස්. මිනුකා ෂෙහානි**

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**



**ජීවිතයේ සැබෑ අරුත**

සුදු කොඩි බැනර් රැලි පාලම කිසිත් නැත
මහත්වරුගේ ගුණ ගායනා නැත
සිරිත් ලෙසින් මල ගෙදරට සෙනග නැත
කොවිඩ් ඇවිත් ඒ හැම වලකා ඇත

මළ ගෙදරට ගිහින් පෙට්ටියෙ මිල සෙයනා
සැරසිලි මල්වඩම් ගැන නිරතුරු කියනා
කන්නට දෙන බත්පතෙහිත් ඇද කියනා
පින්බර ලියෝ කෝ අද තැන තැන වෙසෙනා

මතක බණට චිත් මිදුලේ කොනට වෙන
බිස්කට් තේ කෝපි නිරතුරු රස විදිනා
පොරකන එකිනෙකා බත් මුල් බැඳ ගන්න
නෑ හිත මිතුරු කැළ කෝ අද තනි රකින

ලොව සුපතලම රටවල් ඇත සුපිරි බල
කොවිඩ් ඇවිත් බිඳ දැම්මා එ හැම බල
පොකුරු පිටින් එක තුල නිදන් කල
දිවියේ අරුත බල හැමටම පසක් කල

පුහු ආටෝප බොරු සෝබන වැඩක් නැත
කුල ගොත් ධන බලය ඉන් කිසි වැඩක් නැත
වටහාගෙන දිවියේ හර බර අරුත
ජීවත් වන්න කාලය දැන් එළඹ ඇත



**සඳැස් - දෙවන ස්ථානය**

**"ජීවිතයේ සැබෑ අරුත"**

**කේ. කේ. මල්ලිකා**

**පාලන අංශය**

## ලොවට හඬ ගෑ කොරෝනා

ඇවිත් මහරුපු වසංගතයක් ලොවම දෙදරා හෙන දීදී
සිව් කොනම එක ලෙසට ගිලහෙන නපුරු රකුසා පන දිදි
වෙන්ව වැට බැදි මනුසතත් දැන් අවදි වීගෙන බිය දීදී
සිහි නැගිල ඇති හැම එකාට ම දෛවයක සැර සිහි දීදී

විරසකව වැට ගසාගෙන සිටි එහා මායිමේ කෙලවරේ
පාරවහලා ලොක්ඩවුන් ඇත නොහැක සිටිනට ගින්දරේ
සාගින්නෙ තද දැනී හඬනා පොඩි පුතුගේ ඉකි නදකෙරේ
කැවුවේ බත් බිඩ එහා එකිනේ එකිනේ තරහ දුරලා පුතු කෙරේ

කෑව රසබොජු හැටේ තාලෙට සුපිරි පන්නයෙ හෝටලේ
නැවක වැටිලා ගමේ රසකට කොස් මදුලු බතලේ කොලේ
මීටරේ දුර ලඟ තියාගෙන හික්ම ඇති අරුමය යලේ
හුගක් පාඩම් අවදි කරලා සොබාදහමත් මේ වෙලේ

ජාති ආගම් භේද හැරදා ලොවම වසගෙට ගත් දිනේ
මතක් කැදුනි මිනිස්කම් යළි ලොවම සටනට යන දිනේ
දුබල මිනිහට සරණ පාමින් ප්‍රබලයා පානා සෙනේ
මෙයම නොවෙදෝ බලා සිටියේ සොබාවත් හිනහී කොනේ

පෙර කාලේ උන් සොයා ගත් දේශයේ ඖෂධ පැනී
ජීවෙ දුන්නලු මෙදා පාරත් නිමවන්නට ගතයෙහි ගිනී
බොහෝ උන්දැලැ වගා කරනවා නිවාඩුව විදිමින් වැනි
කමුතුව යළි අරන් ඇවිදින් සැමට පාඩම් ගෙන පෙනී

සෙනේ වඩමින් ලොවේ ගුණදම් මතුවටත් උරුමය ඇතී
බලය යටවෙයි සොබා දහමට මහ එකත් වැටුණලු හනී
පවුල් සැමදෙන එකට ලංකෙරු කොරෝනගෙ උරුමයෙ ගැනී
මිනිස් ගුණයෙන් ලොවම රොක්වෙමු රකින්නට ලොව පරගැතී

කොරෝනා කියන්නේ ආලයකි සොදුරු
රතට හුරු කහපාට හැන්දෑවේ වලාකු

**සඳැස් - තුන්වන ස්ථානය**
**‘‘ලොවක් හඬ ගෑ කොරෝනා’’**
**එන්. බී. ඉෂාරා මධුභාෂණී**
**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**

ඈ

"දුවෙක් ද පුතෙක් ද කියන්න මැණිකේ. ඔයා මොකද හිතන්නේ දැන් බඩට මාස අටත් පහුවෙලා ඔයා එන්නෙ නැනේ ස්කෑන් කරලා බලන්න යන්නවත්. ඔයාලගේ අම්ම නම් කියන්නේ දුවෙක් වෙයි කියලා. ඔයා වගේම ලස්සන දුවෙක් වෙයි. මගේ චූටි දුවේ,

තාත්තාව ඇහෙනවද, ඉන්නකො මං මයෙ දුවට ලස්සන සින්දුවක් කියන්න."

මහත්තයා මයෙ කුස අත ගගා දූ පැටියට සිංදු කියනවා.

> **"සඳ තරු මල් මට දන් දුන් මගේ රුසිරු**
> **නුඹ අරගන් හිරු තෙදවන් මට දන් දුන්**
> **මගේ ඔටුනු නුඹ ලා ගන් දායද එයයි**
> **මගෙ දොනීට අපි දෙන්නාගේ**
> ……………..."

මහත්තයා ලස්සනට සිංදු කියනවා. ඉස්සර මට හිසේ කැක්කුම හැදිලා නින්ද යන්නෙ නැති වුනාමත් මහත්තයා මයෙ ඔළුව අතගගා කවි කියනවා. "තාත්තගෙ කටහඬ දුවටත් තියෙයි." එහෙම හිතත්දිත් මට හරි සතුටුයි. දෝණිට ඇඳුම් පොඩියක් මහන ගමන් මං හිතුවා.

හැමෝම කිව්වේ දරුවා දුවක් වෙයි කියලා. ඉතින් මොකද මන්දා මටත් එහෙමම හිතුනා. ඒකයි මං ඇඳුම් පොඩි ටික රෝස පාටින් ම මැහුවේ. මහත්තයත් ආස වුනේ මුලින් දුවෙක් ලැබෙනවට.

"මහත්තයා, මහත්තයා මේ බලන්නකෝ පැටියා දඟලනවා." මේ දෝණිට තියෙන දාංගලේ. මේක නම් දඟ මල්ලක් වෙයි වගේ. මයෙ හිතේ හීන පිරිලා.

ලොකු දුවේ, මේ නංගිගෙන් කෝල් එකක් ආවා." ලඟදීම එන්න පුළුවන් කියන්නේ. අම්මා මට ෆෝන් එක අතට දෙන ගමන් කිව්වා.

නංගි කුවේට්වල ඉන්නෙ. ඒකිට උන දේවල් නම් කියලා වැඩක් නෑ. මං මහා වාසනාවන්තියක් කියලා මට හිතුනා. නංගිගේ කසාදේ මහ සල්ලිකාර පවුලකට තීන්දු වුනාම අම්මා හුඟක් සතුටු වුනා. ඒකිට තරම් මට වාසනාවක් නෑ කියලා අම්මා ඒ දවස්වල කිව්වේ. ඒත් ඒ ගෙදර මහ එවුන් අපේ පවුල් එක්ක පැහෙන්න කැමති වුනේ නෑ. නංගිගේ මහත්තයා යුද්දෙදි අකාලේ මියැදුනාට පස්සෙ ඒකිට

වුනේ මහ ගෙදර එන්න. අතට හම්බ වුනේ මහත්තයාගෙ පැන්ෂන් එක විතරයි. ඒකත් ගිය ආණ්ඩුවෙන් කපා දැම්මට පස්සේ ඒකිට වුනේ ගෘහ සේවිකා ඇබෑර්තුවකට රට යන්න. මට දරුවා ලැබෙන්නත් ළඟ නිසා අම්මා නංගීටත් එන්න කියලා. එයානෙ ඉතිං පුංචි අම්මා මයෙ දරුවා වුනාට ඒකිටත් පුදුම ආසාවක් තියෙන්නේ. එයාගෙ දරුවෙක් වගේ. දැන් ඉතින් ළඟදිම එයි.

"කාංචනෝ මං මේ උඹට බත් මුලක් ගෙනැවා". රේණුකා නැන්දා ඇවිත්.

දරුවෙක් ලැබෙන්න ඉන්න බව දැන ගත්ත දා ඉඳන් රේණුකා නැන්දා මට කන්න පිරිය එක එක වෑංජන හදන් එනවා. මං වැඩියෙන් ආස කොස් මාළුවට.

"අනේ නැන්දේ පිං සිද්ද වෙයි මේ කරන උදව්වලට". මං බත්මුල අතට ගන්න ගමන් කිව්වා.

"ඕක මොකක්ද කෙල්ලේ උඹ ලෑ අම්මා මට කරලා තියෙන උපකාරවල හැටියට"

රේණුකා නැන්දා පැහි මාළුවකුයිල ලූල් මාළු හොද්දකුයිල පරිප්පු නියඹලාවට උයලා ගොටුකොළ සලාදෙකුත් හදලා තිබුණා. කොච්චර රස වුනත් ගොඩක් කන්න පිරියක් නෑ. "ලොකු දුවා....,

ලොකු දුවා ..............., මෙන්න පොඩි එකීගෙන් කෝල් එකක් "

නංගී දවසට එක පාරක් අනිවාර්යයෙන් කතා කරනවා. ඒකිගේ විස්තර තොර තෝංචියක් නැතිව කියවනවා. මට පාලුවක් නෑ ඉතිං නංගි ෆෝන් එක තියපු ගමන් අම්මා ඇවිත් අහනවා නංගිගේ විස්තර.

"මොකෝ කාංචනෝ පොඩි එකී කිව්වේ"

"කොරෝනා වසංගතේ නිසා නංගීට එන්න බැරිවෙයි ද දන්නෙ නැලු අම්මේ".

ලංකාවේ නම් දැනට ප්‍රශ්නයක් නෑ. මගේ පැටිය ගැන මට බයත් හිතෙනවා. මේ ලෝකේ මිනිස්සු මැරෙන විදිය දැක්කම. දරුවා හම්බවෙන දවස ටිකෙන් ටික ලංවෙන්නේ මයෙ හිතේ තියෙන සතුටත් වැඩිකරන ගමන්මයි. පොඩි බයකුත් තියෙනවා පළවෙනි දරුවා නිසා. දෙයියන්ගේ පිහිටෙන් කිසිම කරදරයක් වෙන එකක් නෑ.

සුනන්ද මට කැසට් පටියක් ගෙනත් දුන්නා. මං දවල් වරුවේම ඒක දාගෙන අහනවා.

**සුදු ඇත් පොවේවෙක් සුදු පියුම හොඬින් ගෙන පැදකුණු**
**නොකළත් සිරි යහනේ ..................**

**පෙරුම් පුරා මා කුසට පැමිණි බිළිඳු මට රජ**
**පැටියෙක් ..............**

නිරෝෂා විරාජිනීගේ සින්දුව ඇහෙද් දී මයෙ හිතට මොකක්දෝ හිතාගන්න බැරි හැඟීමක් දැනෙනවා. "අනේ මයෙ දරු පැටියා," ලොකු වෙච්ච බඩ දකිද්දී, මට දැනෙන්නෙ මහ ලොකු සතුටක්. දරු පැටියෙක් නැතිව අවුරුදු හතරක් ගතවුනා. කසාදෙන් අවුරුදු හතරකට පස්සේ තමයි දරු පැටියෙක් අපි ළඟට එන්න හදන්නේ. මයෙ මහත්තයාගේ හිතේ සතුට ඇස්වලින් බේරෙනවා. කාමරේ හැම තැනම පුංචි බබාලගේ පින්තූර. ඒවා දකිද්දී මට හිතෙනවා, අනේ මයෙ පැටියා කොයි වගේ වෙයිද කියලා.

දරුවෙක් නැතිව දුකින් ඉන්දැද්දි මං හැමදාම මල් පහන් පූජා කරලා, දෙවියන්ට පිං දීලා මම දරුවෙක් ප්‍රාර්ථනා කළා. දවසක් මං හීනෙන් දැක්කා "රතුපාට සාරියක් ඇඳගත්ත ලස්සන ගෑණු කෙනෙක්, රතුපාට මල් තියෙන මල් වට්ටියකුත් අතේ තියාගෙන, රතුපාට කාර් එකකින් බැහැල මං ලඟට ආවා. ඇවිත් ඒ රතු මල් මට්ටිය මයේ අතට දීලා කිව්වා කතරගම දෙවියන්ට මල් පූජා කරලා දරුවෙක් වෙනුවෙන් ප්‍රාර්ථනා කරන්න කියලා."

මං ඊළඟ දවසේ පාන්දර ම නාගෙන කා එක්කවත් කථා නොකර ගිහින් කතරගම දෙවියන්ට භාරයක් වුනා. ඒ හීනෙන් දැක්ක කෙනා මට කිව්වා මේ බවක් කාටවත් කියන්න එපා කියලා. මං අදටත් මයේ මහත්තයටත් මේ වගක් කිව්වෙ නැහැ.

ඔය සිද්ධියෙන් සතියකට විතර පස්සේ මම ආයෙත් හීනයක් දැක්කා. "ඒක සුදුපාට හීනයක්. ඒ හීනෙත් හිටියේ අර ගෑණු කෙනාමයි. එයා සුදු පාට සාරියක් ඇඳලා සුදුපාට කාර් එකකින් බැහැලා ආවේ. සුදු මල් වට්ටියකුත් අතේ තියාගෙන ලස්සනට හිනාවෙලයි ආවේ. ඇවිත් මයේ අතට ඒ මල් වට්ටිය දුන්නා ඊට පහුවෙනිදා තමයි මං අම්මෙක් වෙන්න යන බව මං දැන ගත්තේ. මං අදටත් හවසට මල් පහන් පූජා කරලා කතරගම දෙවියන්ට පිං දෙනවා."

මහත්තයා කුඹුරෙ ඉඳන් අද වෙනදට කළින් ගෙදර ආවා. ඩීමෝ බට්ටෙකුත් ආවා. මහත්තයා දරු පැටියට තොටිල්ලකුත් අරං ඇවිත්. ඒක අපේ කාමරෙන් තියලා අහනවා මගෙන් ලස්සන ද කියලා. ඒක ඇත්තටම ලස්සනයි. ඒ තොටිල්ලේ මයේ දරු පැටියා නිදන් ඉන්නවා මට මැවිලා පෙනුනා.

"කාංචනා............"

"කාංචනා............"

"මැණික මේ මං ගස්ලබු ගෙඩියක් ගෙනැවා. අපි කමු. මේ ගමේ ඒවා. දුවත් අම්මා වගේම සුදු වෙන්න එපැයි, තාත්තා වගේ කළු වෙන්නෙ නැතුව."

"හැබැයි මහත්තයාගේ ඇස් දෙක"

ඕවා කිය කිය අපි හිනා වෙනවා. මහත්තයා හැමදාම පලතුරු ගෙනත් දෙනවා මට කන්න.

ගස්ලබු නම් දැන් කාලා කාලාම මට එපා වෙලා තියෙන්නේ.

“ආ……. මේ කාංචනාල නංගි කතා කළා. ලබන සතියේ එන්න ටිකට් හම්බ වුනාලු.

අද තමා ටිකට් අරන් තියෙන්නෙ.” මටත් හරි සතුටුයි. නංගිත් එනවා කියන්නෙ හැමෝම ඉන්නවා. පුංචිත් මයෙ දුවට අම්මා තරමටම ආදරෙයිනේ. ඔන්න පැටියෝ පුංචිත් එනවලු. මං සුභ ආරංචිය පැටියටත් කිව්වා.

“මහත්තයා ඔයා යනවද නංගිව එක්කං එන්න”

“මං යන්නම් කංචි. මං ප්‍රසන්නට කිව්වා වාහනේ අරං එන්න කියලා තුනට විතර. නංගිලා මෙහෙන් බහිද්දි අට විතර වෙයි කිව්වනේ.”

සුනන්ද නංගිව එක්කං එන්න ගිය වේලේ ඉඳන් මායි අම්මයි නංගි ආස කෑම ජාති හදාගෙන මග බලාගෙන හිටියා.

“මොකෝ බං මේ කඳමළු බැඳගෙන.”

“දරුවට ඕන හැමදේම ගෙනාවා අක්කේ. මං කලින් ඉඳන් ගේන්න ඕන ඒවා අරං තියාගෙන හිටියේ.” දැන් ඉතින් මයෙ දූ පැටියට පුංචිත් ඉන්නවා. මං මයෙ බඩ අතගාන ගමන් හිතුවා.

“වසංගතේ හොඳටම පැතිරිලා අක්කේ. එහේ කට්ටිය මැරෙනවා හරියට. තාම ලංකාවේ නැති නිසා බය වෙන්න දෙයක් නෑ.” නංගි ආ වේලේ ඉඳන් එහෙ විස්තර මා එක්ක කියනවා ඇඳුම් මාරුකර ගන්නවත් සිහියක් නෑ ඒකිට.

“පොඩි දුවේ බත් ඩිංගක් කමු. හොඳටම රෑ වුනා. ඔන්න අක්කා කට්ලට් වගේකුත් හැදුවා උඹ කැමතියි කියලා.” අම්මා නංගීට කෑමට කතා කරනවා. නංගී එනකල් ඇඟිලි ගැන ගැනනෙ අම්මා හිටියේ.

“මං ඇඟට වතුර ටිකක් දාගෙනම එන්නම් අම්මෙ.” හරි මහන්සියි. නංගී අම්මා එක්ක ළිඳ ළඟට ගියා. තනියෙම යන්නත් බෑ ඇඳිරි වැටිලා නිසා.

නංගී කියපුවා ඇහුවම මට හීන් දාඩිය දැම්මා. මට බය හිතුනේ මේ වසංගතේ මෙහෙටත් එයි ද කියලා. මයෙ දරු පැටියට කරදරයක් නොවුනොත් මට ඇති.

“අක්කේ අන්න නිවුස්වලට කිව්වා මෙහෙත් කොරෝනා හැදුන කෙනෙක් හොයාගත්ත කියලා. මෙහෙත් පැතිරෙන්න වගේ හදන්නෙ අක්කෙ.”

දවසින් දවස කොරෝනා හැඳුනා අය හොයා ගන්නවා. මට නම් බයත් හිතෙනවා. මහත්තයා කුඹුරට යන එකත් දැන් මට බයයි. මං ගොඩක් පරිස්සම් වෙන්න ඕනේ. අනේ මයෙ දරු පැටියා. මං මහත්තයට කියලා වෙනිවැල්ගැටයි, කොත්තමල්ලියි ගෙන්න ගත්තා. මහත්තයා පෙරුම්කායම් කැල්ලක්

ගෙනැත් මයෙ අතේ බැන්දා. TV චැනල් එකක දොස්තර මහත්තයෙක් අද වැඩසටහනක් කරද්දී දවසට දෙපාරක් හුමාලෙත් අල්ලන්න කියනවා මං අහගෙනයි.

අම්මා මට හැමදාම උදේ හවස කොත්තමල්ලි තම්බලා දෙනවා බොන්න. වෙනිවැල් ගැටත් තම්බලා දෙනවා. මං ඒවා නිවලා බොන්නේ. දරුවට හොඳ නැනේ. ගෙදර හැමෝම උදේ හවස හුමාලෙ අල්ලනවා.

මහත්තය මට කිව්වා පුළුවන් හැම වෙලාවටම අත්දෙක හොඳට සබන් දාලා හෝදන්න කියලා. මං දවස ගානේ නාලා පිරිසිදුව ඉන්නවා. හැම වෙලේම TV එකේ උපදෙස් දෙන්නෙ පිරිසිදුව ඉන්න කියලනේ. "මහත්තයා මං එළියේ ටැප් එක ළඟ සබන් කැල්ලක් තිබ්බා. ඔයා වැඩ කරලා ගෙට එද්දි අත්දෙක එතනින් හෝදගෙන එන්න".

"ඔයා එළියෙන් මයෙ තුවාය තියන්න කංචි. මම ළිඳ ලඟට ගිහින් නාගෙනම එන්නම්. ඒක ගොඩක් හොඳයිනේ. ඔයා පරිස්සම් වෙන්න මැණික. අනිවාරෙන් දවස ගානේ හුමාලේ අල්ලන්න හොඳද." මහත්තයා මයෙ ඔලුව අතගගා මට උපදෙස් දෙනවා. මෙහෙම ආදරයක් ලබන්න මං කොච්චර පිං කරන්න ඇද්ද කියලා මට හිතුනා.

මේ දවස්වල එයාගෝට් එහෙමත් වහලා. නංගී හොඳ වෙලාවට කළින්ම ආවේ. නැත්තන් එන්න වෙන්නෙ නෑ. හෙට ඉඳන් මුළු ලංකාවට ම ඇඳිරි නීතිය දාලා. අත්‍යාවශ්‍ය දෙයක් ගන්න ඇරෙන්න කොහෙටවත් යන්න එපා කියලා කියනවා මං අහගෙනයි. මට අනිද්දට ඉස්පිරිතාලේ ඇඩ්මිට් වෙන්න කිව්වේ. දැන්නම් මට බයත් හිතෙනෙවා යන්න.

"අනේ මයෙ දරු පැටියට නම් කිසිම කරදරයක් වෙන්න එපා දෙවියනේ."

"දුවේ අනිද්දට නේද ඇඩ්මිට් වෙන්න තියෙන්නේ. නංගී එක්ක ඔය ගෙනියන්න ඕන දේවල් දැම්ම ලැස්ති කරගන්න. නැත්තන් ඕවා අමතක වෙයි අරං යන්න."

නංගීයි මායි ගෙනියන්න ඕන බඩු ටික ලැස්ති කළා. මයෙ දරු පැටියා දැන් ගෙදරට එන්න ළඟයි නේද කියලා හිතද්දිත් හිතට පුදුම සතුටක් දැනෙන්නෙ.

**"කඳුල ඉතින් සමාවෙයන් අපි වෙන්**
**වෙමු අද හවසට මගෙ ගෙපැළට ඈ**
**එනවා සිරි යහනේ තනි රකින්න."**

මහත්තයාගේ සිංදුව එහා පැත්තෙන් ඇහෙනවා. කොයිතරම් සතුටු ඇති ද එයාට. පහුගිය අවුරුදු හතර ගෙවුනෙ හරිම හෙමිහිට, හරිම නීරසයි ඒ කාලය. ඒත් සුනන් ද මට කිසිම වෙනසක් කළේ නෑ. ඒත් ගමේ ගෑණුන්ගේ කථානේ ඉවසන්න බැරි වුනේ.

මයෙ පාලුවත් තව දවස් දෙක තුනයිනේ ඉතින්. මයෙ දරු පැටියා තව ටික දවසකින් ගෙදරට එනවා. “ඔයා එනකල් අම්මා. බලන් ඉන්නෙ පැටියෝ.” මං කුස අතගාන ගමන් හිතුවා.

උදේ ඉඳන් තිබ්බ හිසේ කැක්කුම දැන්නම් එන්න එන්න වැඩි වගේ. අද හවස්වෙලා නාගත්ත නිසා වෙන්නැති මයෙ හිතේ. සෙම ගතිය ටිකක් වැඩිවෙලා.

“මයෙ ඔළුව ටිකක් රිදෙනවා වගේ අම්මේ. පස් පංගුව ටිකක් තම්බලා බිව්වනම් හරියයි නේද, කොරෝනද මන්දා?”

“මොනාද බං මේ අව කැපෙන කතා කියන්නේ පොඩි එකෙකුත් බඩේ තියාගෙන. දෙවියන්ගේ පිහිටෙන් ඔය කරුම ලෙඩේ අපට හැදෙන්නෙ නෑ. අපි එච්චර පව් කරලා නෑ මයෙ පුතේ.” අම්මා මයෙ ඔළුව අතගාලා පස් පංගුව ටිකක් තම්බන්න කියලා ගියා. මං කියාපු කතාවෙ බරපතලකම මට තේරුණේ පස්සේ.

“අනේ මයෙ දරු පැටියට නම් මොකුත් වෙන්න එපා.” අම්මා මට පස් පංගුව පැකට් එකක් තම්බලා නිවලා ගෙනැත් දුන්නා. මං ඒක බීල එහෙම ම නිදාගත්තා.

“එළවළු ලාභයි එළවළු............... පොල්තෙල්, කරවල, ලාභයි. ලාභයි.”

අම්මා හනිකට එළියට දුවන සද්දේ මට ඇහුනා. දරුවෙක් ලැබෙන්න කියලා දැනගත්ත දා ඉඳලා අම්මා එළවළු තුන හතරක් එක්ක මට බත් උයලා දෙන්නේ. මාළුවකුත් වරදින්නෙ නෑ. හරිනම් දැන් මේ, අම්මට මං උයලා පිහලා කන්න දෙන්න ඕන කාලේ. හිසකේ ටික පැහිලා හම රැලි වැටුනට අම්මා තවම තරුණ කාලේ වගේ වැඩ කරන්නේ.

මේ දවස්වල මාළු කන්න බයයි කියලා මහත්තයා අම්මට මාළු ගන්න එපා කියනවා මං අහගෙනයි.

“බේරුවල පැත්තේ මාළු වෙළෙන්දෙකුටත් කොරෝනා හැදිලලු. ආයි මාළු ගන්න එපා අම්මේ. ඔය එන ලොරිවලින් බඩු ගනිද්දී පරිස්සමින්. මොනවා හරි ගත්තොත් පැයක් විතර අව්වෙ තියලා ගෙට ගන්න. අම්මේ, අත් දෙකත් හොඳට සබන් දාලා හෝදන්න.”

මහත්තයා කුඹුරට යද්දි මටයි අම්මටයි උපදෙස් සීයක් විතර දීලයි යන්නෙ. මේ දවස්වල මී උණ ප්‍රශ්නෙත් තියෙනවා. මට එයා ගැන බයයිත් එක්ක කුඹුරට ගියාට. බෙහෙත් නම් හන්දියේ බෙහෙත් සාප්පුවෙන් ගත්තා මයෙ හිතේ.

නංගිට ආව දවසේ ඉඳලා නිවනක් නෑ. චූටි දෝණිට ඇඳුම් මහනවා, ගෙවල් අස්පස් කරනවා, අතුගානවා, මයේ ඇඳුම් පවා හෝදනවා.

"අක්කා නාගන්න යන්නකෝ. මං මේ ඇඳුම් ටික හෝදලා දාන්නම්."

පොඩි දවස්වල රණ්ඩු කළාට නංගි කෙනෙක්ගේ අගේ දැනෙන්නෙ දැන් තමා. පුංචි කාලේ අපි ටොෆිටයත් මරා ගන්නවා මට මතකයි.

මට කරන්න කියලා වැඩකුත් නැති එකේ මං එක එක දේවල් ගැන කල්පනා කර කර ඉන්නවා. මහත්තයා නම් කියන්නේ වත්ත පිටියෙවත් ටිකක් එහාට මෙහාට ඇවිදින්න කියලා. තව මට පොත් වගයකුත් ගෙනැල්ලා දුන්නා දවසක් කියවන්න කියලා දයා රෝහණ අතුකෝරල මහත්තයගේ. ඔළුව කැක්කුමත් අඩුවක්නම් නෑ. මේ දවස්වල ගස්ලබු එහෙම කාපු නිසා සෙමට වෙන්නැති මයෙ හිතේ. මං ඇඳ උඩට වෙලා ඒ පොතකුත් කියව කියව හිටියා. එහෙම්ම මට නින්ද ගිහිල්ලා. මහත්තයා ගෙදර ඇවිත් කීද්දුවම තමයි මට ඇහැරුණේ.

හොඳටම හවස් වෙලා. එක දිගටම කිවිසුම් යනවා නවතින් නැතුව.

අම්මා මට ලුණු කැඳ කෝප්පයක් හදලා දුන්නා. ඒක බීලා පැනඩෝල් පෙත්තකුයි, පිරිටන් භාගයකුයි බිව්වා. බෙහෙත් ගේන්න යන්නත් බයයි මට, දරුවත් බඩේ තියන් ඔතන කොරෝනා හැඳුන කෙනෙක්වත් හිටියොත්. මං ආයි ඇඳට වෙලා ඇලවුනා. ඇගටත් ටිකක් අමාරු නිසා. රෑ කෑම හදලා ඉවර වුනාම මහත්තයා බත් එකකුත් බෙදාගෙන ඇඳ ළඟටම ආවා.

"මහත්තයා මයෙ ඔළුව රිදෙනවානේ"
"හරි මැණික ඔයා ඔය බය වෙලා නිසා වෙන්නැති. මේ බත් ටික කාලා ඉමුකො. එතකොට අඩුවෙයි. ඉන්න මං කවන්න."

මහත්තයා මට බත් කැව්වා. වතුර එකත් අතටම දුන්නා. මට පව් කියලත් හිතුනා. මං අද එයාට තේ ටිකක්වත් හදලා දුන්නෙ නෑ. කොච්චර හොඳද මයෙ මහත්තයා.

අම්මා මට සමහන් එකකුත් හදලා ගෙනැත් දුන්නා. හෙට තමයි ඉස්පිරිතාලෙ ඇඩ්මිට් වෙන්න තියෙන්නෙ. මට ඉවසිල්ලක් නෑ චූටි පැටියගේ මූණ දකිනකල්. එයා ආවම මම අම්මා කෙනෙක්. හැම ගෑණියෙක්ගෙම එකම ප්‍රාර්ථනාව අම්මා කෙනෙක් වෙන එක. රෑ වෙද්දි ඔළුවෙ කැක්කුම ටික ටික අඩු වුනා. හිතේ තියෙන නොවිසිල්ලට මට නින්ද ගියෙත් නෑ.

"පුතේ නැගිටින්න. නාගෙන කරගෙන ලෑස්තිවෙන්න දැං පහන් පහුවෙලා." අම්මා කීද්දුවමයි මට ඇහැරුණේ. නංගියි අම්මයි කෑම එහෙමත් හදලා. මං බත් ඩිංගකුත් කාලා අලුත්ම ෆිනපෝව ඇඳගෙන ලෑස්ති වුනා.

කණ්නාඩිය ඉස්සරහ ඉඳන් කොණ්ඩේ ගොතද්දියි ඉබේටම වගේ මයෙ බඩ දිහා බැලුනේ. මයෙ පැටියා හෙට ඉඳන් මට අතේ තියාගෙන ඉන්න පුළුවන්නේ. මයේ පුංචි දුවව, මං හරිම ආදරෙන් මයේ බඩ අතගෑවා.

“මයේ පැටියෝ අම්මා ඔයා එනකල් මග බලාගෙන ඉන්නේ”

එතකොට තමයි මං දැක්කෙ මං දිහා බලාගෙන හිනාවෙන මහත්තයාව. එයා මං දිහා බලාගෙන හිනා වෙනවා. මට ලැජ්ජත් හිතුනා. සුනන්ද මං ළඟට ඇවිත් ආදරෙන් නලලට හාදුවක් දීලා අතේ පිරිත් නූලක් බැන්දා.

“ඊයේ පන්සලේ ලොකු හාමුදුරුවන්ගෙන් ඉල්ලන් ආවේ”

“මයෙ මහත්තයා සතුටින්ද”

“ඔව් මැණික ඔයා නිසා මං හැමදාම සතුටින් දැන් දරු පැටියත් ඉන්න නිසා ගොඩක් සතුටින්” මං සුනන්දට තුරුල් වුනා.

“මේ කාංචනා කෙල්ලේ, කෝකටත් අපි පැනඩෝල් පෙත්තක් බීලම යං” මහත්තයා මට “කෙල්ලේ” කියන්නෙ හුරතලේට.

මං අම්මටත් වැඳලා, වාහනේට නැග්ගා. මහත්තයා ප්‍රසන්නට ගේ ළඟට එන්න කියලා

තිබ්බා වාහනෙත් අරං.

ඉස්පිරිතාලේ ගේට්ටුව ළඟ හෙන පෝලිම. සිකුරිටි මහත්තයා උණ බලන තුවක්කුත් අතේ තියාගෙන එන එන එක්කෙනාගේ නළලට තියලා උණ බලනවා. මීටරේ පරතරය තියාගෙන තමයි කට්ටිය ඉන්නේ. මායි මහත්තයයිත් පෝලිමට එකතු වුනා. මුකවාඩමකුත් බැඳගෙන මගේ නහය කටත් දැවිල්ලයි. පොලිසියේ මහත්තුරු මේක දවසෙම කොහොම දාන් ඉන්නවද මන්දා.

මයෙ හිතට බයකුත් දැනෙනවා. ඊයෙ ඉඳලා හිසේ කැක්කුම තිබ්බ නිසා. මාව ගේට්ටුව ළඟ නතර කර ගනීද කියලත් හිතෙනවා. මං මහත්තයාගේ අතේ එල්ලිලා ගේට්ටුව ළඟට ගියා. සිකුරිටි මහත්තයා මගේ නළලටත් උණ බලන තුවක්කුව තියලා බැලුවා. මොනවත් කිව්වෙ නෑ. හැබැයි දොස්තර මහත්තයා පොඩ්ඩක් හම්බවෙලා ඇඩ්මිට් වෙන්න කියලා මට කිව්වා. අපිට පිටි පස්සෙන් හිටපු අය අපි දිහා බයෙන් වගේ බලනවා මං දැක්කා.

මං මහත්තයා එක්ක දොස්තර මහත්තයා ළඟට ගියා. දොස්තර මහත්තයත් මයෙ උණ බලලා නලාව තියලත් පරික්ෂා කරා.

“මේ අම්මා බය වෙන්න ඕනෙ නෑ. මේ දවස්වල තියෙන තත්ත්වෙත් එක්ක තමයි අපිට මෙහෙම ඇඩ්මිට් වෙන්න එන අයව චෙක් කරන්න වෙලා තියෙන්නෙ.”

මං බයවෙලා ඉන්න බව දොස්තර මහත්තයට තේරෙන්නැති.

“ළඟකදි රට ඉදලා ආව කෙනෙක් එහෙම ගෙදරවත් අහල පහලවත් නෑ නේද අම්මා. මොකද ඔය ගොඩක් ආසාදනය වෙලා තියෙන්නෙ එහෙම අයගෙන්.”

මං මහත්තයාගේ අත තදින් අල්ලා ගත්තා. ඒ වෙලාවේ නම් මට හුස්ම ගන්නත් අමතක වෙලයි තිබුනේ.

“නෑ මහත්තයා මොකක්වත් ප්‍රශ්නයක්ද?.” සුනන්ද දොස්තර මහත්තයා එක්ක කතා කළා.

“ ආ හරි එහෙනම් කිසි ප්‍රශ්නයක් නෑ. වෝඩ් එකට වයිෆ්ව ඇඩ්මිට් කරන්න.”

මං වාට්ටුවට යන ගමන් මගේ මහත්තයාගෙන් ඇහුවා ඇයි නංගි ගැන නොකීවේ කියලා.

“නංගිට මුකුත් ප්‍රශ්නයක් තිබුනේ නෑනේ මැණිකේ. නංගි ගැන කිව්වා නම් එයාල අපිව තවත් පරීක්ෂණවලට යවයි. අනික මේ වෙලාවේ අපිට කිසිම කරදරයක් වෙන්නෙ නෑ කියලා මට විශ්වාසයි. අපි පත්තිනි මෑණියන්ට භාරත් වුනානේ. ඔයා ඕවා හිතන්න ඕනෙ නෑ.” මහත්තයා මගේ අතින් අල්ලගෙන වාට්ටුවට එක්කගෙන ගියා. අම්මා හවස මං ළඟට එනකල්ම මහත්තයා ගෙදර ගියේ නෑ.

රෑ වෙද්දි මට සහලෝලා උණ. අම්මටත් කර කියාගන්න දෙයක් නෑ. කිවිසුම් යනවා එක දිගටම ඉවරයක් නෑ. වාට්ටුවේ ඉන්න ඇයොත් බයවෙලා මං දිහා බලන් ඉන්නෙ, යකෙක් දැක්කා වගේ. අම්මා අරන් ආපු සමහන් එකක් උණු වතුර දාලා කලවම් කරලා මට දුන්නා. පස්සේ නර්ස් නෝන්ලා ටිකක් ආවා. හැබයි හරියට කලබල වෙලා වගෙයි පෙනුනේ. අම්මයි මායි තක්බීරිවෙලා. මට හීන් දාඩිය දැම්මා. නර්ස්ලා මාවයි අම්මවයි වාට්ටුවෙන් එක්කන් ගියා වෙනම කාමරයකට. එයාලත් මුළු ඇඟම වැහෙන්න ඇඳගෙන, මුඛවාඩම් බැඳගෙන මගෙනුයි අම්මගෙනුයි විස්තර ඇහුවා. මට බොරු කියන්න හිත දුන්නෙ නෑ. මට බය හිතුනා, නංගි රට ඉඳන් ආ විත්තිය මට ඉබේටම කියවුනා.

එයාලා මාව කවුරුවත් නැති තනි කාමරේකට දැම්මා. කාටද මහත්තයෙක්ට කතා කරලා, අම්මාව නිරෝධායක මධ්‍යස්ථානයකට යවන්න කියනවා මං අහගනයි. මාව ඇඩ්මිට් කළාට පස්සේ නෑනයි, නැන්දම්මයිත් අපේ ගෙදර ඇවිත්. අම්මා ඒ වගක් මට කීවෙත් නෑ කට්ටිය අහනකල්ම. ඉතින් එයාලවයි, අම්මවයි, මගේ මහත්තයාවයි කන්දකාඩු නිරෝධායන මධ්‍යස්ථානයට අරන් යන්න කියලා ලොකු මහත්තයෙක් කියලා තිබුනා.

මගෙන් දොස්තර මහත්තයෙක් ඇවිත් තව තව විස්තර ඇහුවා, එක එක දේවල් ගැන. මට ලොකු තනිකමක් දැනුනා. හැමෝම මං දිහා බැලුවේ බයවෙලා වගේ. නර්ස් නෝනා කෙනෙක් ඇවිත් සෙම පටල පරික්ෂා කරන්න මගෙන් සාම්පල් ගත්තා. ඒ වෙලෙනම් මට හරියට රිදුනා. අනේ මගේ අම්මවත් හිටියනම් කියලා මට හිතුනා. මාව වෙනමම වාට්ටුවක තනි කරලා. අම්මලට කොහොමද දන්නෙත් නෑ. එළියෙ කට්ටිය පිරිලා. TV චැනල්වලිනුත් ඇවිත්. හැමෝම මට බනිනවා ඇහෙනවා. මං බොරු කිව්වලු. මං නිසා දොස්තරලා, නර්ස්ලා තව වාට්ටුවෙ හිටිය අයත් අවධානමකට ලක්වෙලාලු ඉන්නේ. ඇත්තෙන්ම මට බොරු කියන්න ඕන වුනේ නෑ. මයෙ හිත ඇතුළේ තෙරපෙන දුක කියන්න කවුරුවත් මං ළඟ නෑ. මගේ තනියට ඉන්නේ මගේ මේ බඩ ඇතුලේ ඉන්න දරු පැටියා විතරයි. බඩ ඇතුලේ ඉඳන් දඟලන්නේ හරියට මේ වෙන දේවල් තේරිලා වගේ.

"අම්මා ඔයාට මුකුත්ම වෙන්න දෙන්නෙ නෑ. බයවෙන්න එපා
මගේ රත්තරං පැටියෝ."

අන්තිමේදි මට කොරෝනා හැදිල කියලා පරීක්ෂණවලින් හොයාගෙන. මාව වාට්ටුවෙ තනි කරලා වටේටම ඉටි කොලත් ගහලා. ළඟ කවුරුවත්ම නෑ. දොස්තර මහත්තයාවත් මගේ කිට්ටුවට එන්නෙ නෑ. මට හුස්ම ගන්නත් අමාරුයි. මං මගේ දරු පැටියා වෙනුවෙන් මගේ වේදනවා ඉවසගෙන හිටියා. අනේ මගේ මහත්තයාවත් මා එක්ක හිටියනම්, කියලා මට හිතුන වාර අනන්තයි.

දරු ප්‍රසූතිය නෝමල් කරන්න හිටියත් පස්සෙ දොස්තරලා සීසර් කරලා දරුවව ගන්න තීරණය කළා. මට මගේ දරු පැටිය ගැන ලොකු බයක් දැනුනා. මං මහත්තයා මගේ අතේ බැඳපු පිරිත් නූල අතගගා ඉතිපිසෝ ගාථාව හිතින් මිමිනුවේ "ත්‍රිවිධ රත්නයේ ආනුභාව බලයෙන් මගේ දරු පැටියා ආරක්ෂා කරලා දෙන්න" කියලයි.

අම්මලා ගැන ආරංචියක්වත් නෑ. මට එයාලා ගැන අහන්නවත් කවුරුවත් නෑ. අනේ මයේ මහත්තයට කොහොමද දන්නෙ නෑ. නංගිටත් කොරෝනා හැදිලා කියලා මට දැනගන්න ලැබුනා. එයාගෙන් තමයි මට බෝවෙලා තියෙන්නෙ. එක අතකට නංගි ලංකාවට නොආවනම් කොච්චර හොඳ ද කියලා මට හිතෙනවා.

"උඹ එක්ක තරහකට නෙමෙයි මයේ නංගියෙ, මයේ දරු පැටියට කරදරයක් වෙයිද කියලා මට බයයි"

මං අමාරුවෙන් හුස්ම ගත්තා. එහෙන් මෙහෙන් බට ගහලා, මට හරි අමාරුයි. දොස්තරලා මාව ඔපරේෂන් එකට ගත්තා. කොච්චර අමාරු වුනත් මට මගේ දරු පැටියගේ මූණ දකින්න තියෙන ආසාව ඊට වැඩිය සිය දහස් ගුණයකින් වැඩී.

**"ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිස ධම්ම සාරති බුද්ධෝ භගවාති."**

මං සිය පාරක් විතර මගේ හිතින් බුදුගුණ මිමිනුවා. දොස්තරලා මගේ බෙල්ලට පහළින් කර්ටන් එකක් දාලා නිසා මට මුකුත්ම පේන්නෙ නෑ. දැනෙන්නෙත් නෑ. මහත්තයා හිටියනම් මේ වෙලාවේ මයේ අතින් අල්ලගෙන ගාථා මුමුණ මුමුණ ඉඳීවි නේද කියලා මට හිතුනා.

අන්තිමේ දී මයෙ දරු පැටියා අඬන සද්දේ මට ඇහුනා. මයෙ ඇස් දෙකෙන් කඳුළු පැන්නේ සතුටට. "අනේ මයෙ දරු පැටියා" මට කිසිම වේදනාවක් දැනුනෙ නෑ. අඩු තරමේ මට හුස්ම ගන්න අමාරු කියලවත් මට දැනුනෙ නෑ. තන් දෙකෙන් කිරි දෝරේ යනවා මට දැනුනා. මගේ දරු පැටියට කිරි දෙන්න මං ගොඩක් ආසාවෙන් හිටියේ. අන්තිමේ දී දොස්තර මහත්තයෙක් මට මගේ දරු පැටියව උස්සලා පෙන්නුවා. අපි හිතන් හිටිය වගේම ලස්සන දූ පැටියෙක්. මං දැකපු හීනෙදි මට ලැබුණු සුදු මල් වට්ටිය වගේමයි. මගේ සතුට මට වචනයෙන් කියා ගන්න බෑ. මගේ සතුට මගේ ඇස්වලින් දෝරෙ ගියා. පෙකනි වැලවත් තාම කපලා නෑ. එල්ලෙනවා. රූහැයියෙක් වගේ අඬනවා දරු පැටියව මගේ ළඟට ගන්නකල්, මට ඉවසිල්ලක් තිබුනෙ නෑ. ඒ පුංචි රෝසපාට කම්මුල් ඉඹිනකන් මං ඇඟිලි ගැන ගැන හිටියෙ. මං කොච්චර වාසනාවන්ත ද කියලා මට හිතුනා. මට "මහත්තයා" කියලා හයියෙන් කෑගහන්න හිතුනා. අපේ දරු පැටියව දුවගෙන ගිහන් සුනන්දට පෙන්නන්න හිතුනා.

නර්ස්ලා, මගේ ඔපරේෂන් එකට ඇගේ දාගෙන ඉඳපු ඇඳුම් අයින් කරලා වෙන ඇඳුමක් මයෙ ඇඟට දැම්මා. පස්සෙ මං කලින් හිටපු තනි කාමරේටම ගිහින් දැම්මා. මයේ දුව හීනෙන් දැකපු සුදු මල් වට්ටිය වගේ වුනාට, මට ඒ මල් වට්ටිය අතර ගන්න නම් වාසනාවක් නැති වුනා. මං මේ පාළු කාමරේ තනියෙම. මගේ දරු පැටියා වෙන තැනක. මයෙ දරු පැටියට කිරි දෙන්නවත් මට වාසනාවක් නැද්ද. මයෙ ඇස්වලට කඳුළු ආවේ මටත් නොදැනීමයි. ටිකෙන් ටික හිරි යද්දි මට මයෙ තුවාලේ වේදනාව දැනෙන්න පටන් ගත්තා. යටි බඩ හරියෙන් ලොකු තුවාලයක් තියෙනවා වගේ මට දැනුනෙ. මට වතුර ටිකක් ඉල්ල ගන්නවත් කෙනෙක් ළඟ පාතක නෑ. මං දැන් අම්මා කෙනෙක් නේද කියලා හිතලා, මං මයෙ හිත හදාගත්තා නර්ස් නෝනා කෙනෙක් මට ඇවිත් කිව්වා, දුවට අසනීපෙ නැති බව. මයෙ හිතට ලොකු සහනයක් දැනුනේ. මේ පාළු කාමරේ ඇතුලේ එළිවෙනවද රෑවෙනවද කියලා මට දැනෙන්නෙ නෑ. මයෙ දරු පැටිය කිරි බීලද, එයාව බලාගන්නෙ කවුද, කියලාවත් මම දන්නේ නෑ.

මට හුස්ම ගන්නත් අමාරුයි. දරුවා කිරි බිව්වේ නැති නිසා, තන් දෙක ගල් ගෙඩි වගේ. එහෙන් තුවාලෙත් පැසවලා. මට දැනුන වේදනාව මට ඉවසන්න බැරි වුනා. මං හුස්ම අල්ලං ඉන්න ගොඩක් උත්සහ කළා. ඒත් මට බැරි වුනා. ටික වේලාවකින් මම දැක්කා මයෙ ශරීරය ඇඳ උඩ තියෙනවා. මට මයෙ දුව මතක් වුනා. මගේ ඇඳ ළඟට නර්ස්ලා දුවගෙන ආවා. "කාංචනා නැති වුනා" නර්ස් කෙනෙක් දොස්තර මහත්තයට කිව්වා. මයෙ හිතට ලොකු දුකක් දැනුනා. මං මගේ එකම සැනසීම හොයාගෙන ගියා. අනේ, මං ගොතපු ඇඳුමකුත් ඇඳගෙන ලස්සනට ඉන්නවා ඇඳ උඩ රෝස මලක් වගේ. මං මයෙ දුව ළඟින් වාඩි වුනා.

“මයෙ පැටියෝ අම්මට ඔයාව දාල යන්න වුනා. අම්මා මැරුණා මැණික.”

දුව හයියෙන් අඬන්න ගත්තේ මං කියපු දේ තේරුණා වගේ. දෝණිව බලන්න ඉන්න නර්ස් දුවගෙන ආවා දුව ළඟට.

“ඒත් අම්මා මගේ දෝනි ළඟම ඉන්නවා.”

මං දෝණිගේ කණට කරලා කිව්වම දොනිගේ මූණෙ පුංචි හිනාවක් ඇඳුනා. තාත්තගේ හිනාවමයි. මං මගේ දුවගෙ තියෙන ලස්සන දිහා බලාගෙන හිටියා. සුදුම සුදුයි මයෙ දෝණි. තාත්තා මට පලතුරු ගෙනත් ගෙනත් කැව්වේ අම්මා වගේ සුදුවෙන්න කියලනේ.

මම ආයිත් මයෙ ශරීරය ළඟට ආවා. සුදු රෙද්දක් ඔළුවේ ඉඳන් පොරවලා තිබ්බා. කවුදෝ මිනිස්සු දෙන්නෙක් ඇවිත් මාව ඉටි කොලේකින් ඔතාගෙන අරගෙන ගියා. ලස්සන ඔසරියක් ඇඳගෙන අවසන් ගමන යන්න මට වාසනාව නෑ වගෙයි.

කුණු මාළු කැල්ලක් වගේ මාව වාහනේක දාගෙන අරගෙන ගියා. මං එතනින් අයින් වුනා. මං කවදාවත් ආස වුනේ නෑ මේ විදියට අවසන් ගමන් යන්න. මට මයෙ මහත්තයා මතක් වුනා. මං මයෙ මහත්තයා ළඟට ගියා. මං නැති වුන බව මහත්තයට ආරංචි වෙලා. මහත්තයාගේ ඇස් දෙක හොඳටම රතුවෙලා තිබ්බා.

“මයෙ මහත්තයෝ, මයෙ දරු පැටියව හොඳට බලාගන්න.”

මං කියන දේවල් එයාට ඇහෙන්නෙ නෑ. පර්ස් එකේ තියෙන මගේ පින්තුරෙ දිහා බලාගෙන කල්පනා කරනවා.

“අනේ, මයෙ මහත්තයා දුක් වෙන්න එපා. මං ඔයා ළඟමයි ඉන්නෙ.”

මං මහත්තයාගේ ඔළුව ආදරෙන් අතගෑවා. හිතේ දුකට මහත්තයට එහෙම ම නින්ද ගියා.

මං අම්මා ළඟට ගියා. අම්මා හොඳටම දුකින් අඬනවා

“අනේ මයෙ දරුවා, මට උඹේ මුහුණවත් බලන්න බැරිවුනා. මට කළින් උඹ යයි කියලා මං හිතුවේ නෑ දුවේ. උඹ ළඟින් ඉන්න බැරි වුනාට මට සමාවෙයන් මයෙ දුවේ.”

මං අම්මගේ උකුළෙන් ඔළුව තියාගත්තා. පුංචි කාලේ ඒ දැනුන උණුහුමම මට අදත් ඒ විදියටම දැනුනා කිසිම වෙනසක් නැතිව.

“මාව බලාගත්ත වගේම, මයෙ දෝණිවත් බලාගන්න අම්මේ.”

මං නංගි ළඟට ගියා නංගිට හොඳටම අමාරුයි.

“අනේ උඹ ඉක්මනට සනීපවෙලා, මයෙ දරු පැටියාව ආදරෙන් බලාගනින් මයෙ නංගියෙ.” මං නංගි දිහා බලාගෙන හිටියා. එයා මට වඩා ලස්සනයි. අපි දෙන්නගෙම පාට එක වුනාට නංගි මට වඩා ලස්සනයි. මං ඒකිගෙ ඔළුව ආදරෙන් අතගෑවා.

නංගි සුනන්දට කැමැත්තෙන් හිටියේ. සුනන්දගෙයි මගෙයි සම්බන්දේ ඇතිවෙන්න කලින්, ඒකි සුනන්ද ගැනමයි කියෙව්වේ. අපේ සම්බන්දෙට හේතුවත් නංගිගේ ඒ වර්ණනාවම තමයි. පස්සෙ ඒකිට ලොකු තැනකින් යොජනාව ආවම ඒකි ඒ යොජනාවට කැමති වුනා. කසාදෙන් අවුරුද්දක් ගෙවුනත් දරුවෙක් නැති හින්දා, දොස්තර මහත්තයට පෙන්නුවමයි අපි දැනගත්තේ, නංගිගේ ගර්භාෂයේ තියෙන ප්‍රශ්නයක් නිසා දරුවෝ හදන්න වාසනාවක් ඒකිට නැති විත්තිය. එදා ඉඳන් නැන්දම්මා නංගිට හරියට වෙනස්කම් කළා. ඒ නිසාමයි ඒකි මහත්තයා නැති වුනාට පස්සේ රට ගියෙ.

කොයි කොහොම වුනත් මයෙ නංගි මට හරි හිතවත්. මට මේ කරුම ලෙඩේ බෝ වුනේ උඹෙන් උනත් උඹට මං වෛර කරන්නෑ මයෙ නංගියෙ උඹ ඉක්මනට සනීපවෙලා මයෙ දරු පැටියා බලා ගනින්.

මං මයෙ දුව ළඟට වෙලා ඉන්නවා. දුව තනිකරලා කොහේටවත් යන්නේ නෑ. "තාත්තයි, ආච්චියි, පුංචියි සනීපවෙලා එනකල් මයෙ මැණික ළඟින්ම මම ඉන්නම්කෝ." චූටි දෝණි අඬනකොට මං දූ ළඟට යනවා. ඒ පුංචි රෝසපාට කම්මුල් ඉඹිනවා. දෝණි බලාගන්න නර්ස් දුවට කිරි පොවද්දි, මං දෝණි කිරි බොන හැටි බලා ඉන්නවා. හරිම බඩගිනිකාරියක් වගේ පැය බාගෙන් බාගෙට අඬනවා.

දුවව බලාගන්න ඉන්න නර්ස් එයාට හරිම ආදරෙයි. දුවව අතට ගන්නවනම් එයා හොඳට අත් සබන් දාලා සෝදනවා. තව පිරිසිදුකාරක දියරකුත් දාලා සෝදල තමයි දුවව අතට ගන්නේ. හැම වෙලේම දුව ළඟම ඉන්නවා. එයා දෝණිව අතට අරං නලවන දිහා මං ආසාවෙන් බලන් ඉන්නවා. මං රෑ එළිවෙනකල් දොනී දිහා බලා ඉන්නවා. එයා හීනෙන් හිනාවෙනවා, අඬනවා. රෑට බඩගිනිවෙලා අඬද්දී නර්ස් ඇවිත් පිටි හදලා පොවනවා. දෝණි කිරි බීගෙන බීගෙන යන්නෙ දවස් ගානක් බඩගින්නෙ ඉඳලා වගේ.

දෝණි බඩේ ඉන්දැද්දිත් ඇඟිලි උරලා තියෙන වග, දොස්තර මහත්තයෙක් කියනවා මං අහගෙනයි. රෑටත් නින්දෙන් ඇඟිල්ල උරනවා ඔහොම දවස් ගානක් ගෙවිලා ගියා. මහත්තයයි, අම්මයි නිරෝධායනය වෙලා ගෙදර ආවා. ඒත් ගෙදර ඇවිල්ලත් දවස් දාහතරක් නිරෝධායනය වෙන්න වුනා. නංගිටත් දැන් ටිකක් සනීපයි. මං නංගි ළඟටත් ඉඳහිට යනවා. මේ දවස් ටිකට ඒකිව ඇදිලා ගිහින්. දුවව තවම අම්මලට භාර දුන්නෙ නෑ. මේ දවස් දාහතරත් ගෙවිලා ගියාම දුවව භාර දෙන්නයි හිතන් ඉන්නෙ කියලා දොස්තර මහත්තයා නර්ස්ට කියනවා මං අහගෙනයි. අම්මලට ගෙයින් එළියට බහින්න හොඳ නැති නිසා, මේ දවස්වල පුංචි අම්මා තමයි උයන්නෙ පිහන්නෙ. එයා අපේ දිහා ඇවිත්. කෑම එක කාමරේටම ගිහින් දෙන්නෙ නෑ. මුඛවාඩමක් දමාගෙන තමා ඒ දෙන්නෙත් කෑම දීලා අත් දෙකත්

හොඳට සබන් ගාලා හෝදනවා. පුංචි අම්මා පොලිසියේ මහත්තුරු දුන්න උපදෙස් අකුරටම පිළිපදිනවා.

ගමේ කට්ටිය අපේ ගෙදර දිහා බලන්නෙත් බයෙන් වගේ. මං නිසා ඉස්පිරිතාලේ මහත්තුරුන්ටත් නිරෝධායනය වෙන්න වුනාලු, මට බනිනවා. කට්ටිය එක්කහු වුනාම මං තමයි මාතෘකාව. පුංචි අම්මා වතුර ගන්න ළිඳ ළඟට එනවටවත් ගමේ උන් කැමති නෑ. ග්‍රාමසේවක මහත්තයට කෝල් කරලා කියනවා. මේ ලෙඩේ අපේ වරදින් හදාගත්ත ලෙඩක් නෙමෙයි කියන්න මේ මිනිස්සුන්ට නොතේරෙන හැටි. වෙලාවකට මට හිතෙනවා කෑ ගහලා කියන්න. කොහෙද ඉතින් මං කියන එකක් ඇහෙයියැ.

මහත්තයා ගෙදර ආ වේලේ ඉඳලා හරියට කෑමක් බීමක් නැතිව බලා ඉන්නවා. කුඹුරේ ගොයන් ටිකත් පැහිලා. ඒත් ගොවිතැන් පාළු වුනා වගේ බලන් ඉන්නේ. පුංචි අම්මා දෙන බත් පිගානෙන් බාගයක් වත් කන්නෙ නෑ. මං ඇඳ ළඟ ඉඳන් එයා දිහා බලන් ඉන්නවා. එළියට පයින්න හදන කඳුළු හංගන්න හැදුවට එයාට එහෙම කරන්න බෑ. අපේ කාමරේ අපි කොයි තරං නම් සතුටින් හිටියද. දරුවෙක් නොහිටියත් අපි දෙන්නට අපි දෙන්නා හැම වේලේම හිටියා. මං අතීතය මතක් කළා.

"මොනවා කරන්නද මයෙ මහත්තයො, මේක අපේ ඉරණම."

දවස් කීපයකට පස්සෙ නංගිට සුව වුනා. එයත් ගෙදර ආවා. ඒත් එයාටත් දවස් දාහතරක් නිරෝධායනය වෙන්න කියලා. මහත්තයා නංගි ගැන හරියට බලනවා. මට සැලකුව විදියටම නංගිටත් සලකනවා. සුනන්දටයි, අම්මටයි නම් එළියට පහළියට යන්න පුළුවන්. දැන් අම්මා තමයි ගෙදර වැඩ බලාගන්නේ. නංගිගෙත් නිරෝධානයන කාලය ඉවර වුනාම පොලීසියේ මහත්තුරු ඇවිත් එයාව පරික්ෂා කරලා "නිරෝධායනය අවසන් වූ නිවසකි" කියලා කොලයක් ගේ දොරකඩ අලවලා ගියා. සුනන්දවත්ල අම්මවත්ල නංගිවත් ගෙයින් එළියට බහිනවට ගමේ උන්ගෙනම් වැඩි කැමැත්තක් නෑ. එක එක කයි කතන්දර කියනවා උන් කියන ඒවට කන් දෙනවා නම් ඉතින් බැරියැ.

"මේ දවස් ටිකට සුනන්ද අයියට හිනා වෙන්නත් අමතක වෙලා. පහුගිය ටිකේ වෙච්ච කරදර අමතක කරලා දාන්න අයියේ. අක්කගෙ ඉරණම වෙන්නැති. අක්කා ලස්සන දූ පැටියෙක් අපිට දීලනෙ ගියේ. අපි හෙට දුවව ගෙදර එක්ක එමු අයියේ."

නංගී මගේ මහත්තයා ළඟින් ඉඳන් කියනවා මට ඇහුනා. මං නැති වුනා කියලා මේකිට ගාණක්වත් නැද්ද. සමහරවිට මහත්තයාගේ හිත හදන්න වෙන්න ඇති. දුවව ගෙදර ගේන්න කලින් අම්මයි නංගියි මුළු ගේම අස්කලා. බිම සබන් දාලා හෝදලා ගේ පුරාම සුවඳ දුම් ඇල්លුවා.

මහත්තයා පොලීසියේ මහත්තුරු දෙන්නෙක් එක්ක ගිහින් දූ පැටියව ගෙදර එක්කන් ආවා. අපි දෙන්න දුවට සරසපු කාමරේ තොටිල්ලෙ මගේ දෝණි ඉන්නෙ රෝස මලක් වගේ. ගෙදර හැමෝටම රාජකාරි එමටයි. අලුත් පණක් ඇවිත් වගේ. හැමෝම හරි සතුටින්. අනේ මාත් හිටියනම්, කියලා මට හිතුනා.

අම්මයි නංගියි එකතුවෙලා මයෙ දූ පැටියව නාවන්නයි ලෑස්තිය. වෙනිවැල්ගැට කෑලී දාලා වතුර එකක් රත් කරනවා දුවව නාවන්න. මාත් බලාගෙන හිටියා අම්මලා වතුර එක බාලා දවල්ට කන්න බත් උයනවා. නංගි සැරින් සැරේ ඇවිත් වතුර එකට වැලමිට දාලා බලනවා. එයා දුව ළඟින් හෙලවෙන්නෙ නෑ. දෝණිගෙත් හරිම හුරතලේ. වතුර එක නිවුනාම නංගියි අම්මයි හිල් කරපු පොල් කට්ටෙන් වතුර දදා දෝණිව නාවන දිහා මං බලාන හටියා. අම්මා ඔය විදියට නංගීවත් නැව්වා මට මතකයි. දෝණිව නාවලා, නංගි පැටියට ක්‍රීම් පවුඩර් එහෙම ගාලා නිදි කරවනවා.

**"දොයි දොයි දොයි දොයිය බබා**

**බයි බයි බයි බයිය බබා**

**නුඹේ අම්මා කිරට ගියා**

**කිරි එරවා එන්න ගියා"**

මාත් ඇඳ ළඟින් වාඩිවෙලා දෝණි නිදියන දිහා බලාගෙන හිටියා.

මයෙ නංගි දෝනිව හොඳින් බලා ගන්නවා. සුනන්ද ගැනත් හොඳට හොයලා බලනවා. මයෙ මහත්තයා එන්න පරක්කු වුනත් කෝල් කරලා අහනවා. සුනන්ද දැන් වෙනද වගේ නෙමෙයි. රෑ වෙලා තමයි ගෙදරත් එන්නේ. බොන්නත් පුරුදුවෙලා. මයෙ මහත්තයා කවදාවත් බොන කෙනෙක් නෙමෙයි. එයා වැඩිය දුවට ළඟට යන්නෙ නෑ. "මං දන්නවා දුවට ආදරේ නැතිව නෙවෙයි. තවම දුකින් ද මයෙ මහත්තයො, දුක් වෙන්න එපා මං ඔයා ළඟමයි ඉන්නේ." දවසක් දුව නැගිටලා හයියෙන් අඬනවා නංගියි අම්මායිත් ගෙදර හිටියෙ නෑ. කඩේට ගිහිල්ලා. මහත්තයා විතරයි හිටියේ. මං දූ ළඟට ගියත් දූ නැලවුනේ නෑ. මහත්තයා ඇවිත් දූ නැලෙව්වා.

**"මවකගෙ උණුසුම නොලබා සැපට නිදන දූවේ කොහොමද මම**
**සිහි කරන්නෙ දුවගේ උපන් දිනේ**

**මා හට දී ඔයා............. ඈ සුරලොව ගියා........."**

"මං කොහෙවත් ගියේ නෑ, ඔයාලා ළඟමයි ඉන්නෙ මහත්තයෝ. ඔය දෙන්නව මෙහේ දුකින් තියලා, මං සුරසැප විඳින්නෙ කොහොමද, මයෙ මහත්තයො?"

දුවට නමක් තියලා. මහත්තයා උප්පැන්න සහතිකෙ ගෙනැත් මේසෙ උඩ තියලා තිබ්බා.

"දහම්සා නිර්මාණී"

ලස්සන නමක් මහත්තයා ඇයි දන්නෑ දුවට ඒ නම දැම්මෙ.

මම හිටපු ගමන් ගමේ පන්සලට යනවා. මේ දවස්වල බෝධි පූජා තියන්නවත් ගමේ කවුරුවත් වැඩිය පන්සලට එන්නෙ නෑ.

මං බෝධිය ළඟ වාඩිවෙලා ඉන්නවා. මං වගේම තවත් අය එතන ඉන්නවා. මනුස්ස ආත්ම ලබන්න පුළුවන් අයත් ඉන්නවා. සමහර වෙලාවට දෙවිවරුත් වඩිනවා. ඒ වෙලාවට බෝධිය ළඟ හරියට

සුවඳයි. දෙවිවරු ඇවිත් මල් පූජා කරලා යනවා. පෝය දවසට ධර්ම සාකච්ඡා කරනවා. අපිට දෙවිවරු ළඟට කිට්ටු වෙන්න බෑ. හැබයි මට මනුස්ස ආත්මයත් ලබන්න තරම් පිං තියෙනවා.

එක ගෑණු කෙනෙක් හැමදාම පන්සලට එනවා. වයස නම් පෙනුමෙ හැටියට තිහ පැනලා ඇති මයෙ හිතේ. හැමදාම මල් වට්ටියකුත් අතේ තියන් එනවා පන්සලට. බෝධි පූජාව තියලා දරුවෙක් වෙනුවෙන් ප්‍රාර්ථනා කරනවා. පව්, මට එයාගේ දුක තේරෙනවා. මාත් අවුරුදු හතරක් තිස්සේ දරුවෙක් නැතුව දුක් වින්දනේ. ඒ කෙල්ල හැමදාම උදේ හවස බෝධි පූජා තියනවා. මටත් ඇගේ කුසේ ඉපදෙන්න පුළුවන්. ඒත්, කොහොමද මං මයෙ දරු පැටිය දාලා යන්නෙ.

සුනන්ද කුඹුරෙ වැඩ. මං වෙල අයිනේ කුඹුක් ගහ ළඟ වාඩිවෙලා, ඒ දිහා බලාගෙන හිටියා. එයා හරිම කඩිසරයි. ශක්තිමත්. ඉර එළියට දාඩිය මුතුකැට වගේ දිලිසෙනවා. අපි දෙන්නා ආදරේ කරපු කාලේ මට මතක් වුනා. ඒ දවස්වලත් මම මෙතන ඉඳන් එයා වැඩ කරන දිහා බලා ඉන්නවා.

නංගී සුනන්දට කෑම අරන් එනවා මං ඈත තියා දැක්කා. සුනන්ද මට අරන් දුන්න ගවුම. සුනන්ද හරි කැමතියි මං ඒක අඳිනවට. නංගී අද ඒක තමයි ඇඳගෙන ආවේ. මට වඩා නංගීට ඒක හැඩයි කියලා මට හිතුනා.

නංගී කෑම එක අරන් ආවට, සුනන්ද ඒ වගක් දැනුනෙ නෑ වගේ වැඩ. එහෙම කරන එක එච්චර හරි නෑ නේද කියලත් මට හිතුනා. මට අරං දුන්න ගවුම නංගී ඇන්ද එකට සුනන්ද සතුටු නැතුව වත්ද. නංගී සුනන්දට අඬගැහුවේ සුනන්ද එයා දැක්කෙ නැති ගානට හිටපු නිසා.

“අයියේ එන්න බත් කාලා ඉමු” සුනන්ද ඒත් නෑහුනා වගේ වැඩ.

“එන්නකො මහත්තයො මුරණ්ඩු නොවී”

මේකිට මක්වෙලාද, කියලා මට හිතුනා. ඒකට නම් සුනන්දගේ මුහුණ රතු වුනා. එයා හෙමින් හෙමින් ඇළ පාර අයිනට ගියා මූණ අතපය හෝදන්න. නංගීත් සුනන්ද ළඟට කිට්ටු වුනා. මාත් නංගී පස්සෙන් ගියේ මොකද වෙන්නෙ බලන්න. නංගී ඇළ ළඟට ආවත් සුනන්ද එකීව තඹ සතේකට මායිම් කළේ නෑ. ඒ හින්දා මගේ හිතට පොඩි සතුටකුත් ආවා.

"අයියෙ, ලස්සනද?"

"මොකක්ද"

"ගවුම"

"හොඳයි" සුනන්ද ඇවිත් කුඹුක් ගහ යට වාඩි වුනා. නංගිත් එතනට
ආවා.

"අයියේ, මං කවන්නද?"

"නෑ මට කන්න පුළුවන්"

"එහෙනම් මං යන්නද?"

"හ්ම්"

නංගි ඇයි එහෙම හැසිරෙන්නෙ කියලා මට හිතාගන්නත් බෑ. මා ගැන මතකයක්වත් නෑ වගේ. ඒත් සුනන්ද එහෙම නොකරන එක ගැන මට සතුටුයි. සමහරවිට ඒකි එහෙම කරන්නේ මහත්තයගේ දුක නැති කරන්න වෙන්නැති. සුනන්ද බත් එකට අතවත් තිබ්බෙ නෑ. ටික වෙලාවක් කල්පනා කර කර ඉඳලා අයෙත් වැඩ පටන් ගත්තා.

මං මයෙ දෝණි ළඟට ආවා. මට හිතෙනවා දූ පැටියට කිරි දෙන්න. මයෙ දෝණි මං ළඟට එනකල්, මට අම්මා කියලා කතා කරනකල් මං හරි ආසාවෙන් හිටියේ. මයෙ දෝණි බඩගිනි වෙලා අඬනවා. ඒත් මට එයාට කිරි දෙන්න බය හිතුනා. නංගි කිරි බෝතලයක් හදාගෙන ඇවිත් දරුවට පෙව්වා.

"අම්මේ......... තවත් කෙනෙක් කොරෝනා වලින් අද නැතිවෙලා දැන් ලංකාවේ

ඔක්කොම නවදෙනෙක් නැතිවුනා කොරෝනා වලින්."

නංගි අම්මට කෑ ගහලා කියනවා මට ඇහුනා. මාත් ඒ අතරින් කෙනෙක් නේද කියලා මට හිතුනා. එක් අතකින් මං නිසා කාටවත් කරදරයක් වුනේ නැනේ. මං නිසා කිසිම කෙනෙක්ට මේ කරුම ලෙඩේ හැදිලා විඳවන්න වුනේ නැති එක ගැන මට සතුටුයි. මාව කෑවත් මං මදුරුවෙක් වත් මරන්නේ නැති එකේ මං නිසා කාට හරි මැරෙන්න වුනානම් මං මටම සමාව දෙන එකක් නෑ.

ගමේ පොඩි උන් පාරේ සෙල්ලම් කරනවා. උන්ට ඉස්කෝලෙත් නිවාඩුනේ, රජ මගුල් වගේ. පොඩි උන් ටික සෙල්ලමට උදේ ආවම නටලා නටලා ආයි හවස තමා ගෙවල්වලට යන්නෙ. කන්න බොන්නවත් සිහියක් නෑ උන්ට නටන්න තියෙනවනම්.

හෙට චූටි දෝණිගේ කණ විදිනවලු. නංගි කියනවා මං අහගනයි. හෙට මයෙ කෙල්ල අඬාවිද දන්නෑ. චූටි කන් පෙතිවලට කරාබු දැම්මම ලස්සනට ඉදී මයෙ මැණික් කැටේ. මං දුව දිහා බලං ඉන්නවා රෑ

එළිවෙකත්. සමහරදාට කොයිතරම් වෙලා බලා හිටියත් ඇති වෙන්නෙ නෑ. රෑ මැද්දෙ ඇහැරිලා අඬනවා, පෙළක් දවසට අම්මා හරි නංගි හරි නැගිටලා දුවව ආයෙත් නිදි කරනවා. එක්කො බඩගිනි වෙලා අඬනවා. නැත්තං ඇගේ චූ දාගෙන. අම්මයි නංගියි මයෙ දෝණිව හරියට

පරිස්සම් කරනවා. කිරි එරෙන් නැති ටික විතරයි ඒකිට. මයෙ නංගිත් අම්මෙක් වගේ මයෙ චූටි මැණිකට, ඒ හින්දා මට බයක් නෑ.

උදේ දෝණිගේ කණ විදින්න යද්දි මාත් ගියා ඒ පස්සේ. චූටි දෝණි ඇඬුවා ටිකක්. ගෑණු අපි ඉවසන්න ඉගෙන ගන්නෙ එතනින් නේද කියලා, මට හිතුනා. දෝණිගේ කණ විදගෙන ආවට පස්සෙ දූ කිරි බීලා හොඳට නිදා ගත්තා. මං පන්සලට ගියා. පන්සලේ තියෙන ඒ නිස්කලංක බවට මං හරි කැමතියි. අදත් අර ගෑණු කෙනා පන්සලට ඇවිත් හිටියා සුදු අරලිය මල් වට්ටියකුත් අරගෙන. අද නම් පන්සලේ හය හත් දෙනෙක් හිටියා. දැන් කොරෝනා වසංගතය සමාජෙ නෑ කියලා ටීවී එකේ කියනවා මං අහගෙනයි.

අම්මෙක් වෙන්න මං හීන දැක්ක වගේම ඈත් හීන දකිනවා. මං වගේම ශරීරයක් නැතිව සැරිසරන ආත්මයක් මට හම්බ වුනා. මං එයාට කිව්වා අර අම්මගෙ කුසේ ඉපදෙන්න කියලා.

"මට ආයෙත් ඉපදෙන්න පිං මදියි. මං සියදිවි හානි කරගත්ත නිසා" එයා එහෙම කිව්වේ හරිම පසුතැවීමකින්.

මටත් එයාගෙ කුසේ ඉපදෙන්න බෑ. මයෙ දූ පැටියව බලාගන්න මං ඉන්න එපැයි. මං කොහොමද මයෙ දුවව දාලා යන්නේ.

සියදිවි නසාගන්න එක මොනතරම් පවක්ද? ආයෙත් ඉපදෙන්න බැරි තරම්ම පවක් ඒක. මට මතකයි දවසක් පන්සලේ නායක හාමුදුරුවෝ බණකට දේශනා කරා සියදිවි නසා ගැනීම ප්‍රාණඝාතයකට සමානයි කියලා.

"අම්මේ අක්කගෙ හත් දවසෙ දානෙත් දී ගන්න බැරිවුන එකේ අපි බණක් කියලා දානයක් දෙමු අක්කගෙ නමට, දැන් තුන් මාසෙත් ළඟයිනේ."

නංගී අම්මට කියනවා මං අහගනයි. අම්මා මෙච්චර කල් දුක හිත ඇතුලේ තද කරගෙන ඉඳලා, තවත් හංගන්න බැරි තැන අම්මගෙ ඇස්වලින් කඳුළු කැට කඩන් වැටුනා.

"අනේ මයෙ රත්තරන් කෙල්ල, කුරා කුඹියෙකුටවත් වරදක් නෑ ඒකිගෙන්. කොහේ හරි හොඳ තැනක ඉපදිලා ඇති මයෙ කෙල්ල. මට අන්තිමට ඒකිගේ මූණවත් බලාගන්න බැරි වුනානේ රත්තරං දරු පැටියෙක් මට දීලා යන්න ගියා."

"අඬන්න එපා අම්මෙ අක්කටයි පව් පිරෙන්නෙ. අක්කා කොහේ හරි හොඳ තැනක ඇති.

අම්මා ඔහොම අඬනවා දැක්කොත් අක්කගෙත් හිත රිදෙයි." නංගි එහෙම කිව්වෙ හරියට ඒකිට මං ඉන්න බව පේනවා වගේ.

"පොඩි කෙල්ලේ උඹ අක්කට ආදරයක් තියෙනවනම්, ඒකිගේ මිනිහගේ කරේ එල්ලෙන්න යන්න එපා මයෙ දුවේ" අම්මා එහෙම කිව්වේ ලොකු හිතේ අමාරුවකින්. ඒ වචන ටික ඇහුනම මට ලොකු කලකිරීමක් ඇතිවුනා.

"මං අක්කට ද්‍රෝහි වෙන්න හිතුවා නෙමෙයි අම්මේ." නංගි එහෙම කියලා අඬාගෙන ගෙට දිව්වා.

සුනන්ද හවස ගෙදර ආවම නංගි එයා එක්ක කතා කර ගත්තා හාමුදුරුවෝ පහලොස් නමකට දානයක් දෙන්න. සුනන්ද නිරෝධායනයට ගිහින් ගෙදර ආ දා ඉඳලා එයා මාව සිහිකරලා සත්තුන්ට කෑම දෙනවා. මාත් සාදු.... සාදු.... කියලා ඒ පිං අනුමෝදන් වෙනවා.

සුනන්දයි නංගියි පහුවදාම පන්සලට ගියා හාමුරුවන්ට දානෙට ආරාධනා කරන්න. බණට ලොකු හාමුදුරුවන්ට ආරාධනට කරා. දානෙට හාමුදුරුවරු පහලොස් නමකට ආරාධනා කරා. කට්ටිය දානෙටයි බණටයි හරි හරියට ලෑස්ති වෙනවා. පුංචි අම්මලත් අපේ දිහා ඇවිත් දානෙට උදව් වෙන්න.

"අනේ කාංචනා කෙල්ල මට හරියට උදව් කළා, මගේ කකුල බැරුව ඉද්දි. මගේ රෙදි ටික පවා සේදුවේ ඔය කෙල්ල තමයි." පුංචි අම්මා මගේ හොඳම කියනවා ආ වේලේ ඉඳන්. නයනි නංගිත් එහෙමයි. ඒකිත් ඉතින් පුංචි අම්මගෙම දූනේ. කොහොමත් නයනි නංගි මට හරි ලෙන්ගතුයි, අපි පුංචි කාලේ ඉඳන්.

නයනි නංගිගේ වැඩේම ආ වෙලේ ඉඳන් දෝණිව හුරතල් කරනවා.

**"වැනියන් බබා වැනීයන් - රෑට බතට වැනීයන් වැනියන් කළු**
**වැනීයන් - බත් දෙනකන් වැනීයන්"**

මයෙ දෝණිත් ඒකටම හරි ගිහින්. නයනි නංගි දෝණිත් එක්ක කෝලිත්තං කරනවා. මාත් උන් දෙන්නගේ කෝළම දිහා බලාගෙන උන්නා.

කට්ටිය හරි හරියට ගෙවල් දොරවල් අස් කරනවා. සුනන්ද වත්ත එළි කර කර හිටියා. ඒ අල්ල පනල්ලෙ නංගිත් තේ එකක් අරං එතනට ආවා. සුනන්දත් දැන් වෙනදා වගේ නෙමෙයි. මාව අමතක වෙලාද මන්දා. නංගීට විහිළු තහළුත් කරනවා දැන්. ඒ දෙන්න එක්ක විහිළු කර කර හිනා වෙනවා. මං ආවා දෝණි ළඟට. නයනි නංගී දෝණිව නාවලා නිදි කරනවා. මොට්ටුවකුත් තියලා නලල මැද්දෙ අනේ

අම්මේ….., තියෙන සිරියාව. නයනි නංගී දෝණි නිදිකරලා තියලා වටේටම කොට්ටත් තිබ්බා වැටෙයි කියලා. මාත් දූ පැටියා ළඟින් ඇලවුනා.

දෝණි ටිකකින් ඇහැරිලා අඬන්න පටන් ගත්තා. හොඳටම බඩගිනි වෙලා වගේ. දෝණිට කිරි එක් හදලත් නෑ. නංගියි සුනන්දයි එළියෙ ලොකු කතාවක්. නයනි නංගිත් නාන්න ගියා. අම්මයි පුංචි අම්මත් කොහාට ගිහින් ද මන්දා. මං දෝණිට කිරි දුන්නා. මං මයෙ දූ පැටියට කිරි දුන්න පළවෙනි වතාව. මට දැනුන සතුට මට වචනයෙන් කියන්න බෑ. මං කොයිතරම් හීන දැක්කද මට මයෙ දූ පැටියව තුරුළට ගන්නවත් අවස්ථාවක් ලැබුනේ නෑ. මං කොයිතරම් වාසනාවන්ත ද කියලා මට හිතුනා. දෝණි බඩ පිරෙන කල් කිරි බිව්වා. නයනි නංගී නාගෙන කාමරේට එද්දිම මං දූ ළඟින් අයින් වුනා. මයෙ චූටි දොණිට විතරයි මාව පේන්නේ. මං දූ ළඟින් අයින් වුනාම දූ හයියෙන් ඇඬුවා. මට හරි ලෝබ හිතුනා කෙල්ල අඬද්දි. නයනි නංගි දුවව වඩාගෙන එළියට ගියා. කිරි බෝතලේ කට ළඟට ළං කළත් දූ කිරි බිව්වෙ නෑ. කොහේ බොන්නද දෝණිගෙ බඩ පිරිලනේ.

සුනන්දගෙයි නංගිගෙයි කසු කුසුව නම් ඉවරයි වගේ. දැන් නංගි තමා සුනන්දගේ රෙදි පවා හෝදන්නෙ. සුනන්ද වත්ත පිටිය එළි කරලා නාගන්න යද්දි නංගි බලෙන්ම වගේ හෝදන්න තියෙන රෙදි ටික ඉල්ල ගත්තා. මං ඒ දේවල් දැන් වැඩිය හිතට ගන්නෙ නෑ. මොකටද බොරුවට මයෙ හිත රිද්ද ගන්නෙ.

මං දැන් දෝණිට බඩගිනි වුන ගමන් කිරි දෙනවා. මයෙ දූත් බඩ පිරෙන කල් කිරි බොනවා. ඒක මට කියාගන්න බැරි තරම් සතුටක්. මයෙ ජීවිත කාලෙට මං ලබපු ලොකුම සතුට තමයි මේක. ගෙදර අය කිරි බෝතලෙන් බලෙන් කිරි පොවන්න හදනවා. අම්මා මතුරලත් පොවන්න හදනවා. දෝණි කිරි බොන්නැති නිසා ගෙදර අයත් බයවෙලා. මතුරපු තෙල් වගේකුත් ගෙනත් දෝණිගෙ ඔළුවෙ ගෑවා.

දෝනි දැන් ඇඳේ පෙරළෙනවා. මං එයා ගාව ඉඳන් අයින් වුනාම මගේ දෝනි හරියට අඬනවා මං දිහා බලාගෙන.

බණට වැඩිය හාමුදුරුවෝ මං ගැන කතා කරනවට වඩා සුනන්ද ගැනයි කතා කළේ. දානේ වැඩ කටයුතු ටික නම් හොඳට තිබුනා. හාමුදුරුවෝ පහළොස් නමම දානෙට වැඩියා. නංගීලා දානෙ පූජා කරලා අවසානෙ අට පිරිකරකුත් පූජා කළා. ලොකු හාමුදුරුවෝ මගේ නමට පිං අනුමෝදන් කළා. මං ඒ පිං පන්සලේ නැවත උපතක් ලබාගන්න බැරිව දුක් විඳින සිය දිවි නසාගත් කෙනාට අනුමෝදන් කරලා එයාට නැවත උපතක් ලබාගන්න පුළුවන් වෙන්න කියලා ප්‍රාර්ථනා කළා. මට එයා ගැන හරිම අනුකම්පාවක් ඇතිවෙලා තිබ්බේ. ආදරය හින්ද තමයි එයා එයාගෙම ජීවිතේ නැති කරගෙන තියෙන්නේ. එයාගේ කතාව මං එක්ක කිව්වම මට පිරිමි ජාතිය ගැන ලොකු පිළිකුලක් ඇතිවුනා. ඒත් මගේ මහත්තයා එහෙම නෑ නේද කියලා මට ඒ වෙලාවෙ හිතුනා. ඒත් දැන් දැන් සුනන්දගෙ වැඩ දැක්කම හිතෙනවා මං හිතපු දේ වැරදියි ද කියලා.

හාමුදුරුවෝ බණට වැඩලා ගියාට පස්සෙ මයෙ හිතට හරිම සැහැල්ලුවක් දැනුනා. ඇයි ද කියන්න නම් මං දන්නෙ නෑ. ඒ කොයි කොහොම වෙතත් හිතට දුකක් කරදරයක් වුනාම බණ පදයක් අහනවා

තරම් සතුටක් තවත් නෑ. මං දෝණි ලැබෙන්න කළින් හිතන් හිටියේ දෝණි එක්ක පන්සල් යන්න. පුළු පුළුවන් වෙලාවට දූ එක්ක හැමදාම පන්සල් යන්න. දූවව පිණට දහමට ලැදි දරුවෙක් කරන්නයි මට ඕන වුනේ. දෝණිව ලැබෙන්න ඉන්දැද්දිත් මං බණ අහන්න පුරුදුවෙලා හිටියා. ඒ පුරුද්දම දෝණිටත් ඇවිද්ද මන්දා හාමුදුරුවෝ බණ කියද්දී හ්ම් සද්දයක් නැතිව අහගෙන හිටියා. මං ගිහින් දෝනි ළඟින් ඇළවුනා. හොඳටම හවස් වෙලා මං දෝණිට කිරි දුන්නා. බඩගිනිත් ඇතිනේ දැන් පැටියට. කිරි බොන ගමන්ම දෝනිට නින්ද ගියා. මයෙ දෝණි ළඟට ආවම මට අනෙක් හැම ප්‍රශ්නයක්ම අමතක වෙනවා. මට වෙන කවුරු නැතත් මයෙ දෝණි ඉන්නවනෙ කියලා හිතෙනවා. මයෙ අම්මටත් මාවයි නංගිවයි හම්බවුනාම එහෙමම හිතන්න ඇති.

ඒත් මම අම්මා එක්ක කොච්චර රණ්ඩුවෙලා තියෙනවද? ඒත් ඒ අම්මට තිබුන ආදරේ අඩුවක් වුන නිසා නෙමෙයි. “අම්මේ මගේ අම්මට තමයි මං මේ ලෝකෙන් වැඩියෙන්ම ආදරේ කරේ.” මට මතකයි මං පුංචි කාලේ අම්මා මාව ඉස්කෝලෙ ඇරිලා එක්ක යන්න එනකල් මං ගේට්ටුව ළඟට වෙලා ඉදපු හැටි. අම්මා ආවම මට පුදුම ලොකු කමක් දැනෙන්නේ.

දවසක් මට විභාගෙට ලකුණු අඩුවෙලා, අම්මට ඉස්කෝලෙට එන්න කියලා තිබුනා. එදා අම්මා ඔසරියක් ඇඳගෙන ඉස්කෝලෙට එද්දි මං දැක්කෙ අම්මවත් ටීචර් කෙනෙක් වගේ. මගේ අම්මා තමා ලස්සනම කියලා මට හිතුනා. අම්මා මට බනිද්දිත් මං එදා බලා හිටියේ අම්මගේ ලස්සන දිහා. තාත්තා බීගෙන ගෙදර ආවත් අම්මා තාත්තට කවදාවත් බැන්නෙ නෑ. කවදාවත් තාත්තගේ නුගුණක් අපි එක්ක කියලා නෑ. ඉස්සර තාත්තා ගෙදර එන්නෙ රෑ වෙලා. අම්මා තාත්තා එනකල් කන්නෙත් නැතිව බලා ඉන්නවා. අම්මා පැදුරු විය විය ගත්ත සේරම අපේ බඩ කට පුරවන්නමයි වියදම් කරේ. මයෙ අම්මට “අම්මෙ මං ආදරෙයි” කියලා කියන්න හිතුනු වාර අනන්තයි. ඒත් මං කවදාවත් එහෙම කිව්වෙ නෑ. ඒක මගේ ලොකුකමද, අසරණකමද, කියලා මට තාමත් හිතාගන්න බෑ.

චූටි දෝණි ළඟ ඇලවෙලා ඉන්න ගමන් මං මගේම ලෝකෙක තනිවෙලා. මගේ පුංචි කාලේ මගේ ඇස් ඉස්සරහ මැවි මැවී පෙනුනෙ චිත්‍රපටියක් වගේ.

මට ඒත් එක්කම මයෙ ඉස්කෝලේ මතක් වුනා. මං ඉස්කෝලෙට ගියේ සාමාන්‍ය පෙළට වෙනකල් විතරයි. සාමාන්‍ය පෙළ විෂයයන් පහයි පාස් වුනේ. අම්මට ඒකත් මහමෙරක් වුනා. මට හිතුනා මයෙ ඉස්කෝලෙට යන්න. අස්වීම් සහතිකේ ගත්තට පස්සෙ මං ඉස්කෝලෙට ගියේ නෑ. මට මතක් වුනා මගේ පන්තිය. දැන් කවුරුවත් නෑ පාළුවට ගිහින්. ඉස්සර කජු ගහ යට අපි කජු ඇහින්දා. ඉගෙන ගන්නවට වඩා කරේ ගඩා ගෙඩි කඩන එකමයි. රම්‍යයි, මලිතයි තමා මට හිටිය හොඳම යාළුවො දෙන්නා. මයෙ රහස් ඔක්කොම දන්නෙ උන් දෙන්නා. මට සරත්ව මතක් වුනා. ඇහැල ගහ යටට ගියාම. කහපාට මල් පිරිලා තිබ්බෙ. එදා වගේමයි. පන්තියෙදිත් සරත් මං දිහා හොරෙන්

බලනවා මං තුන් හතර වතාවක් දැකලා තිබුනා. ඒත් මං නොතේරෙන ගානට උන්නා. මලිතියා නම් හොඳ මීටරේ.

"උඋ උඹට කැමතියි බන්. "

"පිස්සුද බං එහෙම එකක් නෑ. ලොකු ඉස්කෝලේ මහත්තයගෙ පුතා බලයිද බං අපි දිහා." මං හැම වෙලේම මලිතිගේ කතාවට පිටු පෑවේ නෝංජල් හිනාවක් දාගෙන.

සරත්ට ඉංග්‍රීසි එහෙමත් හොඳට පුළුවන්. ඒ දවස්වලත් එයා කොළඹ ටියුෂන් පන්තියකට ගියා. මට මතකයි. සරත් හරිම කඩවසම්. ඒ නිසා පන්තියෙ හැම කෙල්ලෙක්ගෙම හිත්වල සරත්ට කැමැත්තක් තිබුනා. අනික හැම වාරෙකම සරත් තමයි පන්තියේ පළවෙනියා වුනේ. දවසක් කජු ගහ යටදි සරත් මට කොළයක් දුන්නා.

" I Love you Kanchana"

ඒකෙ එහෙම ලියලා තිබුනේ. මං " චික් " කියලා ඒක විසික් කරා.

"උඹට පිස්සුද බං පන්තයේ හැමෝම උඋට කැමතියි. බලපන්, උඋ ඇඹලයා වගේ උඹේ පස්සෙන් එන හැටි. මේ හැඩට ඉන්න අපි දිහාවත් බලන්නෑ." මලිති හැම වේලේම ඕක තමයි කිව්වේ.

"අනේ උඹ දිහා බලන්න වැඬේමයි. උඋ වෙන එකියක් දිහා බලයිද පන්තියෙ ඉන්න හැඩම කෙල්ල අපේ කාංචනානේ." රම්‍යා එහෙම කියද්දි මගේ මුහුණ රතුවෙනවා.

ඇත්තටම මයෙ හිතෙත් සරත් ගැන ඇල්මක් තිබුනා. පස්සේ අපි දෙන්නා අතර හිතවත් කමක් ඇතිවුනා. ඒ ගැන මුළු ඉස්කෝලෙම වගේ දන්නවා. ලොකු මහත්තයා නම් අපේ සම්බන්දෙට කැමැත්තක් තිබුනෙ නෑ. මේ ඇහැල ගහ යටදි තමයි මං සරත්ට මගේ හිතේ තිබුන දේ කිව්වේ. ඒත් මලිතිගේ බල කිරීමට. එදා ඒ ඇස් දිලිසුනු හැටි මට තාම මතකයි. සරත් මගේ අතින් අල්ල ගත්තම මට දැනුනෙ මාව ගිණි ගන්නවා වගේ. විභාගෙන් පස්සෙ මට ආයෙත් එයාව හම්බ වුනේ නෑ. එයානම් විභාගෙ ඉහළින්ම පාස්. විභාග ප්‍රතිඵල ආව දවසෙ ලොකු ඉස්කෝලෙ මහත්තයට තිබුන සතුට ඇස්වලින්ම පෙනුනා. එදානම් ලොකු ඉස්කෝලෙ මහත්තයා මා එක්ක හිනාවුනා. එදා සරත් මට දුන්න ලියුම තාමත් මගේ අල්මාරියෙ තියෙනවා. දැන් එයා ඉංජිනේරු මහත්තයෙක්ලු. මට ඕවා වැඩක් නෑ. මං ආවා මයේ දෝණි ළඟට, තාමත් නිදි හොඳටම.

"හොඳටම හවස්වෙලා නාගන්නෙ නැද්ද." නංගී සුනන්දට කෑ ගහනවා. එයත් නංගීට අවනත වෙලා නාගන්න ගියා. අපි බැඳපු අලුත මායි සුනන්දයි එකටමයි නාගන්න ළිඳට ගියෙ. සුනන්ද කවුරුවත් නැද්ද කියලා බලලා මගේ මූණ ඉඹිනවා. මං එයාව අහකට කරන්නෙ කවුරුවත් දැක්කොත් හරි නැති නිසා.

සුනන්ද නාගන්න ළිඳ ළඟට ආවා. නංගිත් ආවා ඒත් එක්කම. වෙනදනම් නංගී සුනන්ද ඉද්දී දිය රෙද්ද ඇඳගෙන එළියට බහින්නෙ නෑ. දැන් ඒකිගෙ ලැජ්ජාව ගිහන් ද කොහෙද?.

“නංගීත් ආවද, දෝණි ඇහැරුනොත් කවුද බලන්නෙ” “මං කිරි එක හදලා තිවෙන්න තියලා ආවේ අයියෙ.” නයනි නංගී බලයි නැගිට්ටොත්.

නංගීට නාගන්න වතුර ඇදලා දුන්නෙ සුනන්ද. ඒ දවස්වල මටයි අම්මටයි නාන්නත් වතුර ඇදලා දුන්නෙ සුනන්ද තමයි. ඒත් අනේ මන්දා.

“අයියේ ..........අනේ පොඩි උදව්වක් කරන්නකො. මගේ මේ පිටෙ පොඩ්ඩක් බලන්නකො නිකං මොකෙක් හරි යනෝ යනෝ වගේ දැනෙනවා.”

නංගී සුනන්ද දිහාට පිට හරවන ගමන් එයාගෙ දිග කෙස් වැටිය ඉස්සරහට ගත්තා.

“ආ ............ මේ දිමියෙක්.”

සුනන්ද දිමියාව අරන් දැම්මා. නංගී ඒ වෙලාවෙ සුනන්ද දිහා බලපු විදිහ. සුනන්දත් නංගීගේ ඇස් දෙක දිහා බැලුවා. දෙන්නට දෙන්න ඇස් දිහා බලන් ඉන්නවා. මං ගල් කැටයක් අරන් ළිඳට ගැහුවා. නංගි ගැස්සිලා අහක බල ගත්තා.

මං මයෙ දෝණි ළඟට ගියා. දෝණි ඇහැරිලා. නයනි නංගි දෝණිගේ නැපිය මාරු කරනවා. ඇගේ කක්කා දාගෙන. නංගී වෙන නැපියක් ඇන්දුවා. දැන්නම් කෙල්ල හිනාවෙනවා. හිනාවනම් සුනන්දගේ හිනාවමයි. අතපය ගස්ස ගස්ස කෑ ගහනවා. හරිම දඟයෙක් වගේ පෙන්නෙ.

නයනි නංගිට කෝල් එකක් ආවා. මං දූ ළඟින් ඇළවුනා. මයෙ කෙල්ලට ආයෙත් බඩගිනිවෙලා වගෙයි. මං දෝණිට කිරි දුන්නා. නයනි නංගී කිරි බෝතලේ අරන් ඇවිත් දෝණිගෙ කටට ළං කරත් බිව්වෙ නෑ. නයනි නංගී දෝණිව වඩාගත්තා. එතකොට තමයි ගුඩුස් එක ගියේ. මං ළඟින් ගන්නවට දෝනි කැමති වුනේ නෑ. නයනි නංගී දෝනිට කතා කිය කියා එළියෙ එහෙ මෙහෙ ඇවිදිනවා. කුරුල්ලෝ පෙන්නනවා. සමනල්ලු පෙන්නනවා.

දෝණිත් හරි ආසයි එළියට අරං යනවට. එළියේ ඉදන් ගෙට අරන් ගිය ගමන් අඬනවා.

මට තාමත් මතක් වෙනවා ළිඳ ළඟදී නංගී සුනන්ද දිහා බලන් ඉදපු විදිහ. බැදපු දවසෙ රෑ සුනන්ද මං දිහා බැලුවෙත් ඒ විදිහට. මිනිස්සු මේ තරම් ඉක්මනට වෙනස් වෙන්නේ කොහොමද කියලා මට හිතාගන්න බෑ. මගේ මරණෙ ගැන අහපු වෙලාවේ මං වෙනුවෙන් දුක් වුනු සුනන්ද. මං එක්ක ආදරෙන් ඉදපු මගේ මහත්තයා, මේ තරම් ඉක්මනට කොහොමද මාව අමතක කරේ. ඒ දවස්වල මං හිතුවේ මට කවුරු නැතත් මගේ මහත්තයා ඉන්නවනේ කියලා. මං මයෙ අම්මටත් වැඩිය එයාට ආදරේ කරා. ඒත් අදටත් මං ගැන දුක්වෙන්නෙ මයෙ අම්මා විතරයි. එක අතකට සුනන්දටත් හැමදාම දුකින් ඉන්න බැනේ.

එයාගේ ජීවිතේටත් සතුටක් තියෙන්න එපැයි.

අම්මා වතුසුදු මල් වට්ටියක් කඩාගෙන එනවා පහන තියන්න. මයෙ අම්මා හැමදාම මල් පහන් පූජා කරලා මට පිං අනුමෝදන් කරනවා. අම්මෙක් දරුවෙක්ට කොයිතරම් ආදරේද කියලා මට තේරුණේ මයෙ දෝණි මං ළඟට ආපු දවසෙ. මට අම්මගේ අගේ වැඩියෙන් ම දැනුනේ එදා.

සුනන්දයි නංගියි නාගෙන ආවා. නංගී එද්දිම ඇහුවේ දෝණි කිරි බිව්වද කියලා. දෝණි කිරි බෝතලේ කටටවත් නොගන්න එක දැන් ගෙදර හැමෝටම ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ. දෝණිගේ බඩ පිරිලා තියෙන බව දන්නෙ මං විතරනේ. සුනන්ද ලොකු හාමුදුරුවන්ගෙන් පිරිත් නූලකුත් ඉල්ලං ඇවිත් දෝණිගේ අතේ බැන්දා.

“බුද්ධේජ ධම්මේජ සංඝේජ රාජං………….. අම්මා රෑට දෝනිගෙ ඔළුව අතගගා මතුරනවා තුන් සූත්‍රයත් කියනවා.

හෙට දෝණිගේ කොණ්ඩේ කපන කතාවක් සුනන්ද නංගි එක්ක කියනවා මං අහගෙනයි. සුනන්දගේ කොණ්ඩෙමයි දෝණිට තියෙන්නේ. මං වෙලාවකට දෝණිගේ ඇස් දෙක දිහා බලා ඉන්නවා. කිසිම හැඟීමක් නෑ, ඒ ඇස් හිනාවෙද්දි දිලිසෙනවා.

මං පන්සලට ගියා. පන්සලේ තියෙන නිස්කලංක බවට මං හරිම ආසයි. අර කෙල්ලට දැන් දරුවෙන් ලැබෙන්න ඉන්නවා. තාම කුස පෙන්නෙ නැති වුනත් ෆිනපෝ ගවුමක් ඇඳගෙන පන්සලට ආවේ. වෙනදා නැති හිනාවකුත් ඇගේ මූණේ තිබුනා. මං පිං දුන්න කෙනා ඇගේ කුස පිළිසිඳගෙන. මට එදා දැනුන සතුට අද එයාටත් දැනෙනවා ඇති. මම ලේ එකක් චෙක් කරන්න ගියාමයි දැන ගත්තෙ මට දරුවෙක් ලැබෙන්න ඉන්න වග. ඒ වෙලාවේ සතුටට මයෙ ඇස්වලට කඳුළුත් ආවා

දෝණිට උණ අරගෙන මං දූ ළඟින් වාඩිවුනා. මගේ දුව අමාරුවෙන් ඉන්නවා. ඇස් දෙකේ කඳුළුත් පිරිලා. “අනේ මයෙ මැණිකට මොකද?” නංගීයි සුනන්දයි දෝණිව හන්දියේ ඩිස්පෙන්සරියට එක්කගෙන ගියා. දොස්තර මහත්තයා දෝණිට පොවන්න පැණි වගයක් දීලා තිබුනා. නංගී දෝණිට බෙහෙත් පෙව්වා. අම්මා දෝණිව කකුල් දෙකේ දාගෙන නින්ද යනකල්ම කවි කිව්වා. අනේ මයෙ දෝණිව අසනීප වුනේ මං නිසාද, මං මයෙ කෙල්ලට කිරි දුන්න නිසාද? අනේ මයෙ දරු පැටියට නම් මුකුත් වෙන්න එපා දෙවියනේ. ගෙදර අයත් ගොඩක් බයවෙලා හිටියේ. මට මේ වගේ දුකක් කවදාවත් දැනිලා නෑ. අනේ මයෙ දරුවා. මං ආයෙත් පන්සලට ගියා. රෑ එළිවෙනකල් මයෙ දෝණි වෙනුවෙන් ප්‍රාර්ථනා කරා. එළිවෙනකල් මට දැනුනෙ නෑ.

එකපාරටම මට පන්සලේ ඉන්න බැරි බව මට තේරුණා. මොකක්දෝ ලොකු ශක්තියකින් මාව ඇදලා ගන්නවා වගේ මට තේරුණා. ඒ ශක්තියත් එක්ක මට සටන් කරන්න බැරි වුනා. එකපාරටම මාව ශරීරයක් ඇතුලේ හිරවුනා. මගේ ඔළුව කැරකෙනවා වගේ මට දැනුනා. ඒ වේදනවා දරාගන්න බෑ.

මට සන්සුන් වෙන්න කියලා කවුදෝ කියනවා මට ඇහුනා. මට කරදරයක් කරන්නෑ කියලත් එයා කියනවා මට යන්තමට ඇහුනා. මං ගොඩක් බයවෙලා හිටියෙ මොකක්ද වෙන්න යන්නේ කියලා හිතාගන්න බැරුව. මං දැක්කා නංගීයි සුනන්දයි මං දිහා බලා ඉන්නවා. මගේ දරුවා නංගිගේ අතේ ගුලිවෙලා හිටියා. මට සැනසීමක් දැනුනෙ එතකොටයි.

නංගිලා දුවව ගුරුන්නාන්සේ මාමා ළඟට අරන් ඇවිත්. මයෙ දුවගේ ඇඟේ පුංචි බිබිලි වගයක් ඇවිත් තියෙනවා මං දැක්කා.

“අනේ මගේ දරුවට මොකද,” මං නංගීගෙන් ඇහුවත් එකී කතා කළේ නෑ. ගුරුන්නාන්සේ මාමා මට කියනවා මුළින් සංසුන් වෙන්න කියලා. මාව අම්මගේ ඇඟ ඇතුළට ගෙන්නලා තිබුනා.

එයාලට මොනවද මගෙන් දැනගන්න ඕනේ. මාව බෝතලේකට දාලා හිරකරන්නද යන්නේ සුනන්දට පුළුවන්ද මට එහෙම කරන්න. දැන් මාව අමතක වුනත් එයා මට එහෙම කරන එකක් නෑ. මං සන්සුන් වෙන්න උත්සහ කරා. ගුරුන්නාන්සේ මාමා මගේ නම කියලා හරිම කරුණාවෙන් කතා කරා.

“කාංචනා දුවේ, මට දූගේ වේදනාව නොතේරෙනවා නෙමෙයි. තමන්ගෙ දරුවෙක්ව දාලා අම්මෙක්ට යන්න කියන්න මට බෑ. ඒත් දරුවෝ ඔය දරුවා දැන් සාමාන්‍ය මිනිස් දුවක් නෙමෙයිනේ. ඒ නිසා ඔය ළමයා මේ කිරි සප්පයට කිරි දෙන්න එපා. ඒ කිරි මේ දරු පැටියට විසයි දුවේ. ඒකයි මේ දරුවා අසනීප වුනේ මේ ළමයට තේරෙනවා නේද මං කියන දේ.”

සුනන්දගෙ ඇස් දෙකෙන් කඳුළු කඩන් වැටෙනවා මං දැක්කා.

“මං නිසාද මයෙ දරුවට අසනීප වුනේ.”

මං හයියෙන් කෑ ගහලා ඇඬුවා. මගේ හිතේ තිබ්බ හැම දුකක්ම නැතිවෙනකල් මම ඇඬුවා. නංගීත් අඬනවා මං දැක්කා. ගුරුන්නාන්සේ මාමා මාව සනසන්න කියන්න පුළුවන් හැමදේම කිව්වා. ඒත් ඒ එක දෙයක්වත් අහන්න මට ඕන වුනේ නෑ. මං විශ්වාස කරපු, මං එක හිතින් ආදරේ කරපු මගේ මහත්තයා, අද එයාට මාව මතක නෑ. මයෙ නංගි මගේ මහත්තයව මගෙන් උඳුරගන්න හදනවා. ඒ හැමදේම ඉවසගෙන මයෙ එකම සැනසීම වෙච්ච මයෙ දරුවා, අද මට එයා ළඟ ඉන්නත් තහනම්ද? මයෙ දරුවට එයාගේ අම්මගෙ කිරි විස වුනේ කොහොමද? මේ හැමදේටම හේතුව මං අකාලේ මියැදුන එකද? මට මයෙ හිත හදාගන්න ගොඩක් අමාරු වුනා. මං මගේ හැම දුකක්ම හැම කේන්තියක්ම නැතිවෙනකල් ඇඬුවා. එක අතකට සුනන්දටත් හැමදාම මං ගැන හිත හිතා ඉන්නා බෑනේ. මං එනකල් කියලා බලා ඉන්නද? එයත් සතුටින් ඉන්න එපැයි. මං මයේ දුක නිවාගන්න හිතත් එක්ක සටන් කරා. සුනන්ද මං ඉන්නකල් මට ආදරෙන් සැලකුවා. එයාගෙ වරදක් නෑ. මං සිතුවලි ගඟක අතරමං වෙලයි හිටියේ.

“අනේ මට සමාවෙන්න කාංචනා, ඔයාට වංචා කරන්න මට ඕන වුනේ නෑ.”

සුනන්ද අඬ අඬා මට එහෙම කිව්වා. සුනන්ද ඒ විදියට අඬනවා මං කවදාවත් දැකලා නෑ. මට එයා ගැන හරි අනුකම්පාවක් ඇතිවුනා.

“ඔයාගේ වරදක් නෑ සුනන්ද. මයෙ දරු පැටියව නංගී එක්ක හොඳින් බලාගන්න. මගේ හිතේ කහටක් නෑ.”

නංගීත් හොඳටම අඬනවා ආයෙත් දරුවට කිරි නොදෙන්න ගුරුන්නාන්සෙ මාමා මාව පොරොන්දු කර ගත්තා. මට කිව්වා හොඳ අම්මෙක් තාත්තෙක් බලලා හොඳ තැනක ඉපදෙන්න කියලා.

අන්තිමේදී නංගී මට කතා කරා. ඒකිගේ ඇස්වල මොකක්දෝ ලොකු වරදකාරි බවක් හැංගිලා තිබුනා.

"අක්කෙ මං වරදක් කළානම් මට සමාවෙලා දරුවෙක් වගේ මගේ කුසේ ඉපදෙන්න අක්කේ."
"දෝණිව අම්මෙක් වගේ බලාගන්නව කියලා මං පොරොන්දු වෙනවා අක්කෙ."

නංගි හොඳටම අඬ අඬා මට එයාගෙ කුසේ ඉපදෙන්න කියලා ඉල්ලුවා. මං අම්මගේ ශරීරෙන් අයින්වෙලා ආයිත් පන්සලට ගියා. පන්සලට ආවම මයෙ හිතට ලොකු සැනසීමක් දැනෙනවා. බෝ කොළ සුළඟට හෙළවෙන සද්දෙට මං හරි ආසයි. ඒ සිසිළසට හිත නිවෙනවා. මට ආයෙ ගෙදර යන්න හිත දුන්නෙ නෑ. ඒත් මයෙ දෝණිට දැන් කොහොමද දන්නෙ නෑ. මං ටික වෙලාවක් පන්සලට වෙලා ඉදලා ගෙදරට ආවා. මයෙ දෝණිට දැන් ටිකක් අඩුයි. සුනන්ද ගොඩක් දුකින් ඇඳට වෙලා ඉන්නවා. හුඟක් රෑ වෙලා. නංගී සුනන්දට තේ එකක් අරන් ඇවිත් අතට දීලා එයාගෙ ඔළුව අත ගෑවා.

නංගී සුනන්දට ඇත්තටම ආදරේ කරනවා. නංගීගේ ඇස්වලින් ඒක මට පේනවා. ඒත් එයා මයෙ මහත්තයා. මං කොහොමද වෙන කෙනෙක්ට දෙන්නේ. මං දහස් වාරයක් කල්පනා කරා. මට නංගී කිව්වා එයාගෙ දරුවෙක් වෙන්න කියලා. එතකොට මයෙ මහත්තයාද මගෙ තාත්තා, මට මේ මුකුත් හිතාගන්න බෑ.

ටික දවසකට පස්සෙ නංගීයි සුනන්දයි කච්චේරියට ගිහින් කසාද බැන්දා. සුනන්දයි මායි කසාද බැඳපු දවස මට මතක් වුනා. මං ඔසරියක් ඇඳලා තුන් තැල්ල දාලා කණ්නාඩියෙන් මං මයෙ රූපේ දකිද්දී මට හිතුනා මං මේ තරම් ලස්සනයිද කියලා. අපි උත්සවයක් ගත්තා. එදා රෑ හරිම ලස්සනයි. ලස්සනට හඳ පායපු රැයක්. අපි ගොඩක් වෙලා කතා කරා. සුනන්ද මගෙ ඇස් දෙක දිහා බලා ඉද්දි මට හිතුනා මගේ හදවත එළියට පනීද කියලා. මට තාමත් ඒ හැඟීම මතක් වෙනවා.

නංගි සුනන්දගේ කාමරේට ගියා. රෑ ගවුමකුත් ඇඳගෙන. අම්මා දූ ළඟ. සුනන්ද නංගිව ආදරෙන් ළඟට ගත්තා. මට දුකක් දැනුනෙ නෑ. මං නංගිගෙ කුසේ ඉපදෙන්න තීරණය කරා.

........නිමි .......

**කෙටිකතා පළමු ස්ථානය**

**ජී. එච්. පී ගනේගොඩ,**

**තාක්ෂණ පීඨය.**

## සුරඟන නොකියාම ගියා

උදැනැක්කේම ගෙදරින් පිටත් වුනේ ගම වටාම ගොස් පලා සෙවීමටය. පහළ වත්තේ ගුණපාල රාළහාමි කියූ ඒ ජරා වචන මතක් වන විට ගැහැනියක වුයේ කරුමයක් මැයි හිතමින් වැලපෙමින් ගෙදරට යන පඩිපෙළ නැංගේ කකුලේ අමාරුව තවත් වැඩි කරමින්. ඔව් ගැහැනියක්ව ඉපදීම කරුමයක් වෙන්න ඇති, එත් ගැහැනියක් තරම් පිරිමියෙක් ශක්තිමත් නෑ. ගැහැනියෙක්ගෙන්ම ඉපදෙන පිරිමියා ගැහැනිය පතන්නේ රාගයට ම පමණක් දැයි මම සිතුවෙමි. එත් මීට අවුරුදු විස්සකට පෙර සුමනපාල හා කරකාර ගිය මට, රාගයට පමණක් සීමා නොවූ ආදරය පිරුණු හදවතක් උරුම කී බව සිහිවිය. ලැබූ ගුරු වෘත්තියට ද, අවුරුදු විස්සක් උස්මහත් කල දෙමව්පියන්ගේ හිත ගින්නෙන් පුළුස්සා එදා රහසේම පැමිණි ගමන කෙලවර වුයේ ඉමක් කොනක් නැතිව දුක් විදීම් වලින් පමණි. මුදු මොලොක්ව තිබූ අත පය අතර කරගැට මතු වුයේ සුමනපාල හා හරි හරියට ගල්වලේ වැඩට ගිය පසුය. දැන් නම් මට ඕන දුකක් ඉහිලීමට තරම් ශක්තිමත් මනසක් හිමිය. ගල්වලේ වැඩට ගොස් අවුරුද්දක් විතර වන විට සිරිමලී කුසට ආවේ සුමනපාලට මා කෙරෙහි තව තවත් ආදරය උතුරද්දිය. ඔහු එදා පටන් මා ගෙදර තබා ගල්වලේ වැඩ වලට අමතරව හවස් යාමේ එළවලු වගාවක්ද ඇරඹීය.

සිරිමලි නම මෙන්ම මලක්මය. රෝස පෙති කම්මුල්, දිගටි ඇස්, අනාගතයේ අප දෙදෙනාට තව විශාල අවදානමක් ඇති බව පසක් වුනේ ඇයද ගැහැනියක් නිසාවෙනි. ඇගේ හුරතලය සහ වාසනාව අපට යම්තාක් අඩියක් මේ දුප්පත් පැලෙන් ඉදිරියට ඒමට හැකිවිය. ගල්වලේ වැඩට තවමත් යන සුමනේගේ එළවලු වගාවට මම සාත්තු කළේ මලී කෙල්ල යන්තමින් ඇහැ පියාගත් විටය. අනේ හරි අපූරුවට එළවලු ගසුත් පීදුනා. ඒ නිසාම සුමනේගේ පොකට්ටුවත් යම්තම් මුදල් පිරුනා. දැන් අපි සතුටින් ජිවත් වෙන පුංචි පවුලක්.

අතීතයෙන් මිදුන මම හනිකට ඉතිරි ටිකත් ගෙවා ගෙදර සේන්දු වන විට හවස හයට පමණ ඇති. අද කෙලී ගෙදර එන දවස නොවේද. පලා ටික මැල නොවෙන්නට වතුර ටික දමා එතනින් හොදම කංකුන් මිටක් තෝරා ගෙන පොඩි එකාට හොරෙන් හංගලා තිබ්බ බිත්තරයත් සමග තෙල් දමා ගෙදර තිබුණු අවසාන හාල් හුණ්ඩු දෙක ලිපේ තබා සුපුරුදු කාර්යයට මුල පිරීමට ගියෙමි. අනේ මගේ සුමනේ හොදටම නින්ද ගොසින්. ඉස්සර තිබුණු ප්‍රතාපවත් ශරීරය අද පරඬලක් වගේ, ඇටකෝටු ගැසුණු පපුව හිමිට අත ගෑවේ ඔහු අමාරුවෙන් හුස්ම ගන්නා නිසාය. මගේ ඒ ස්පර්ශයට සෙමින් සෙමින් ඇස් ඇර බැලුවේ කොල්ල කාලයේ වගේමයි. අනේ, තාමත් ඒ ඇස්වල ආදරය එහෙමමයි.

*"නෝනේ ගෙදර ආවදා? අනේ ඉතින් නෝනේ මං නිසා විදින දුක. මට සමාවෙයන් මගේ නෝනා."*

*"අනේ සුමනේ හැමදාම ඔය බණේ කියනවනේ. මගේ මහත්තයා මං බත් ලිපේ තිබ්බා, ඉදුනාම අපි බත් ඩිංගක් කල ඉමුකො."*

*"නෝනේ අද කෙලීත් ගෙදර එන දවස නොවැ. එකී දැන් හරි වෙනස් නොවැ."*

*"ඇයි සුමනේ?"*

*"බලපන්කො තියෙන ලස්සන. ඇස්වහක් නම් වදින්න එපා. ගමේ උන්ගේ ඉරිසියාව ඕකිට. විස්ව විද්‍යාලයෙත් ඉන්න ලස්සනම එකිත්, එකී වෙන්න ඇති නෝනේ."*

*"අනේ ඔව් මහත්තයෝ. සීදේවිකම වැක්කෙරෙනවා "*

*"ඒ වගේමයි බං ආඩම්බරේ. ගියවග ඇවිත් මාව බලන්න වත්ආවේ නෑ මේ කාමරේට. එකිටත් වැඩ ඇති නේද බං? මට නම් කටහඬ ඇහුනත් හිත පිරෙනවා."*

*"අනේ ඇයි දන්නේ නෑ සුමනේ, ඊයේ හදිස්සියේම ගෙදර එනව කියලා ටෙලිග්‍රෑමයක් එවල තිබ්බා. මට නම් බයත් හිතුනා මහත්තයා. මේ එක නෙමෙයි, කෝ පොඩි එකා?"*

*"උදේ ඔය බැරි බැරි ගානේ ඇවිත් තේ ටික පොවලා ගියේ නෝනේ. වත්තේ වෙන්න ඇති. ඕකා ඉතින් පොතක් පතක් අල්ලනවා කියලද?"*

*"මං ගොහින් බලලා එන්නම් මහත්තයා. බත් එකත් හරි ඇති."*

වත්ත පහලට ගොස් එබිකම් කර බැලුවද පොඩි එකා පෙන්න නැත. *"පොඩි එකෝ... මගේ පොඩි එකෝ..."*

*"ඕ... ඕ... අම්මා ගෙදර ආවද. ඉන්ට මම එන්නම්."*

ලීක්ස් පැල අස්සෙන් එබිලා කෑ ගසද්දී මගේ බඩ පපුව දාල යනවා. කොමත් පොඩි එක දකිද්දී මේ අම්මා කොහොම ඉවසන්නද? සිරිමලී කෙල්ලට අවුරුදු හයක් පමණ ගිය පසු කුසට තවත් දරු පැටියෙකුගේ බැල්ම පැමිණ ඇති බව කී පසු සුමනේගේ දෑස් දිලිසුන අයුරු මට තාම මතකය. සුමනේ ටිකක් එදා මගේ ඇස් දිහා බලන් ඉදලා මොකුත් නොකියම ගෙදරින් ගියේ අපේ එවිට තිබූ මෝටර් සයිකලේ නැගී කුරුල්ලෙකු මෙනි. එළවලු වගාවෙන් ලැබුණු ලාභය හමුවේ, අපි දෙදෙනාම ගල්වලේ රැකියා අත්හැර සිටි කාලයයි ඒ.

*"මේ පාර කොල්ලෙක් නෝනේ, ඕන් බලන්නකෝ බොරු නම්."*

සුමනේ හැමවෙලේම මා සතුටින් තැබීය. එදා කොල්ල ලෝකෙට එනකොට මට ගොඩක් අමාරු වුනා. ටවුමේ ඉස්පිරිතාලෙට මාව ගෙනිච්චේ පහළ වත්තේ ගුණපාල රාළහාමිගේ මොටෝ රියෙන්මයි. අනේ අපේ සුනන්ගුවට අර පොඩි එකාගේ කකුලත් අතකුත් අමුතු වෙලා තිබුනේ. අපි දෙන්නගෙම විතරක් නෙමේ, වටේ හිටිය හැමෝගෙම ඇස් වල කඳුළු. සුමනේගේ අතේ රස්නෙට ගුලිවෙලා ඉන්න අහිංසකයාගේ හිසට හාදුවක් දුන් සුමනේ, මගේ ලඟින් පුතු තැබීය. *"අනේ මේකා බඩගින්නේ නෝනේ, කිරි ටිකක් දෙන්ට නේ."* ඇස් වල කඳුළු පිසගත් මම පොඩි එකා ආදරයෙන් තුරුල් කරගෙන කිරි දුන්නා.

*"අම්මේ"*

*"අනේ උබ ආවද මයේ එකෝ, මම කියල තියනවනේ කොරටු ගානේ යන්ට එපා කියල. තාත්තා ගාවට වෙලා ඉන්න එපැයි පුතේ."*

*"ළඟ හිටියේ අම්මේ. තාත්තට නින්ද ගියාම කම්මැලි නිසා මේ කොරටුවට ගියේ. මේ පාර යස අගේට මාළුමිරිස් ටික හැදිලා අම්මේ. මං නේ ඕවා පැල කරේ."*

*"අනේ ඉතින් පොඩි එකෝ, අපි ඇඳුමක් ගමුකො මේ පාර."* ඇස්වල කඳුළු සඟවමින් මම කථා කරේ හරි අමාරුවෙන්. *"මට මොන ඇඳුම්ද අම්මේ, තාත්තගේ අර පාමසි බේත් ඕකෙන්වත් ගමු අම්මේ. හරි බඩගිනි අම්මේ."*

*"වරෙන් ඔය අත පය සෝදන්, මම තාත්තටයි උඹටයි කවන්නම්, අක්කා තවම නැති හැඩයි. එක්කෝ වරෙන්කො බං කහට උගුරක් උඹට හදල දෙන්ට. අක්කට හරියට කෑමක් වත් නෑ නොවැ බං එහෙ. ආවම අපි කමු හොඳට. මං උඹට ආදරෙන් කවලම් කරලා කවන්නම්කො මගේ පුතේ."*

*"හරි අම්මේ"*

අනේ පව් මේ අසරණය අපි නැති කාලෙක කෙලීගේ පිහිට තමා. කෙලීට නම් කොල්ල හරි ආදරෙයි. එත් කෙලී,

*"අම්මා මං ආවා. බත් බෙදන්න හරි බඩගිනි." " අනේ උඹ ආවද මයේ කෙල්ල, ඇඳිලා ගිහින් නොව උඹ. එහෙ කන්ට බොන්ට නැද්ද බං."*

*"අනේ අම්මේ බඩගිනියි. මං මේ මහන්සි වෙලා ඇවිත් ඉන්නේ. කන්නේ බොන්නේ අම්මා එවන සොච්චමෙන් තමා."*

*"හිටින්න මං බත් බෙදලා දෙන්නම්."* බත් ටිකක් යහමින් බෙදා කංකුන් වල තිබු බිත්තර ටිකක් තෝරා කෙලීට බත් ටිකක් කවන්නට ගියේ මම, *"කෝ වරෙන් බත් ටික කවන්න, හැමදාම මේම නෑ නොවැ." " අනේ අම්මේ, මගේ අත පය හොඳට තියෙනවා. මට කන්න පුළුවන්. බලන්න අම්මගේ හැටි, ඔය ඇඟ සෝදන් හොඳ ඇඳුමක් දාගෙන අර මල්ලිටයි, තාත්තටයි කවන්න. මං කන්නම්."*

ඇස් වලට ආපු කඳුළු හැට්ට කෙළවරෙන් පිහගත්තේ කවුරු හරි දකී කියල. ඒත් බඩගින්නේ කුස්සිය මුල්ලට වෙලා හිටිය පොඩි එකා දැක්කා. *"අනේ අම්මේ කවන්නකෝ, හරි බඩගිනියි, අපි තුන්දෙනාම මේ ඉතිරි ටික කමු."*

*"මට බඩගිනි නෑ මගේ පුතේ."*

*"එහෙනම් මටත් එපා. අම්මගේ ආදරෙන් ඇනුවම මේ බත් ටික හරි රසයි අම්මේ. අපි කමු තාත්තත් බඩගින්නේ, බේත් බොන්නත් එපැයි."*

බත් කාලා උණුවතුර ටිකකින් කකුල තවා ගත්තේ හෙටත් උදෙන්ම ටවුමට ගොස් පලා ටික දිය යුතු නිසාවෙනි. පොඩි එකාත් පැදුරේ කොනේ නිදි සීතලේ චිත්තේ අස්සේ, හෙට මේකාට කමිසයක් ගෙන්න ඕනි. පව් පපුවට සීතලයි. *"අම්මේ මේ"* කෙලීගේ සද්දෙට කල්පනාවෙන් මිදුණු මම පොඩි එක දිහා බැලුවේ අනේ එකා ඇහැරුනද කියලා බලන්න.

*"ඕ කෙල්ලේ කියපන්, උඹ කලබලේ එනවයි කිව්වම මම බය වුනා බං කරදරයක්වත්ද කියලා."*

*"කරදර නම් තමා අම්මේ, මට නෙමේ රටට. ඇයි අම්මලට ආරංචි නැද්ද?"*

*"රටට ඇයි මොකක්ද බං, අයේ බෝම්බයක්වත් ද? ඕවා අපිට කොහෙන් ඇහෙන්නද බං, කොහෙද මේ ඉටිපන්දම් එළියෙන් රේඩියෝ වැඩ කරනවා කියලයි."*

*"නැ නැ අම්මේ, අනේ මන්ද අම්මලත්, කොරෝනා කියල පිටරටින් ආපු ලෙඩක් හැමතැනම පැතිරෙනවලු. ඒ නිසයි අපිත් මේ කලබලේ ගෙදර එව්වේ. රට ඉදන් ආපු අයගෙන්ලු හැදෙන්නේ. අපිට නම් ඕව හැදෙන්නේ නෑ අම්මේ, අපේ කවුරුත් රට නෑනේ."*

*"මොකක් කෙලී, ඉතින් අර වසූරිය වගේද ඔය ලෙඩෙත්? බයේ බෑ තාත්තයි මල්ලිත් අසනීප කාරයෝ නේ."*

*"අපෝ නෑ අම්මා... හෙම්බිරිසාව, කැස්ස, උගුරේ අමාරුව වගේ තම රෝග ලක්ෂණ. දැන් හැමෝම මාස්ක් පාවිච්චි කරන්න ඕනේ, නැත්තම් පොලිසී තමා."*

*"මාස්ක් කිව්වේ බං, ඕක මේ අපි හැමෝම දාන්න ඕනෙද?"*

*"නහය, කට වැහෙන්න රෙදි කැල්ලක් වගේ දෙයක් අම්මා."*

*"ඉතින් බං තාත්තා කෝමැයි ඕවා දාන් ඉන්නේ?"*

*"නෑ අම්මේ ඒම ඕනේ නෑ, කොහේ හරි එලියකට යද්දී තමා ඕක ඕනි වෙන්නේ. අනික අම්මේ අත් එහෙම හොඳට පිරිසිදුව තියාගන්න ඕනි බස් වල ඒම යද්දී."*

*"භයානක ලෙඩක්ද බං ඕක?"*

*"ඔව් නැතිව අම්මේ, මැරිලා තමා නවතින්නේ. හොඳ වෙන අයත් ඉන්නවා."*

*"අනේ හෙට මට ටවුමට යන්නත් ඕනේ, මොක්ස් ද මාස්ක් ද එකක් මට නෑ නොවැ. ඕවා හරි ගණන්ද බං?"*

*"අයියෝ අම්මා, ලේන්සුවක් ගැටගහන් යන්ට. හැබැයි ඕන් ලෙඩ නම් හදන් එන්ට එපා. අම්මා පරිස්සම් වුනේ නැත්තම් අපිත් අනතුරේ. අපි නිවාඩු කාලේ යන්න දා ගත්ත ට්‍රිප් යන්න වෙන්නෙත් නෑ. ඊළගට කන්දකාඩු තමා මට යන්න වෙන්නේ ඔයාලා තුන්දෙනා එක්ක."*

*"මොකක්, කොහෙද බං තුන්දෙනාම යන්ට වෙන්ව කිව්වේ? අනේ හොදයි බං. ලඟදි හතරදෙනා පන්සලට වත් ගියේ නෑ නොවැ. ඒත් බං තාත්තයි මල්ලි එක්කන් ඕවයේ යන්නේ කොමද බං?"*

*"අයියෝ අම්මේ, ආසාවෙන් යන්න පුළුවන් තැනක් නෙමේ එහෙ. එහෙ ගිහින් අපි නිරෝධායනය කරනවා. ඒ කියන්නේ තනි තනියෙන් තියලා, අපිට කොරෝනා තියෙනවද කියලා එහෙ ඉන්න අය බලනවා. ඒත් ඉතින් නිකන් හරි අපිට කොරෝනා තියෙනවා කියල ඔප්පු වුනොත් අපි ඉවරයි."*

*"අනේ කෙල්ලේ, බය හිතෙනවා නොවැ බං. හෙට ටවුමට යන්න ඕනේ, පලා ටික විකුණන්න. ගෙදර හාල් පොල්වත් නෑ බං."*

*"අනේ අම්මේ හැමදාම නෑනේ අම්මලාට. මං ලියලා දෙන්නම් කොලේක, මට ඒ වර්ගෙන් මාස්ක් එකක් ගෙන්න. මට අනිද්දා ගමනක් යන්න තියෙනවා."*

*"මේ ලෙඩ අස්සේ උඹ ඇවිදින්න තියාගත්තේ, මෙන්න මෙහෙ ගෙදරට වෙලා හිටු. මං කන්න බොන්න දෙන්නම් උඹලට."*

*"මං නිදාගන්නවා අම්මේ."*

පැදුරු කොනේ ඇලවුණු මම පොඩි එකාගේ ඔලුව අත ගගා කල්පනාවේ හිටියේ මේ අලුතෙන් ආව කොරෝනාවක් ගැන. දවසක් හැර දවසක් ටවුමට යන්නේ මුන්ට කන්ට හාල් ටික ගන්න අර පලා ඩිංගිත්තක් හරි එළවළුවක් හරි දීලා. ඒත් දැන් කෝමද සැරින් සැරේ ටවුමට යන්නේ. මට නම් ඕව හැදුනත් කාරී නෑ. ඒත් මේ අහිංසකයෝ, ඒක හරි වේගෙන් බෝ වෙනවලු නේ. ඒ මදිවට අර මාස්ක් ද මොකක්දොත් දාන් යන්නලු. ආ... අනේ හෙට සුමනේ ගේ බෙහෙත් ටික ගන්නත් ඕනි. හෙට උදේම මාළුමිරිස් ටිකත් කඩන්න යනවා. නැත්තම් මේ ඔක්කොම ගන්න පලා සල්ලි මදි. අනේ මයේ පුතේ උඹට කමිසයක් ඊළග සැරේ වත් මම අරන් දෙන්නම්. හිතින් කීවාට උඹට එය ඇහෙන්නට මම කිවේ නෑ. ඇහුනත් උඹේ හිතේ හයිය මං දන්නවා නොවැ පුතේ. අපි මේ ටිකේ පරිස්සම් වෙමු මගේ පුතේ. ලේන්සුවක් ගැට ගහන් යන්න කීවට කෙලී, මං ගාව කොහෙන්ද බං ලේන්සු. සුසුමක් පිට කර තදින් ඇස් වහ ගත්තේ දැන්වත් නින්ද එයි කියා සිතාය. ඇගේ අමාරුවටද මන්දා, හිතේ අමාරුවටද මන්දා, පාන්දර යනතෙක් මට නින්ද ගියේ නැත. කොරෝනා කොරෝනා හැමවෙලේම මට මතක් වුණා.

පාන්දරම අවදිවෙලා රොටියක් හදලා සුමනේ ලගට ගොස් ඔහුගේ ඔලුව අතගාල මං වත්තට බැස්සේ මාළුමිරිස් ටික කඩන්න. ඒත් පිටුපසින් එන සද්දෙට මං මේ බැලුවේ, අනේ පොඩි එක අමාරුවෙන් හිමීට හිමීට කහට වැටිච්ච දත් පෙන්නලා හිනා වේවී එනවා මගේ උදව්වට. අනේ මේ කොල්ලා නම්, ඇයි දෙවියනේ මේ අහිංසකයාට මෙච්චර දඬුවමක් දුන්නේ.

*"ඇයි මයේ පුතේ උඹ ඇහැරියේ, තව ටිකක් නිදාගන්න එපැයි. උඹට මම කහට උගුරක් හදල දෙන්ටද?"*

*"එළවලු ටික කඩන් ඇවිත් රොටි කකා කහට බොමු අම්මේ."*

*"උඹ රොටි හදනකොටත් ඇහැරිලද මයේ පුතේ?"*

*"ඔව් අම්මේ, පුසුඹ ආව නාහෙට, මං අම්ම උයනවා අහන් හිටියේ, අම්මා පැදුරෙන් නැගිටිද්දීම මට ඇහැරෙනවා මයේ අම්මේ. දැන් ඉතින් අපි යමුද නැත්තම් තවත් පරක්කු වෙනවා."*

දැන් ඉතින් මොනවා කියලවත් මේකා නවත්වන්න සක්කරයටවත් බෑ. යමන් මයේ පුතේ. හනි හනිකට කොල්ලා එක්ක එකතු වී මාළුමිරිස් ටික කඩාගත්තා. මාළුමිරිස් ටික දැකපු කොල්ලාගේ ඇස්වල කඳුළු. මේ එකාගේ දුක් මහන්සියනේ. මම ඔලුව අතගාල කිවේ, මං පුතාට මොනාහරි ගේන්නම් කියලා, මොකුත් එපා අම්මේ, තාත්තගේ අර බේත ගෙන්න මතක් කරලා. අනේ ඇගෙන් වැඩිලා නැතිවට මේකාගේ මොලේ නම්, පව් මගේ අහිංසකයා. *"යන් පුතේ මම ටවුමට යන්නත් එපැයි."*

නිවසින් එලියට පැමිණියේ පලා මල්ල හිසට ගෙන අත් දෙකෙහි මාළුම්රිස් මලු දෙකද රැගෙනය. දැන් මට මෙය හොදට පුරුදුය. ටික දුරක් යද්දී, *"අම්මේ අම්මේ,"* අනේ මගේ පොඩි එකා , නොන්ඩි ගගහා එනවා, *"මොකද මයේ පුතේ මෙම අමාරුවෙන් අවේ? උඹට එනකොට මොනා හරි ගෙන්න ඕනෙද?"* කලිසම් සාක්කුවෙන් හිමීට ගත් ගුලියක් මගේ ඇස් ඉදිරිපිට තැබුවේ අම්මා පරිස්සම් වෙන්න එපැයි කියලා. අනේ මේක මෙච්චර දුර ඇවිත් තියෙන්නේ, ලේන්සුවක් දෙන්න. ලේන්සුවක් කීවට ඒ වගේ රෙදි කැල්ලක්. *"අනේ මගේ පුතේ."* මට ඉනු කඳුළු පිස දැමීමට නොහැකි වුයේ අත් දෙකේම මලු නිසාවෙනි.

*"කෝ අම්මේ ඉන්න මම මේක ගැට ගහන්නම්."* මම දන්නවා කොල්ලට මේක ගැටගහන්න අමාරුයි ඒ අත් වලින්. අනේ එත් හරි අපූරුවට කොල්ල මගේ නහයයි කටයි වැහෙන්න ඒ රෙදි කැල්ල ගැට ගැහුවා. *"අනේ පලයන් පුතේ පරිස්සමට ගෙදර, අක්කා ඇහැරියාම තාත්තටත් තේ ටිකක් දීලා රොටී කාපන්."*

හන්දියට අමාරුවෙන් ආපු මට, දැන් ආපු බස් එකේ, ජනේලේ අසලම සිට් එකත් ලැබුනා. බස් එකේ මිනිස්සු මාස්ක් දාන් ඉන්න අපුරුව මං ඒ මිනිස්සුන්ට හොරෙන් බැලුවා. මගේ කොල්ලා ගෙනත් දුන්න රෙදි කැල්ල ඒ ඔක්කොටම වඩා හරි ලස්සනයි කියල මට දැනුනා. ඊයේ රෑ කෙල්ල එක්ක කියපුවා, නිදි වගේ හිටපු කොල්ලා අහන් ඉදලා. අනේ පව් මගේ අහිංසකයා. ඉපදුන දවස් වල මායි සුමනෙයි නොකල දෙයක් නෑ ඕකව හොඳ කරගන්න. තිබුණු මෝටර් සයිකලේ විකුණලා ගෙවල් ගානේ ගිහින් හිඟා කාලා හම්බ කරලත් සනීප කරගන්න බැරි වුනානේ. මොනවා වුනත් කොල්ලාගේ හිත පුදුමාකාර ශක්තිමත්. අන්තිමට අයෙත් ගල්වලේ වැඩට යන්න සුමනෙට සිද්ද වුණා. ඒ ලැබෙන මුදලෙන් කෙලීටත් උගන්නලා, පොඩි එකා හොඳ කරගන්ටයි අපි බැලුවේ. මටත් සුමනෙට උදව් කරන්න වුවමනා වුනාට, දරුවෝ දෙන්නා ගෙදර තනියෙන් තියනවාට සුමනේ කැමති වුනේ නෑ. කෙලී පොත පතේම එල්ලිලා හිටියේ, කොල්ලා ගැන නොබැලුව තරම්. ඒත් කවදාහරි කෙල්ල ඉගෙනගෙන කොල්ලා හොඳ කරයි කියල මම විශ්වාස කළා. කළා නෙමෙයි තාමත් කරනවා. වෙලාවකට කෙලී පාඩම් කරන දිහා පොඩි එකා ඇස් ලොකු කරන් ලඟට වෙලා බලන් ඉන්නවා. කෙල්ල එතකොට බැනල මේකව එලවගන්නවා. අනේ මේකා, වචනයක්වත් කියන් නෑ මගේ ඔඩොක්කුවේ ඔලුව තියන් නිදාගන්නවා.

කෙලී කියපු මාස්ක් එකයි, සුමනේගේ බේත් ටිකයි, කොල්ලාට ඇපල් ගෙඩියකුයි අරන් බස් එකට විතරක් සල්ලි තියන් ඉතිරි සල්ලි වලට ගෙදරට ඕනි හාල් පොල් ටික ගත්තා. වෙනදට වඩා හාල් පොල් ටිකක් වැඩිපුර ගැනීමට පුළුවන් වුණා, කොල්ලාගේ මාළුම්රිස් වල පිහිටෙන්. නැතත් මේ දවස් ටිකේ කෙලීත් ගෙදර නොවැ. ඒකිට ටිකක් හොඳට කන්ට දෙන්ට එපැයි. හෙට අනිද්දා ඇඳිරි නිතිය දානවා කියල කඩේ මුදලාලි තව තවත් බඩු ගන්න කීවත් කොහෙද ඕවට මා ගාව කාසි. අනේ ඇඳිරි නීතිය දැම්මොත් මං මුන්ට කන්න දෙන්නේ කෝමද? දවසක් හැර දවසක් සොයා ගන්නා පලා මිට විකුණන්න ටවුමට එන මම, කොහොමද මාස ගණන් කන්න බඩු ගෙනියන්නේ? කොලුවාගේ එළවලු වලට පින් සිදුවෙන්න සතියකට විතර මේ හාල් පොල් ටික නම් ඇතිවෙයි. ඒත් ඊටපස්සේ, කෙලී කිව නේද අර කොහේදෝ ගිහින් දානවය, කන්ට බොන්ට දෙනවා යස අපූරුවට කියලා. ඒත් ඒකට අර ලෙඩේ මොකක්ද කොරෝනාද කොහේදෝ හැදෙන්න එපැයි. කන්ට බොන්ට දුන්නත් මොන තරම් අවධානමක්ද? ඕක හැදිලා අර තුන් දෙනාට මක් හරි වුනොත්... අනේ මටත් විකාර, පොලිසියේ

මහත්තයලා නම් කිව්වේ ඇවිදින්නේ නැතිව ගෙදරට වෙලා පවුලේ අයත් එක්ක ඉන්න කියලා. ඒත් පලා හොයන්න ගම වටේ නොයා මම සල්ලි හොයන්නේ කෝමද? කෙල්ලයි කොල්ලයි කතා කරන් එළවලු ටිකට හොඳට සාත්තු කරන්න තමා වෙන්නේ. වට්ටි ටිකක් වියන්නත් පුළුවන්. ඒත් මිනිස්සුන්ට මේ කලබලේ සල්ලි හරි අඩුපාඩුයි කියල මූණ දැක්කම පේනවා. උන් ඔක්කොම බලන්නේ බඩ කට පුරවගන්න, මොන හරි අරන් ගිහින් ගෙදර පුරවගන්න. හරියට තරඟයක් වගේ. අනේ ඉතින් අපි වගේ අහිංසකයෝ ඔය තරඟ වලට නෑ ඕන්. කනකර බඩු ටික උකස් කරලා හරි බලන්නේ ගෙදරට බඩු ටික ගෙනියන්න මේ මිනිස්සු. කෙලීගේ කනේ විතරක් රිදී අරුංගල් දෙකක් තියෙන අපේ වගේ ගෙවල් වල උදවියට හැක්කේ, බලා හීල්ලීමට විතරයි.

අඳුර වැටීමට මොහොතකට පෙර ගෙදරට ලඟා වනවිට පොඩි එකා මඟට ඇවිත් හිටියා. *"අනේ මොකද පුතේ බඩගිනිද උඹට, මගට ආවේ? තාත්තයි අක්කයි බලන් ගෙදරට වෙලා ඉන්න එපැයි."*

*"නෑ අම්මේ කළුවර වැටෙන නිසා අම්මගේ තනියට මගට ආවේ අම්මේ, තාත්තගේ බේත් ගත්තද අම්මා?"*

*"ඔ් පුතේ, සතියකට ගත්තා. මගේ පුතා නිසා තමා ඕන්. පුතාට ඇපල් ගෙඩියකුත් ගත්තා. පුතාට කියන්න පුතේ දැන් ටවුම හරි වෙනස් බං, මිනිස්සු ලඟට එන්නෙත් හරි බයෙන්, පලා ටික බොහොම අමාරුවෙන් විකුණා ගත්තේ. මාළුමිරිස් ටික මුදලාලිට දෙනකොට, පලා ටිකත් සොච්චමකට දෙන්න වුනා පුතේ. මක් කොරන්නද. මිනිස්සු මේ මුහුණට අර මාස්ක් ගැට ගහන් ඒම ඈතින් ඈත වේගෙන් එහාට මෙහාට යන්නේ හොරකමට ඇවිත් වගේ. සමහර තැන් වල අත් හෝදලා මිසක් ඇතුලට ගන්නෙත් නෑ බං, ඔය ලොකු ලොකු තැන් වල ඒම."*

*"ඉතින් අම්මට මාස්ක් එකක් ගතේ නැද්ද? ඒවා ගණන් ද අම්මේ?"*

මුහුණට සිනහවක් නගාගත් මම මාස්ක් ගැන පුතාට කියන්න හැදුවා විතරයි,

*"අයියෝ අම්මේ ගේ ඇතුලට එන්න එපා. ඈතට යන්න ඈතට යන්න."*

*"මොකද කෙල්ලේ මේ?"*

*"අයියෝ අම්මේ, ටවුමට ගිය නේද? දැන් හොඳට සෝදාගෙන ගේ අස්සට එන්න. අනේ අනේ මේ මෝඩයත් ගිහින් නේ, යනවා අම්මා එක්ක ගිහින් සෝදන් එන්න. කෝ අම්මේ මගේ මාස්ක් එක දෙන්න, ඒකද බලන්න."*

කෙල්ලට බෑග් එක දීලා බැලුවේ මෙතරම් දුර ඇගේ ඇලි ඇලී සිටි පොඩි එකා කොහෙට ගියාද කියල, අනේ ඇස් වල කඳුළු පිහද පිහද මේකා යනවා හෝද ගන්ට. කොච්චර ශක්තිමත් වුනත් මූ හරි අහිංසකයා, අමාරුවෙන් හෝදගන්නවා. මං ලඟට ගිහින් කොල්ලවත් නාවල, හොඳ හැටි නාගත්තම පුදුම සනීපයක් ඇඟට දැනුනේ. සුමනේට ටවුමේ වුන දේවල් කියන්නට තේ කහට එකක් හදන් ලඟට ගියා.

*"මහත්තයා දවල් කාලා තේ බීවද?"*

*"ආ නෝනා ඇවිත් අද නාලා, මං බැලුවා පුසුඹ මොකෝ කියලා. ඔව් නෝනේ කොල්ල ඇවිත් පොවලා ගියා."*

*"අනේ මහත්තයා, ඌ නිසා තම මම සැනසීමෙන් කොහේ හරි ගිහින් එන්නේ. උගේ අර බේත් ටික ගන්න දැන් ඉතිරි කරපු දෙදාහක් විතර මගේ ළඟ ඇති මහත්තයා, අපි අයෙත් යමුද වෙද මහත්තයා ලඟට. ඒ මහත්තයා කිව්වා නොවැ කොල්ල හොඳ කරන්න පුළුවන්ය කියලා."*

*" අනේ ඉතින් නෝනේ, මං මේ අහිතකට කියනවා නෙමේ. කොල්ලාට හයි හත්තිය තියෙනව, ඒ නිසා ඕකා හොඳ උනත් අපි ඇහැක් වගේ බලාගයි. කෙල්ල ඉතින් අපිව බලාගනියි."*

දවසේ මෙමහෙවර අවසන් කර පැදුරට වැටුනේ අදනම් වේලාසන නිදාගත යුතු යැයි සිතමිනි. කොල්ලා උකුලේ සැපට නිදි. ඒත් කෙල්ල, කාමරේ එහාට මෙහාට ඇවිදින බව සාරි පොටෙන් දැමූ රෙද්දෙන් යන්තමින් පෙනුනා. ඒ නිසා හිත නිදාගන්න නොදුන්නේ යම් අමුත්තක් හිතට දැනුන නිසා. නමුත් කාමරයට යාමට තරම් ශක්තියක් අම්මාට නොවේ පුතේ, ඇයි ඉතින් මේ කෙලී කියන හරප් වචන හදවතට කඩුවකින් අනිනවා වගේ, හරි වේදනාවයි. පොඩි කාලේ කටකාරකමට කථා කරද්දී ආදරේට පිරුණු කඳුළු අද වේදනාවට එනවා. හීනෙන් පෙනුනෙත් කෙලී. අනේ මන්දා මොකක්ද නපුරක් දැනෙනවා. වෙනද නැති ගතියක්.

උදෑසනම ඇහැරුනා වෙනද පුරුද්දට. තම ඇඳිරි නීතිය දාලා නැතත් කොරෝනා නිසා එලියට බහින්න හිතකුත් නෑ. කේතලය ලිපේ තියලා හිතුවේ මේ දවස් වල කෝමද සල්ලි හොයා ගන්නේ කියලා. ගේ හරියේ ඇත්තේ රුපියල් පන්සීයක් විතර. එක ඉතින් දවස් දෙකකටවත් තමා.

*"අම්මේ අම්මේ රුපියල් දාහක් දෙන්නකෝ."*

*"මොකක්! දාහක්? කොහේ තියන සල්ලිද බං? ගේ හරියේ සල්ලි නෑ. මං මේ හිස ගිනි අරන් ඉන්නවා, උඹ මේ විකාර කියවනවා. ඔක්කොටම කලින් උඹ කියපන්, මේ නැට්ට ගිනිගත්ත හනුමන්තා වගේ දුවන්න යන්නේ කොහෙද ඒ රටම ගිනි අරන් තියෙන වෙලේ?"*

*"අයියෝ අම්මේ, ඔය කොරෝනා අපට හැදෙන් නෑ. මේම නිවාඩු කොහෙද අපට කැම්පස් එකේ ඉද්දි, අපි ට්‍රිප් එකක් යන්න ලෑස්තියි. මේ ඒ පැත්තේ කොරෝනා නෑ අම්මේ. වෑන් එකක යන්නේ, ප්‍රශ්නයක් වෙන්නේ නෑ. දාහක් දෙන්න අම්මේ පරක්කු වෙන්වා."*

*"මෙන්න මෙහෙ හිටහන් කෙල්ලේ, ඇවිදින්න බැරියැ පස්සේ. දැන් ඇඳිරි නීතිය දැම්මොත් උඹ ගෙදර එන්නේ කෝමද? හොඳ කෙලී වගේ හිටපන් මයේ කෙල්ල ගෙදරට වෙලා."*

*"අනේ අම්මේ සල්ලි ඕනි නෑ. මම යනවා. හන්දියට දැන් ඇවිත් ඇති යාලුවෝ, මං එද්දී දවස් දෙක තුනක් යයි."*

*"අනේ කෙල්ලේ..."*

මේකි ගස්සන් ගෙදරින් එලියට යාමට ගියේ විනාඩි කිහිපයකි, ඊයේ දැකපු හීනත් එක්ක හිතට හරි බයක් දැනුනා. *"නෝනේ, නෝනේ"*

*"ඕ මහත්තයා මොකද මේ දාඩිය දාලා, මහත්තයා ඔයාට අමාරුද? ඇයි මහත්තයෝ මේ."*

*"අනේ නෝනේ, කෙලී... කෙලීට එන්න කියපන්, මට එකී බලන්න ඕනේ!"*

*"අනේ මහත්තයා, එකී මේ දැන් කොහේදෝ ගියා මහත්තයා. මොකෝ වුනේ මහත්තයෝ?"*

*"අනේ නෝනේ, උඹේ මොලේ මැටිද බං! අර කොරෝනාද මොකක්ද ලෙඩක් කිව්වා නේද? අනේ මන්ද බයයි බං."*

*"දැන් මොනවා කරන්නද මහත්තයා. කෙලී එනකන් මග බලන් ඉමු."*

කෙලී ගිය වෙලේ ඉදන් බත් කටක් ගිලින්නට හිතට ඉස්පාසුවක් නෑ. එත් කොල්ලාටයි සුමනේටයි බත් ඩිංගිත්තක් කවන්න එපැයි. ගල්වලේ වැඩ කරන කාලේ සුමනෙයි කෙලියි යාළුවො වගේ. මල්ලිව නැව්වෙත් කැව්වෙත් කෙලී තමා. ඒත් සුමනේ ගල්වලේ වැඩ කරද්දී ඒ වෙඩි බෙහෙත් වලට ආපු ගලක් සුමනේගේ කකුලට වැටුනේ සුමනේ ඇඳටම සිමා කරමින්. එදා ඉදන් කෙලී සුමනේගේන් ඈත් වුණා. සුමනෙට එක වේදනාකාරී වුනත් කාමරේටම කොටු වුන ජීවිතයක් ගෙවන්න සුමනේ පුරුදු වුණා. දැන් මේ අවුරුදු දහයට කෙලී වචන දහයක් තාත්තා එක්ක කථා කරලා නැතුව ඇති. වෙනස් වුන එකම දේ සුමනේගේ හැඩි දැඩි සිරුර ඇඳටම දියවීම පමණයි.

දින දෙකක් ගත වූ පසු හිතට සැනසීමක් ලගා වුනේ කෙලී ළඟදීම අද හෙටම ගෙදර එන බලාපොරොත්තුවයි. මෙතුවක් කල් වේල් දෙක තුනක් මම ගිල්ලේ. සුමනේටයි කොල්ලටයි බත් ටිකක් කෝම හරි කවා ගත්තා. අද නම් කෙලී ගෙදර එන්නම ඕනි. කොරෝනා නිසා පස් දෙනෙක් විතර මැරිලා ලු. අනේ මන්දා ලෝකේ ගොඩක් මිනිස්සු මැරිලා ලු. කෙලී ගැන ආරංචියකුත් නෑ. හිතට දැනෙන අමුත්ත නම් තාම එහෙන්මයි. මේකී කැම්පස් ගියාම මුරණ්ඩු කම එන්න එන්නම වැඩි වුණා මිසක් අඩු වුනේ නෑ. ගෙදරට ආපු වාහනයක් නතර කරා ඇහුනා. මම දිව්වා නෙමේ ගිය විදිය මතක නෑ. මොකක්! ඇම්බියුලන්ස් එකක්. අනේ දෙයියනේ, මේ මොකක්ද? කිසිම හැඟීමකින් තොරව, ඇස් පිය ගසන්නේ නැතුව බලන් හිටියේ මොකක්ද මේ වෙන්නේ කියලා හිතාගන්න බැරිව. හඳට යන්න වගේ මුළු ඇඟම වහගත්ත මිනිස්සු වගයක් ගේ දිහාවට එනවා. මේ කවුද? අනේ මන්දා ඇයි මේ අපේ ගේ දිහාවට එන්නේ? කෙලී වාහනය ඇතුලේ ඇති. කකුල ඉක්මන් කලේ වාහනේ ලඟට දුවන්න හිතන්,

*"නෝනා, ටිකක් ඉන්න අපිට ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕනේ"*

*"මො... මොකක්ද මහත්තයා... මගේ කෙලී කෝ?"*

*"නෝනා දුව ඉන්නේ ඉස්පිරිතාලේ. දුව කොරෝනා ආසාදිතයෙක් ලෙස අඳුනගත්තා අපි. දුව ඇවිදින්න ගිය යාළුවෝ කිහිප දෙනෙකුත් ඉන්නවා. ඒ එක ළමයෙකුගේ තාත්තට තිබුණ කොරෝනා ආසාධනය නිසා තමයි දුවට මේම වුනේ."*

*"අනික නෝනට තිබුන මේ දවස් වල දරුවාව එළියට පහළට නොයවා ඉන්න."*

*"අනේ මහත්තයෝ..."*

*"දැන් එන්න ලැහැස්ති වෙන්න් නෝනා අපි එක්ක යන්න, අපි යන්නේ මේ දුව බලන්න. තව කවුද ගෙදර ඉන්නේ?"*

*"අනේ මහත්තයා මං එන්නම්. මහත්තයයි කොල්ලයි අසනීපෙන් ඉන්නේ."*

*"හරි එන්න. අපි නෝනව අයෙත් ගෙදරට ඇරලන්නම්."*

කොල්ලට තාත්තගේ ළඟටම වෙලා ඉන්න පොරොන්දු කරගෙන හැකි ඉක්මනට වාහනයට මම නැංගේ කෙල්ලගේ ඇස් දිහා ටිකක් බලලා ඔලුව අතගාලා ළඟට වෙලා ඉන්න. ඒ රෝසපාට අත්, නිල්පාට ඇස්. අනේ මහත්තයයි, කොල්ලයි ගෙදර තනියෙන්, උන්ට කන්ටත් හරිහැටි දෙයක් නෑ. හිත නම් බෝම කලබලයි.

මාත් එක්ක ආපු මහත්තුරු, *"බැහැලා, මේ ඇඳුම ඇදන් එන්න."* ඒ මහත්තයලා ඇඳන් හිටිය වගේම ඇඳුමකින් සැරසුණු මම බැලුවේ මම කොහෙටද මේ ආවේ කියලා. මොනවා! මම දැක්කේ කවදාවත් මේ ඇස් දකින්න ඕනි දෙයක් නෙමෙයි. දුවන්න හැදුවේ ඒ දෙසට, සුදු ලෝගුව ද ගත්ත මිනිස්සු *"ලඟට යන්න එපා, ඈතින් ඉඳන් බලන්න. අල්ලන්න ලැහැස්ති වෙන්න එපා."*

*"කෝමද මහත්තයෝ අම්මෙක් මෙම බලන් ඉන්නේ, තමන්ගේ දුව මිනී පෙට්ටියක ඉන්නවා..."*

**කෙටිකතා තරගය - දෙවන ස්ථානය**

**''සුරඟන නොකියාම ගියා''**

**එස්. එම්. අවිශ්කා ලක්මිණි**

**විද්‍යා පීඨය**

************************************************************************

**කැලෑ මල්**

**අවිහිංසක හදවතක නොමැකෙන මතකයන් ලෙස...**

අපේ තාත්තා කලෙත් කුලී වැඩ, අම්මා කලෙත් කුලී වැඩ. ඒත් තාත්තා ගාව කවදාවත් සල්ලි තිබුන් නෑ. අම්මයි තාත්තයි දෙන්නමත් කුලී වැඩ කරලත් ඇයි අපිට සල්ලි නැත්තෙ කියල මම හැමදාම තාත්තාගෙන් ඇහුවා, දවස් එකදහස් එක්මිලියන කෝටියකටත් වැඩියෙන් අහන්න ඇති. එත් තාත්තා කරන්නෙ හැමදාමත් හඳේ හාවා දිහා බලාගන හිනාවෙන එක විතරයි. හඳේ හාවා තරහ වෙලා පෙනුන් නැති දවසෙ තමයි මම අන්තිමටම ඒ ප්‍රශ්නෙ ඇහුවෙ, පහුවදා උදේ තාත්තා නැගිට්ටේ නෑ. සුදු පෙට්ටියක් මැද්දෙ තාත්තා නිදන් හිටියෙ වෙනදටත් වඩා ලස්සන ඇඳුම් ඇඳගන. ඊට පස්සෙ මාමලා ටිකක් එකතු වෙලා තාත්තාව වලකට දාල වැහුවා, අම්මා නම් කිව්වේ තාත්තා දිව්‍යලෝකෙ ගියා කියලා. අදටත් මට හිතගන්න බැරි තාත්තා කොහොමද එක පාරටම දිව්‍යලෝකෙ ගියෙ කියලා. සමහර විට එදා මාමලා තාත්තාව වලට දාල වැහුවට පස්සෙ වෙන්න ඇති තාත්තා දිව්‍යලෝකෙ යන්න ඇත්තෙ.

තාත්තා දිව්‍යලෝකෙ ගිහින් ටික දවසක් යනකල් අපේ ගෙදරත් දිව්‍යලෝකෙ වගේ තමයි. හැම තිස්සෙම රස රස කෑම ජාති ගොඩක් තිබුනා. ඒ තරම් කල් කවමදාවත් මම ඒ තරම් රස කෑම කාල තිබුනෙ නෑ. කහ පාට ඇඳගත්ත සාධු ලා ඇවිත් ගියට පස්සෙ තමයි හැමදෙම වෙනස් වුනේ. ඒ තරම් කල් තිබ්බු රස කෑමක් අයෙ හම්බුනේ නෑ. එදා ඉඳන් තමයි මම සම්බෝල එක්ක මේ තරම් තරහ වුනෙ, උදේටත් සම්බෝල දවල්ටත් සම්බෝල රෑටත් සම්බෝල. දවස් ගෙවුනට එක්දහස් එක්මිලියන කෝටියකටත් වැඩියෙන් අම්මා හැමදාමත් ගෙදර හැදුවෙ සම්බෝල. අම්මගෙන් කිරිත් බීලා ගේ අස්සට වෙලා කොයි වෙලාවෙත් චූ තල තලා ඉන්න මල්ලිට මේක ගැන කිසි වගක් නැති වුනාට මට නම් මේක ලොකු ප්‍රශ්නයක්, මොකද අපි කාලයක් දිව්‍යලෝකෙ කෑමත් කැවනෙ.

තාත්තා හිටපු කාලෙ ඉඳන්ම මාව යැවුවෙ කැලෑ ඉස්කෝලෙට. ඒකෙ නම නම් වාගිරි රස්නායකපුර ප්‍රාථමික විදුහල, ඒ වුනාට කැලෑව මැද තියන හන්ද වෙන්නැති, ගමේ ඔක්කොමල වගේ කියන්නෙ කැලෑ ඉස්කෝලෙ කියලා. අත්තා මුත්තා කිරිකිත්තා ඉඳන් ඔක්කෝමලා ගියෙ කැලෑ ඉස්කෝලෙටලු. ඒ කියන්නෙ අපේ කැලෑ ඉස්කෝලෙ දවස් එක්දහස් එක්මිලියන කෝටියකටත් වඩා පරනයි. ඒ දවස් වල ඉඳලම අපි ඉස්කෝලෙට ගියෙ පයින්. අපේ තාත්තා ලග පුස් බයිසිකල් එකක් වත් තිබ්බෙ නෑනෙ අනිත් ලමයි වගේ මාව ඉස්කෝලෙ ගිහින් දාන්න. එරමිනියා ගාල් මැද්දෙන් ගොඩක් දුර පයින් යනවා, හැමදාම ඉස්කෝලෙට යද්දි පරක්කුයිලු, ඉර එලිය වැටෙන්නත් කලින් තමයි මම ගෙදරින් යන්නෙ නම්. ඒත් අපේ පන්තියේ ටීචර් හැමදාම බනිනවා. අනිත් හැම වෙලාවටම ටීචර් ලස්සනයි වගේ පෙනුනට තරහ ගියාම නම් හරි කැතයි, නිකම් යක්ශනියක් වගේ. මම බත් කන්නෙ නැතිවම අම්මා මාව ගිහින් දෙන්න හදන පහල කනත්තෙ යක්ශනිත් ඒ වගේ ඇති.

නියම් කාලෙට නිතරම වගෙ අලියෙකුත් ඉස්කෝලෙ පැත්තෙ එනවලු. අම්මා හැමදාම ඒ කාලෙට මාව ඉස්කෝලෙ යවන් නැතිව ගෙදර නතර කරගන්නවා. තාත්තා ඉන්න කාලේ නම් තාත්තා හැමදාම ඉස්කෝලෙ ගිහින් දැම්ම මාව, හූ ගානක් දුර මාත් එක්කම තාත්තාත් පයින් යනවා. එත් දැන් තාත්තා

දිවියලෝකෙ ගිහින් හන්දා හැමදාම ඉස්කෝලෙට යන්න විදියකුත් නෑ. තාත්තා හැමදාමත් කීවෙ හොඳට ඉගෙනගනින් සමන්මලියෝ කියලා, මම උබ ඉගනගෙන ලොකු නෝනා කෙනෙක් වෙනකල් තමයි බලන් ඉන්නෙ කියලත් කීවා. සමහරවිට තාත්තා දිවියලෝකෙ ඉඳන් මම ඉගනගන්න විදිය බලාගන ඇති.

අනේ මන්දා වෙනදට නම් මේ තරම් කල් මාව ගෙදර තියා ගත් නෑ. අම්ම කීවෙ නම් මොකක්ද ලොකු ලෙඩක් හන්ද ඉස්කෝලෙ උගන්නන්නෙ නැහැල්ලු. ඒත් ටික්කි නම් කියන්නෙ එයාලගෙ පෝන් එකට ටීචර් පාඩම් එවනවලු. ලියාගන්නත් ගොඩක් ජාති දුන්නලු. අපිට පෝන් නැනෙ, ඒ හන්ද ටීචර්ට ඉස්කෝලෙ වැඩ එවන්න විදියක් නැතුව ඇති. මම දවසක් ඕක ගැන ටික්කිට කියපු වෙලාවෙ එයා නම් කීවෙ පෝන් එකක් ගන්න කියලා. ටික්කිට අම්මා අලුතෙන්ම පෝන් එකක් අරන් දුන්නලු රුපියල් කාසි ගොඩාරියක් දීලා. එයාගෙ වැඩේ කොයි වෙලාවෙත් ඒක දිහා බලන් ඉන්න එක. මටත් හිතෙනව වෙලාවකට අම්මා එක්ක අපටත් පෝන් එකක් ගමු කියන්නත්, ඒත් ඉතින් මේ කලබල අස්සෙ අම්මටත් වැඩට යන්න බැරි වුනානෙ. අනේ එක රුපියලක් වත් නැතිව තුන් වේලටම කොස් පොලොස් හොයන අම්මාගේ මූන බලාගන මට පෝන් එකක් ඉල්ලන්න පුලුවනියැ. අපට ඉතින් ටික්කිලට වගේ සල්ලි ගොඩක් නැනේ.

දවසක් ටික්කි කීවෙ එයලගෙ තාත්තා වැඩ කරන්නෙ සිදාදියෙ දිසාපති කන්තෝරුවකලු, මාසෙකට ගනන් කරගන්න වත් බැරි තරම් ලොකු සල්ලියක් දෙනවලු, අතට පයට වැඩකාරයො වාහනේ එලවන්න අය එහෙමත් ඉන්නව එහෙ. එක දවසක් මම එහෙ යනකොට ටික්කි හිටියෙ රූපවාහිනීය වගේ එකක් ලග මොකක්දෝ කර කර, ටික්කි නම් කීවෙ ඒ කොම්පියුටර් එකක් කියලා. එයා එකෙන් ලස්සන ලස්සන රූප එහෙමත් පෙන්නුවා, ඒත් ටිකක් වෙලා ඉන්නකොට මැගිලින් අම්මා ඇවිත් මාව එලියට දැම්මෙ කෝටු පාරකුත් දීලමයි. මැගිලින් අම්මා හරි වසයි. මම ඉස්සර හිතන් හිටියෙ මැගිලින් අම්මා ටික්කිලගෙ නෑයෝ කියලා, ඒත් පස්සෙ ටික්කි තමයි කීවේ ඒ ටික්කිලගෙ ගෙදර උයන්න ගෙවල් දොරවල් අතුගාන්න එහෙම තියන් ඉන්න වැඩකාරය කියලා. මම කවදාවත් ටික්කිලගෙ තාත්තා දැකල නෑ, ඒත් ගෙදර වැඩ කරන මැගිලින් අම්මා මෙහෙම වස නම් ටික්කිලගෙ තාත්තා මොන තරම් වසයිද කියලා මට හිතගන්නවත් බෑ. එයාලගෙ අම්මා නම් වස නෑ. එත් හරි ආඩම්බරයි. ගෙදරට ඉන්නෙත් සාරියක් ඇඳගන, එපා වෙන් නැද්ද දන් නෑ හැමදාමත් සාරි ඇඳන් ඉද්දි. මම දවසක් අම්මාගෙ සාරියක් හොරෙන් ඇඳල බැලුවා, බුදු අම්මෝ ඒක ගලවගන්නකල් මම බොහොම අමාරුවෙන් හිටියෙ, මාව නිකම් බැඳල දාල වගේ. ඒ වෙලාවෙ ගෙදර හිටියෙ නම් අපේ අල ගෙඩිය වගේ ඉන්න මල්ලි විතරයි. එත් අම්ම කොහොම හරි දැනගෙන මම එයාගෙ සාරිය ඇන්ද කියලා. එදා නම් අම්ම හනස්සක් කැඩෙනකල්ම මට ගැහුවා, අන්තිමට වයිර පලු හිටපු කකුල් දෙකේ රැ බෙහෙත් තෙල් ගෑවෙත් අම්මමයි. අම්මගෙ කේන්තිය හරි ඉතින්. ඒක අම්මට තාත්තා අරන් දුන්න සාරියක්ලු, මම අතින් සාරිය කිලුටු වුනාම අලුත් සාරියක් අරන් දෙන්න තාත්තාත් නැනෙ.

ටික්කිලගෙ අම්මාගෙ කොන්ඩෙ ගොඩක් දිගයි. වෙල් යාය කෙලවරේ තියන කුඹුක් ලිඳෙන් නාලා කොන්ඩෙ වේලිච්ච ගමන් ඉස්මුදුනට කරල ලොකු ගෙඩියක් ගහගන්නවා. වට පිටාවෙ හැම කෙනාම වගේ එයාට කියන්නෙ ලොකු මැණිකෙ කියල. මැගිලින් අම්මා හැම තිස්සෙම කියනවා ටික්කිලගෙ අම්මාට ලොකු මැණිකෙ කියන්න කියලා. මුලින් මුලින් නම් ටික්කිලගෙ අම්මත් එහෙම කීවා. ඒත් ලගකදි ඉඳලා එහෙම කියන් නෑ. දැන් එයාගෙ කටේ තියන්නෙ උබත් පාඩම් කරපන් කියලාම

තමයි.

දවස් දෙකකට සැරයක් විතර ටික්කි මගෙ අතට එයගෙ පෝන් එක දෙනවා. ඊට පස්සෙ මම එකත් අරන් අඹ ගහට නගින්න ඕනි, නගින්න පටන් ගත්ත වෙලාවෙ ඉදන් එයා අහන්නෙ පෝන් එක මැද්දෙ තියන රවුම කැරකෙනවද නැද්ද කියලා. ඔක්කොම තියන්නෙ ඉන්ගිරීසියෙන් හින්දා මට ඒ කිසිම දෙයක් තේරෙන්නෙත් නෑ. ටික්කිට නම් එහෙම නෑ. එයාව අකුරු කියවපු දවසේ ඉදන්ම ඉන්ගිරීසි පන්ති යැවුවලු කියලා තමයි පැතුම් අයිය කීවෙ. ටික්කිගෙ අයියා පැතුම්, අපි දෙන්නට වඩා පොඩ්ඩයි ලොකු එයා. ටික්කිලගෙ තාත්තා අයියව එයාලගෙ දුර නෑදෑ ගෙදරක නතර කරාලු. අපිත් එක්ක හිටියම සෙල්ලම් කරනවා කියලා. අයියා ලොකු විබහගෙකට පාඩම් කරනවා දැන්. ශිශ්‍යත්වෙන් පාස් වුනාම එයාට ඊට වඩා ලොකු ඉස්කෝලෙට යන්න පුළුවන්ලු. ටික්කිව නම් දැන්ම ඉදන්ම ටවුමෙ ටියුෂන් පන්ති වලටත් එක්කන් යනවලු, ඉස්කෝල තියන දවස් වලට නම් ටික්කිට සෙල්ලම් කරන්න වත් වෙලාවක් නැති තරමට ඒවගෙන් ගෙදර වැඩ දෙනවලු. අපේ අම්මත් තාත්තා ඉන්න දවස් වල ඉදන්ම කියන්නෙ මට ඔය විබහගෙ හොදට පාස් වෙන්න කියලා. ඉස්සරහට බලමුකො ඕවා, තව අවුරුදු දෙකක්ම

තියනවනෙ ඔය විබහගෙට.

මම බැරිවෙලාහරි පෝන් එක මැද රවුම කැරකෙන් නෑ කීවොත් ටික්කි කියනව ඒ සිග්නල් නැතිලු. එතකොට මම තව උඩට නගිනව අඹ ගහේ. මම තවම නම් ඔය කියන සිග්නල් දැකල නෑ. සිග්නල් එකක් ගන්න සල්ලි නැතිව අපි හැමදාමත් දත් මදින්නෙ ලිපේ අගුරු වලින්, මට ගස් නගින්න පුළුවන් වුනාට මේ කියන සිග්නල් ගන්නත් අපට පෝන් එකක් නැනෙ. අඹ ගහේ ඉද්දි ආදරෙන් කතා කරන ටික්කිලගෙ අම්මා මම ගහෙන් බැස්සාට පස්සෙ ඉස්සරලාම කරන්නෙ පෝන් එක උදුරගන්න එක. ටික්කිලගෙ අම්මා වෙලාවකට පාට මාරු කරන කටසුස්සෙක් වගේ කියලත් මට හිතෙනවා. එක අතකට හොදටම කහ ගැහුනු, තැන තැන ඉරුන ගවුම් අදින මට ටික වෙලාවකට හරි ඒ වගේ වටින බඩුවක් අල්ලන්න දෙන එකත් ලොකු දෙයක්.

ටික්කිගෙ අම්මා නැති වෙලාවට නම් මම වැඩිපුරම ඉන්නෙ ටික්කිගෙ කාමරේ. එයාගෙ කාමරේ ගොඩක් ලොකුයි, අපේ ගෙදරත් වඩා. මුලින් මුලින් මැගිලින් අම්මා මම ටික්කිගෙ කාමරේ ඉන්නවට කැමති තිබුනෙ නෑ. දවසක් මැගිලින් අම්මා ටික්කිලගෙ ගෙදර ඉදන් මොනවද හොරෙන් ගෙදර අරන් යන්න හැදුවා, එයා නම් කීවෙ කන්න බොන්න දේවල් ගෙදර නෑ කීවට පස්සෙ ටික්කිලගෙ අම්මා එයාට ඒවා අරන් යන්න කීවා කියලා, එදා අපි සද්ද නැතිව බලන් ඉදියයින් පස්සෙ වෙන්ද වගේ මැගිලින් අම්ම ටික්කිලගෙ අම්මට කේලම් කියන් නෑ. ඒ හන්දා ටීචර් එවන පාඩම් වැඩ ටික්කිගෙ කාමරේ ඉදන්ම ලියාගන්න පුළුවන්. ටික්කිගෙ පාඩම් පොත් කාටවත් දෙනවට ටික්කිලගෙ අම්ම කැමති නැතිලු, ඉතින් මම ටීචර් එවපු පාඩම් ලියාගන්නෙ ටික්කිලගෙ ගෙදර ඉදන්. ටික්කිත් පොත් දෙන්න කැමති නැති වුනනම් මටත් වෙන්නෙ ගෙදරට වෙලා නිකම් ඉන්න. එහෙනම් දිවියලෝකෙ ඉන්න තාත්තාටත් දුක හිතෙනවා. ඇයි ඉතින් දැන් හුග කාලයක් ඉදන් ඉස්කෝල වහලනෙ.

ටික්කි විතරක් ගෙදර ඉන්න වෙලාවට මම ටික්කිලගෙ කාමරේ හිටියට ටික්කිලගෙ අම්ම ඉන්න වෙලාවට මට එයාලගෙ ගෙදර කුස්සියට වත් යන එක තහනම්. එයාල ඉස්සර ඉදන්ම උඩරට වලව්වකාරයොලුනෙ. මහ ලොකු දිග වාසගමක් තමයි ටික්කිලට තියන්නෙ. ටික්කිලගෙ අම්ම නම්

කියන්නෙ වලවුකාරයො තමයිලු උසස් කට්ටිය, අනිත් සේරම අය පහත්ලු. එතනින් පටන් අරන් එයාලගෙ අම්මා ලොකු විස්තරයක් කියනවා. ඒ කියන විදියට ටික්කිලගෙ මී මුත්තා, බණ්ඩාරනායක ලොකු නිලමෙතුමා ඉන්න කාලෙදි එහෙම වලවුකාරයෙක්ව පාරෙදි දැක්කත් කාණුවට බැහැලා වඳින්න ඕනිලු නිලමෙතුමාට. නිලමෙතුමා යනකල් බිම බලාගන වැදගෙන හිටියෙ නැත්නම් දවස් දෙකක් දඬුකඳේ ගහල තියනවලු. අම්මෝ ටික්කිලගෙ මී මුත්තා ගැන නම් මට හිතගන්න බෑ. වෙලාවට එයා දැන් නැත්තෙ. බොරුවට අවදානමක් ගන්න ඕනි නෑනෙ, ටික්කිලගෙ අම්මා ගෙදර ඉන්න වෙලාවට මැගිලින් අම්මා ඉක්මනටම මාව කුස්සිය පිටිපස්සෙ තියන බන්කුවෙන් ඉන්දවනවා. ඒක හදල තියන්නෙ නම් ගෙදට වැඩ කරන අයට මහන්සි වුනාම ඉදගන්න කියලා මට කීවෙ මැගිලින් අම්මා.

ටික්කිලගෙ අම්මා ඉන්න වෙලාවට ටික්කිට කාමරෙන් හෙලවෙන්න වත් දෙන් නෑ. එතකොට මැගිලින් අම්මාත් ටිකක් වෙනස්. ටික්කි ඒ වෙලාවට පාඩම් පොත් පවා මම ඉන්න තැනට එවන්නෙ මැගිලින් අම්ම අතේ. අතේ කීවට ඉතිම් මම ලගට නම් මැගිලින් අම්මා පොත් ගෙනත් දෙන් නෑ. ගොඩක් වෙලාවට කුස්සියෙ උලුවස්ස ලග ඉදම්ම මම ඉන්න තැනට එයා පොත විසි කරනවා. මොන විදියට හරි ටීචර් එවන පාඩම් මට ලියාගන්න ලැබෙනවනෙ. ඒ ඇති.

ගෙදර ඉන්නකොට හැමදාම පොල් සම්බෝල කන්න වුනාට ටික්කිලගෙ ගෙදරදි මැගිලින් අම්ම හොද කෑම එකක් බෙදලා දෙනව මට. මොනවහරි මස් ජාතියක් එක්ක මාලු පිණි හතරක් විතර නම් වරදින්නෙ නෑ. මැගිලින් අම්මා මට බත් එක එවන විදිය නම් හරි ශෝක්. කුස්සියෙ උලුවස්ස ලග ඉදන් මම ඉන්න තැනට බිම දිගේ බත් එක එවනවා. හරියට නිකම් අපේ කැලෑ ඉස්කෝලෙ ලිස්සන බෝට්ටුව වගේ. ඒකෙත් උඩින් නැග්ගාම බිමටම ලිස්සලා යනව වගේ බත් එකත් බිම දිගේ ලිස්සල මම ගාවට එනවා. ඒ විදියට බත් කන්න ටික්කිලගෙ අම්ම කොළඹ ඉදන් ගෙනාව තඩි බල්ලා ලකීට වත් පින නෑ. ඒ අතින් එකා හරිම අන්ලකී.ටික්කි කියන වචන අල්ලගන මටත් ටිකක් ඉන්ගිරීසි පුලුවන්. එයාගෙන් අහගත්ත නම් තව පුළුවන්. කොහෙද ඉතින් ටීචර් එවන පාඩම් ලියාගන්නෙත් බොහොම අමාරුවෙන්නෙ, ටික්කිලගෙ අම්මා ගෙදර නැති වෙලාවක එපැයි මම එයාගෙන් ඉන්ගිරීසි අහගන්න.

ලිස්සන බෝට්ටුව වගේ බිම දිගට ලිස්සගන ආව කෑම එක හරි සුවදයි. අම්ම හැමදාම හදන සම්බෝල වල කොයින්ද සුවදක්. සමහර දවස් වලට මිරිසුත් මදි. බත් එක දකිද්දි කටට කෙල ඉනුවට මම දැන් ගොඩ වෙලාවක ඉදන් හරි අමාරුවෙන් හිටියෙ, මැගිලින් අම්මා උයන්න ගත්ත වෙලාවෙ ඉදන් ඉවසගන්න බැරි තරම් වටේම සුවදයි. නිකමට වත් හිතුන් නෑ මැගිලින් අම්මා මට බත් එකක් දෙයි කියලා. වෙනදාට නම් ලකියගෙ බත් එක දීල ඒකගෙ ඔලුවත් අතගාල තමයි මැගිලින් අම්මා යන්නෙ. වෙනදට ඒක දකිද්දි මට හරියට දුක හිතෙනව, එත් අද එහෙම නෑ. මොකද මටත් රස බත් එකක් දුන්නනෙ.

සුවද වගේ තමයි බත් එකේ රසත්. තාත්තා දිවියලෝකෙ ගියපු මුල් දවස් වල හම්බවුන දිවියලෝකෙ කෑම වත් ඒ තරම් රස නෑ. එක අතකට ටික්කි මොන තරම් වාසනාවතයිද, මේ වගේ ලොකු ගේක ඉන්න, රස කෑම කන්න ඒ විතරක්ද ඇයි ලස්සන ලස්සන ඇදුම. එයාට නැති දෙයක් නෑ. වෙලාවකට හිතෙනව අම්ම කුලී වැඩ වලට යනව කියල ගිහින් දවසම නිකම් ඉදල එනවද කියලත්. ඇයි ඉතින් වැඩ කරනව නම් අපටත් සල්ලි තියෙන්න එපැයි.

බත් කටවල් දෙක තුනක් කනකොටම මෙන්න කවදාවත් නැතිව ඉක්ක වැටෙන්න පටන් ගත්ත. කුස්සිය පිටිපස්සෙ තියන ටැප් එකෙන් වතුර උගුරු හය හතක් බීවා ඒත් හරියන් නෑ. වතුර උගුරක් කටේ තියාගන නහය මිරිකන් හිටියා, දැන් ඉස්සරලටත් වැඩිය සද්දෙන් ඉක්කා වැටෙන්න පටන් ගත්තා. නහය මිරිකගන එකේ ඉදන් දහයටයි ආයෙත් දහයෙ ඉදන් එකටයිත් ගනන් කලා. ඒක ඉවර වෙද්දි මගෙ හුස්මත් හිරවෙන්න වගේ. ඒ වුනාට ඉක්කා වැටෙන එකේ නම් අඩුවක් නෑ. අන්තිමට බැරිම තැන ඉක්කයි මායි කොලඹ ගියා ඉක්කා දාල මම ආවා කියලත් කියන්න පටන් ගත්තා, මේක හරියන වැඩක් නෙවේ. කොහොමහරි මම පිටිපස්සෙ කෙහෙල් පදුරෙන් කෙහෙල් කොලයක් ඉරාගෙන බත් එක ඔතාගත්තා, ගෙදර ගිහින් වත් කන්න පුළුවන් එතකොට.

ඉක්මනට ගෙදර යන්න හිතාගන මට බත් දුන්න බෙලෙක් පිගානයි ටික්කිගෙ පොතයි මැගිලින් අම්ම අතට දෙන්න ගිය වෙලේ මට හොදටම බැන්නා. අනේ මන්දා එයත් ටික්කි නැති තැන හරි අමුතුයි, මැගිලින් අම්මා මම එහෙ යනවට කොහොමත් වැඩි කැමැත්තක් නෑ. ඒක මට ටික්කි වුනත් කියල තියනවා. දවස් දෙක තුනක්ම මැගිලින් අම්මා ටික්කිට කීවලු මාව ගෙන්නගන්න එපා කියලා. එයාල මොනව කීවත් එහෙ යන් නැතිව මට ටීචර් එවන පාඩම් ලියාගන්න විදියක් නැනෙ. යන්තම් හතරෙ කැලෑසිය පාස් කරගත්තයි කියන මැගිලින් අම්මාට කොහෙද ඉතින් ඕව තේරෙන්නෙ. කවුරු මොන දේ කීවත් තාත්තා දිවියලෝකෙ යන්න කලින් කීව විදියට මම කවදාහරි ලොකු නෝන කෙනෙක් වෙන්න ඕන. ඉතින් මැගිලින් අම්මා මොනව කීවත් මම හිතට ගන්නෙ නෑ. මම කවදාහරි ලොකු නෝන කෙනෙක් වුනාම තාත්තා දිවියලෝකෙ ඉදන් ආපහු මාව බලන්න එන්න වුනත් බැරි නෑ.

ලන්ද මැද්දෙන් යද්දි අම්ම හැමදාම කියන්නෙ හොදට පාර බලන් යන්න කියලා, නයි පොලොන්ගු කුනුකටුවා වගේ ගොඩක් විස තියන සරපයි ඉන්නවලු. මම නම් ඔය සරපයි දැකල නෑ කවදාවත්. දවසක් අම්මත් එක්ක දර කඩන්න ලන්දට ගිහින් එද්දි ගෙදරට කුනුකටුවෙක් ඇවිත් තිබුන. අම්මත් ඒකව තැලිච්ච කජු ලෙල්ලක් වගේ වෙනකල්ම කැත්තෙන් ගැහුව ඌට. අන්තිමට ලිප පත්තු කරන ගිනි පෙට්ටියෙන් ගිනිකුරකුත් ගහල ඒකව පුච්චලත් තමයි නතර වුනේ. එහෙම කලේ නැත්නම තවත් කුනුකටුවා ගෙදරට එනවලු, අනේ මන්දා තවත් කුනුකටුවා අපේ ගෙදරට කොහොමද එන්නෙ කියලා. සමහර විට තලපු කුනුකටුව හොයාගන එනව ඇති ඌගෙ යාලු කුනුකටුවො. අම්ම නම් කියන්නෙ සරපයින්ටයි මිනිස්සුන්ටයි එකට ඉන්න බැලු. ඒක නම් ඇත්ත. මොකද මොන සරපය ආවත් කලින් කුනුකටුවට වෙච්ච දේ මයි වෙන්නෙ. අම්ම ඒකව තලලා තලලා කලු ලෙල්ලක් වගේ කරනවා.

ඉක්ක වැටනු හන්දා බත් එක ඔතාගන ආවයින් දැන් අම්මටත් ඒ රස බත් එකෙන් ටිකක් කන්න පුළුවන්. අම්ම මේ තරම් රස කෑම තියා තාත්තා දිවියලෝකෙ ගිය දවස් වල හම්බවුන දිවියලෝකෙ කෑම වත් කෑවෙ නෑ. එයා කලේ වැරහැලි වෙලා ගිය චීත්ත කොනෙන් හොටු පිහ පිහ ඉවරයක් නැතිව අඩපු එක. කොච්චරවත් මමයි අනිත් අයයි අඩන්න එපා කීවට ඇහුවෙ නෑ. මම අහල තියන විදියට දිවියලෝකෙ කියන්නෙ හොද සතුටින් ඉන්න පුළුවන් තැනක්ලු, රස කෑම එහෙමත් තියනවලු. ඉතින් අපි දුක් වෙන්නෙ මොකටද. හරිනම් අපි සතුටුවෙන්න ඕනි. මොකද අපට නැතත් තාත්ත හොද සැපට ඉන්න පුළුවනි.

දෙවට පටන් ගන්න හරියෙදිමයි ගොඩක් හයියෙන් ගෙවල් පැත්තෙ ඉදන් එන අම්මව හම්බවුන්නෙ. එයත් ගමන් බිමන් යන්නෙ වෙලාවකට කකුල් දෙකට මැශින් එකක් හයි කරල වගේ. ගොඩක් වෙලාවට

මම අම්මත් එක්ක කොහෙ හරි ගමනක් යද්දි ඇවිදන් යනවට වඩා ගොඩක් දුවන එක කරන්නෙ. අම්මට ගොඩක් වෙලාවට තරහ යනව ඒකට. බැනුම් අහන්නත් බැනෙ, අම්ම ඉස්සරහ බලන් යනකල් ඉදල අම්මට නොදැනෙන්න මම දුවනව එයා පස්සෙන්. හදිස්සියෙ වත් අම්ම පිටිපස්ස හැරෙනව කියල තේරෙනකොටම ටිකක් වේගෙන් ඇවිදිනව. අම්ම ඕක දන්නව නම් මට විසුමක් වෙන් නෑ. මොනව කරන්නද ඉතින්, කුරුම්ට්ටෙක් වගේ ඉන්න මට පුළුවන් උපරිම හයියෙන්නෙ මම ඇවිදින්නෙ ඉතින්. කොහොමහරි මම ගෙදර එනකල් බලන් ඉදල අම්ම හීන් මැණිකා නැන්දලාගෙ

ගෙදර ගියා. මොකක් හරි වැඩකට වෙන්නෙති. දවස් ගානක්ම හීන් මැණිකා නැන්දත් මෙහෙ ආවා. එයත් ඉතින් මොකක් හරි වැඩක් කරවගන්න ඕනි වුනම තමයි අපේ අම්මව හොයාගන එන්නෙ. කරුවල වැටෙනකල්ම අයෙ එන එකක් නම් නෑ. දැන් අර තොත්ත බබා අඩනවද දන් නෑ. කවුරු හරි ඕකත් අම්මට කීවොත් එහෙම මට ගෙදර ඉන්න හම්බවෙන් නෑ. අම්මගෙ මහ ලොකු පුතානෙ, අම්ම ඒකට කිරි පොවල කිරි පොවල ඌ දැන් අල ගෙඩිය වගේ වෙලා.

ගෙට ගොඩ වෙලා බලද්දි තොත්ත බබා හොදටම නිදි. තව ගොඩක් වෙලාවකට නැගිටින් නැති වෙයි. මම හැමදාම ඒකගෙන් පරිස්සම් කරන කලු පාට බලල් තඩියවත් තොටිල්ල කිට්ටුවකින් තිබ්බෙ ටිකක් පාඩම් කරන්න හිතන්. ඒකව දැක්කහම වුනත් ඕක අඩන එක නතර කරනව. ඒ තරමට ඌ ඒකට ආදරෙයි. මැරුමුස් බලල් හාමිලාගේ චූටි කිටී නොහොත් පූසාරියා, ඒක තමයි පූසගෙ නම. ටික්කියි මමයි දෙන්නම එකතු වෙලා ඒ නම දැම්මෙ. ටික්කිලෑ ගෙදරත් ඉන්නව ඒ වගේම ලොකු බලල් තඩියෙක් උගේ නම පුරු පුරු රාලහමිලාගේ මිකී නොහොත් පූසාරියා. මල්ලි ඒකව පොඩි කරද්දි තමයි අම්මට යකා නගින්නෙ, බලල් තඩියගෙ පඩි ගියහම මල්ලිව අසනීප වෙනවලු. අම්මටත් පිස්සු. ඒ ගොන් බලන් තඩිය රෑට නිදාගන්නෙම මගෙ කකුල උඩ. එහෙනම් ඉස්සරලම අසනීප වෙන්න ඕන මම.

අම්මා මට පාඩම් කරන්න පොඩි මේසයක් හදල දීල තිබුනත් මම ඒකෙ ඉදගෙන් පාඩම් කරන්නෙ නෑ. මිදුලේ තියන පේර ගහට පොතත් අරන් නගින්නෙ පාඩම් කරන අතරම හොද පේර ගෙඩි ටිකකුත් කන්න පුළුවන් හන්දා. ගොඩක් දවස් වලට නම් පාඩම් කරනවට වඩා කරන්නෙ පේර කන එක. පේරයක් කඩාගන කන්න පටන් ගන්න ගමන් වට පිට බලනකොට සීතා නැන්දා ගස්සගන ගේ ඇතුලට රින්ගුවා. මම මතක ඇති කාලෙ ඉදන්ම හිටියෙ සීතා නැන්දලගෙ ගෙදර, ටවුමෙ රෙදි කඩයක් තියනවා එයාලට, අපේ කියල නෑදෑ කෙනෙක්ට හිටියෙ සීතා නැන්දලා විතරයි. ඉස්සර මට අම්ම බැන්නම වුනත් මම ගියෙ සීතා නැන්දලගෙ ගෙදර. ඒත් දැන් ඒගොල්ලො අපිත් එක්ක තරහයි. තාත්තා දිව්යලෝකෙ ගියාට පස්සෙ එයාල අපේ ඉඩම අයිති කරගන්න හැදුවලු, එයලට මේක ඕනිලු, ඒ වුනාට අපි එයාලට මේක දීල යන්න තැනකුත් නැනෙ. අම්ම නම් කියන්නෙ එයා හිතන් ඉන්නේ සීතා කුමාරි කියලලු. අනේ මන්දා, මට මතක විදියට සීතා නැන්දායි එයාගෙ දුව තුශාරි අක්කයි දෙන්නම ඉස්සර පන්සලේ හාමුදුරුවෝ කියල දුන්න බණ කතාවක හිටිය නවදැලි හේනෙ පිච්චුනු වැදිරි වගේ. ගෝරිල්ලෙක්ද මොකෙක්ද මූනෙ ගාලලු දැන් සුදු වෙලා තියන්නෙ. සුදු පාට වුනාට තුශාරි අක්කගෙ මූන නම් හරියට මාස්මෙලෝස් එකක් වගේ. මූන හැමතැනම ගෙඩි.

''බබා එන්න නාන්න'', එක පාරට සීතා නැන්දා උණු වතුර එකකුත් උස්සගන ඇවිත් කෑ ගැහුවා. තුශාරි අක්කගෙ ලමයයි තුශාරි අක්කයි දෙන්නම සීතා නැන්දා ලගට දිවුවා ඒ සද්දෙට නම්. බබා

කියලා කාටද කතා කරේ කියල මම හිත හිත ඉන්නකොට සීතා නැන්දායි තුශාරි අක්කයි දෙන්නම කෑ ගගහා ලමයව නාවනවා. මුලු ගමම දන්නව ඇති අද තුශාරි අක්කගෙ ලමය නානව කියලා. එයාල දෙන්නත් අන්දරේගෙ ගැනියි රජ බිසවයි වගේ එක්කෙනෙක්ට එක්කෙනෙක් නොදෙවෙනිව කෑ ගහනවා. අනිත් වෙලාවට සද්දයක් වත් නැතිවට මම පාඩම් කරන වෙලාවට නම් සීත නැන්දලාගෙ

ගෙදර අය ගොඩක් සද්දෙන් කතා කරන්නෙ. හැමදාම වගේ මම අදත් කරන්නෙ පාඩම් කරන් නැතිව වෙන දේවල් දිහා බලන් ඉන්න එක. රෑට වත් ටීචර් එවපු පාඩම් බලන්න ඕන.

තොත්ත බබාගෙ සද්දයක්වත් නැති හන්දා තොටිල්ල ගාවට ඔලුව දාල බලද්දි බලල් තඩිය ඒකගෙ ඇග උඩටත් නැගලා. මේ ලමයට ගානක්වත් නෑ. බලල් තඩිය විසි කරන්න බලද්දි මේ තොත්ත බබාව හොදටම රස්නෙයි, මාවත් පිච්චුනද මන්ද. ඕනි එකකට අම්මව එක්ක එන්න ඕන, මේ ලොම්

ගුලිය හන්ද අපේ තොත්ත බබාව අසනීප වුනාද මන්දා.

වෙලෙන් එහා හීන් මැණිකා නැන්දලගෙ ගේ තියන්නෙ. දවස් ගානක් වැහැල පාර මඩ වෙලා කියල මගෙ කුරුලු මොලේට තේරුනෙත් නියරෙන් ලිස්සල වැටුනට පස්සෙ. මගෙ පස්සත් බිම ඇනිච්චි. දනිස්සෙ ගැවුනු මඩ තලිය වැහෙන්නම ලේ ගලනවා. අමාරුවෙන් උතුරන්න ඔන්න මෙන්න ඇලට බැහැල තුවාලෙට වතුර ටිකක් වත් කලා විතරයි ,අම්මෝ දවල් තරුත් පෙනුන මට. රිදෙන එක ගැන නොහිත හිමින් හිමින් තුවාලෙ හෝදගන ගොඩට යන්න යද්දි මේකෙ ඉන්න මෝඩ මාලු ටික ඇවිදින් කකුල් වලට කොටනවා, මේ සත්තුන්ට තේරෙන් නැති හැටි මට අමාරුයි කියලා.

මල්ලිට අසනීපයි කීවම අම්මට මාව මතකත් නෑ. මාවත් දාල එයා ගෙදර දුවගන ආවා. දනිස්ස හම ගිහින් තියෙද්දි මම කොහොමද දුවන්නෙ. ඕනි නම් බැනගන්නතෑ කියල මට පුලුවන් විදියට ගෙදර ආවෙ. ඕවිටේ තිබුන කෝපි ගහෙන් දලු ටිකකුත් කඩන් හපල තුවාලෙන් තිබ්බා කටට පොඩි තිත්ත රහක් දැනුනත් ඕක තලාගන්න එලියෙ තිබුන කලු ගල ගාව නැමෙන්න ගියා නම් ආයෙමත් මට දවල් තරු පේනවා, අම්මගෙ කහ පදුරෙන් ටිකක් කඩා ගත්තොත් ඉන්න හම්බවෙන් නෑ උන්දැගෙන්. අම්ම ඒක ආරක්ශා කරන්නෙ ඉහල පන්සල් වත්තෙ තියන නිධානයට අරක් ගත්ත බහිරවය වගේ. උවමනාවකටත් නැති ඒව මොකටද ඉතින්.

අම්මා මාවත් මග දාල දුවගන එවිත් තියන්නෙ ගුනපාල මාමලගෙ ගෙදර යන්න. ඇත ඉදන්ම අම්ම ආවෙ තරහෙන්. ගමේ කවුරුත් සල්ලි ඕන වුනාම යන්නෙ ගුනපාල මාම ගාවට. එයාලගෙ ගෙදර කාමරයක්ම පුරවල සල්ලි තිබුනට එයාගෙන් සල්ලි ටිකක් ඉල්ලගන්න එක ඉබ්බගෙන් පිහාටු ගන්නව වගේලු. කොච්චරවත් හෙවුවට මට තවම නම් පිහටු තියන ඉබ්බෙක්ව හම්බවුනේ නෑ.

ගේ වටේම කැරකුනු අම්ම ආයෙම සැරයක් ඉස්සර තාත්තා මට දෙන සල්ලි එකතු කරපු කැටේ අතට අරන් බැලුවා, අම්ම හැම තිස්සෙම ඒකෙන් සල්ලි ගන්න හන්ද ඒකෙ කාසි විස්ස තිහකට වඩා තිබුනෙ නෑ. ඊලගට කුස්සියෙ තිබුනු වප් පිහිය අරගන කාමරේ මැද්දෙ තිබුන තොටිල්ල ලගට ලන් වුනා. බෙල්ල ලගට ලන් වුනු වප් පිහිය දැක්කම තොත්ත බබාට විතරක් නෙවේ මටත් සද්දෙටම කෑ ගැස්සවුනා. පිහිය බෙල්ල ලගටම ලන් කරපු අම්මගෙ අත හොදටම වෙවුලනවා. ඇස් වලින් කදුලු වැටෙනවා හරියට හයියෙන් වහින වෙලාවක වැහි වතුර වැටෙනව වගේ. අපි ඔක්කොමල ගොඩක් වෙලා එහෙම ඉන්න ඇති. මගෙ කෑ ගැහිල්ල නැවතුනේ මල්ලිගෙ බෙල්ලෙ තිබුනු පන්චායුදේ කපාගන

අම්ම ටිකක් දුර ගියාටත් පස්සෙ. ගුනපාල මමට මල්ලිගෙ පන්වායුදේ දෙන්න වෙන්න ඇති අම්ම ගියෙ. ගුනපාල මාම සමහර විට ඒක බෙල්ලෙ එල්ලගනී. මල්ලි නම් හැම තිස්සෙම ඒක කටේ දාගන හපනවා. තොත්ත බබාට බත් කන්න බැරි වුනාට ඒක නම් කනවා. මල්ලි මේ තරම් කල් ආසාවෙන් හපපු එක නැති වුන හන්දා ඒකා හොදටම අඩනවා. පූසටත් මතක නෑ වෙනදට මල්ලි ඌට වද දෙන විදිය, ඌත් මල්ලි ලගටම ඉව අල්ල අල්ලම හිටියෙ අම්ම එනකල්ම. ටික වෙලාවකින් අම්මා ආපහු ආවෙ කොල පාට ලොකු සල්ලි කොලයකුත් අරගන. ඒකෙ කොනක ලස්සන මොනරෙකුත් හිටිය. අම්මගෙ පරන චීත්තයක් ඉරලා මගෙ කටත් බැන්දා, හුස්ම ගන්නත් බැරිව දැගලුවට අම්ම ගනන් ගත්තෙවත් නෑ. මෙහෙම මූන හිරකරගත් නැතිව පාරෙ යන්න බැහැල්ලු. අනේ මන්දා මොකට මෙහෙම මූන හිරකරනවද කියලා, තොත්ත බබවත් වඩාගත්ත අම්ම මාවත් ඇදගන පාර ලගට ගියෙ අබරන් සීයා බෙල්ල කපන්න එක්කන් ගිය හරක් පැටියා වගේ.

පාරට වෙලා ගොඩක් වෙලා බලන් හිටියට බස් එකක් ආවෙ නෑ. වැඩිය මිනිස්සු ගමන් බිමන් යන් නැති හන්ද එකම බස් එක තමයි එහාටයි මෙහාටයි හැම තිස්සෙම ගියෙ. දනිස්සෙන් එන අමාරුව දරාගන ඉන්න බැරි තැන පාර දෙපැත්තෙ තිබුන බෝක්කු ගැට්ට උඩින් ඉදගත්තෙ මෙච්චර වෙලා අම්ම අල්ලන් හිටපු අත ගසල දාල. අම්මා මල්ලිවත් මම ලගින්ම ඉන්දවල අල්ලගන හිටියෙ ඒකවත් උස්සගන ඉදල එපාම වෙලා වෙන්නෙති. ඉද හිත දූවිලි අවුස්සගන යන ටිපර් එකක් හැරුනම වෙන ලොකු වාහනයක් යන්නෙම නැති තරම්. බස් එක එන වෙලාව දැන් නම් හොදටම පරක්කු වෙලාලු, ඒක දවසක් පාරෙ ගියොත් දවස් දෙකක්ම කෑලි ගලවල හදන්න වෙනව කියල කවුරුත් දන්නවා. ඒත් අපට ඕනිම වෙලාවෙ මේ දූවිලි කුමාරි එන්න කියලයි මමත් දෙවියන්ට කීවෙ. ඒත් දෙවියන්ට අපි කීව දේ ඇහෙන්න නැතිව ඇති. කලුවර වැටෙන්න ඔන්න මෙන්න තියෙද්දි වත් බස් එක ඒවි කියල බලාපොරොත්තුවෙන් පාර දිහ බලන් හිටියට බස් එකක හෝන් සද්දයක්වත් ඇහුන් නෑ. අන්තිමට මට ආපහු ගෙදර යන්න කියල අම්ම මල්ලිවත් උස්සගන නිකවැරටිය ටවුමට යන්න පිටත් වුනා, නාකි බල්ලො කොලඹ යනව වගේ, මේ මගුල අදත් නෑ. එතන නතර වෙලා බලන් ඉද්දි අම්ම බැන බැන යන සද්දෙ හුලගත් එක්කම ඇවිත් ගොඩක් වෙලා යනකල් ඇහුනා.

අපිට ඉස්සර ඒ කතාව හෙන ප්‍රශ්නයක්. මමත් හැමදාම වගේ බලනව බස් එකේ ඉස්සරහ තියන බෝඩ් එක දිහා, කවද හරි කොලඹ කියල තියනවද කියලත්. අපේ අම්මල නාකි බල්ලෙක් එක්කන් කොලඹ ගිය කතාවක් කියන හන්ද. ඒට් ඒක හැමදාමත් නිකවැරටිය ටවුමෙ ඉදන් ගම් ගිඩවල් මැද්දෙන් ආයෙත 'නිකවැරටිය ටවුමටමයි යන්නෙ. පස්සෙ තමයි ගමේ සීය කෙනෙක් ඔය ඉස්සර උපාසක් අම්මල දවසක් බස් එකේ කොලඹ ගියපු කතාවක් කීවෙ. ඒ ගමන් බල්ලෙක්ව දාගන යන්න ඇති කියල නම් හිතුවෙ ටික්කි මායි. වෙන මේක කොලඹ ගියපු දවසක් නැති හන්ද. වෙලාවට මගෙ කකුලෙ තුවාලෙ තිබුන් නැත්නම් හතර පෝයටම සිල් ගන්න මහ උපාසක අම්මා නාකි බල්ලෙක්ව ගොඩකරගන කොලඹ වන්දනාවෙ ගියපු ලදරම් බස් එකට නෙවෙයි බැනුම් අහන්න වෙන්නෙ මට.

ගොම්මන් අදුර ගම්ගොඩ වහගන්න කලින් ගෙදරට යන්නත් ඕන. ඒත් අම්මා මගෙ කට හිරවෙන්න බැදපු චීත්ත රෙදි කෑල්ල හන්ද තව ටිකකින් මාව හුස්ම හිරවෙලා මැරෙනවා. අම්මා නම් කියන්නෙ මොකක්ද බයානක ලෙඩක් බෝ වෙන හන්දලු මිනිස්සු කටවල් බැදගන යන්නෙ. අනේ මන්ද මේ කැලේ පහු කරගන අපිව හොයාගන ආවොත් ඒ වයිරස් එකටත් අන්තිමට පිස්සු හැදෙනවා. අම්මා හැමදාම මෙහෙම කරයිද දන් නෑ. හැමදාමත් මෙහෙම කට වහගන ඉන්න බෑනෙ, ගෙදර යන ගමන්

තිබ්බු ලොකු මඩ ගොහොරුවක දාල කෝටුවකිනුත් ඇන්නට පස්සෙ ඒක මඩ වලේ යටටම ගියා. ගුඩ් බායි. දැන් නම් අම්මට ඒක හොයාගන්න හම්බවෙන් නෑ.අම්ම ලග වෙන චීත්ත රෙදි නැති හන්ද ආයෙ නම් මගෙ කට බදින එකක් නැති වෙයි.

මැටි හට්ටියෙ අඩියට වෙන්න තිබුනු බත් දන්කුඩේට ලුනු ටිකක් ඉහගන කාල කබල් පැදුරු කැල්ල උඩින් පූසාරියවත් තුරුල් කරගනම ඇල වුනේ කිසිම හැල හොල්මනක් නැති ගෙදර යන්තම් අටවන් තියන ටකරම් දොර කඩාගන මොකෙක් හරි ආවොත් ගේහරියටම ඉන්න එකම ආරක්ශකයත් වූ නිසා. අඩුම වූ එන එකාව සූරල හරි මාව බේරගනී. ටික ටික රෑ වෙනකොට මට කල්පනා වුනේම බත් කන් නැතිවම අම්ම මාව දෙන්න හදන පහල කනත්තෙ යක්ශනී ඇවිත් මාව අරන් යයි කියලමයි. විඩෙන් විඩේට නින්දෙන් ඇහැරුනාම කුප්පි ලාම්පු එලිය වරිච්චි බිත්තිය උඩ හදපු අඳුරු සෙවනැලි වලට ඊටත් වඩා බය වුනා. එලිවෙන ටිකක සැරින් සැරේ නැගිටල කීපාරක් නම් ඉතිපිසෝ ගාථාව කීවද දන් නෑ. පිලිකන්නෙ කොස් ගහේ ඉදන් තරගෙට කෑ ගහපු බකමූනොන්ගෙ සද්දෙත් එක්ක ගොඩක් වෙලා ඇහැරන් ඉන්න ඇති. යන්තම් එලිය වැටෙනකොටම කන ලගින් ඇහුනු වාහන හෝන් සද්දෙකට තමයි මාව උඩ ගිහින් ඇහැරුනේ. කවදාවත් නැතිව මේ පැත්තට ආව වාහනේ මොකක්ද කියල බලන්න මලකඩ කාපු ටකරම් දොර ඇරන් එලියට එනකොට කලු පාට ලොකු දිලිසෙන ජීප් එකක් අපේ මිදුලෙ. ගමේ හැමෝමත් එතන වට වෙලා. එකපාරටම මාව දැකපු සීතා නැන්දා කොහෙදෝ ඉදන් දුවගන ඇවිත් මාව බදාගන හොදටම අඩනවා. කම්මුල් දිගේ ඉවරයක් නැතිව කඳුලු වක්කර වක්කර සැරින් සැරේ නහය උඩට ඇදල හොටු සීරුව. අනේ මන්ද, මෙච්චර කල් නයාට අදු කොල වගේ අපිව පේන්න බැරිව හිටපු සීත නැන්දට එක පාරටම මොකද වුනේ කියල. වෙලාවකට හිතෙනව මේ සීතා නැන්ද නෙවෙයි වෙන කවුරු හරිද කියලත්. දැන් නම් සීත නැන්ද අපේ තාත්තා දිවියලෝකෙ යන්න කලින් දවස් වල වගේමයි. අන්තිමට මට මතකවත් නැති ලස්සන සුදු පාට ගවුමක් අන්දවල අර ලොකු වාහනේ පිටිපස්සට මාව නැග්ගෙවුවා.සීත නැන්දත් මගෙ ලගින්ම හිටියා. කොහෙට යනවද කියල මට දැනගන්න ඕනිකමක් තිබුන් නෑ. ලස්සන ලොකු වාහනේක පලවෙනි පාරට තමයි මම කොහෙහරි යන්නෙ. සීතල හුලන් වැදි වැදී අපි වේගෙන් ඉස්සරහට යද්දි වේගෙන් පස්සට පස්සට යන රූස්ස ගස් දකිද්දි හිතෙන්නෙම මම පියාබනව වගේ නේද කියලා.

කාටනු් වල ඉන්න සුපර් මැන් වගේ කැබ් එක පිටිපස්සෙ එල්ලිලා ගිහින් අපි අන්තිමට නතර වුනේ නිකවැරටිය ඉස්පිරිතාලෙ ඉස්සරහ. අපි මේ තරම් වෙලා ආව වාහනේ කාගෙද කියල මම හොයාගත්තෙත් බිමට බැස්සට ඔඅස්සෙ ඒකෙ ඉස්සරහ ගහල තිබ්බු ග්‍රාම නිලදාරී කියන බෝඩ් එකෙන්. එයා නම් ගොඩක් හොදයි. මහ ඉස්පිරිතාලෙට යන ලොකු ගේට්ටුව ගාවදි හරියට අත හේදුවෙ නෑ කියල බැනපු වස මාමලගෙන් මාව බේරගත්තෙත් එයා. වතුර ටැප් එක ලග සබන් කැල්ලක් තිබුනෙත් නෑ, ඉතින් සබන් ගෑවෙ නෑ කියල කෑගහනව ඒගොල්ලො. පස්සෙ ග්‍රාමසේවක මහත්තය තමයි කියල දුන්නෙ එතන තිබ්බු ලොකු බෝතලේ වතුර වලින් අත හෝදනකොට සබන් වල වගේ පෙන එනව කියලා.

සුදු පාට අත් දිග කමිසයක් ඇදගන අපට ඉස්සරහින් ගියපු එයා විසල් රෝහල් කොරිඩෝ දිගේ ගිහින් නතර වුනේ මහ පාලු මූසල තැනකින්, 'මෘත ශරීරාගාරය' අපට ඉස්සරහින් තිබුනු ලොකු බෝඩ් එකේ තිබුනෙ එහෙමයි. ඉස්පිරිතාලෙ හැම තැනම එන බෙහෙත් ගඳ වෙනුවට එතනින් ආවෙ අමුතුම ගඳක්.

ඒක ඇතුලෙ සුදු රෙද්දෙන් වහල තිබ්බු ට්‍රොලියක් පෙන්නල මගෙන් මොකක්දෝ ඇහුවා. ඒක අයින් කරනකොටම ටික්කිගෙ පොත් වල අලවල තිබ්බු ස්ටිකර් එකක් වගේ වුනාට මට අඳුනගන්න පුළුවන්, ඒ මගෙ තොත්ත බබා. එයා මොනව කරන්න ගිහින්ද එහෙම වුනේ. අම්මගෙ ඇගෙත් හැම තැනම රතු පාට කුකුල් සායම් ගාල වගෙ, මම මොන තරම් කතා කලත් එයාල එක්කෙනෙක් වත් මම දිහා බැලුවෙ නෑ.

ඉස්පිරිතාලෙ ඉඳන් එනකොට ඉස්සරහට තනිය හම්බවෙලාලු. අනේ පවු. ගොඩක් කට්ටිය කීවෙ එහෙමයි. අන්තිමට ගමේ අය එකතු වෙලා අම්මවයි තොත්ත බබාවයිත් පෙට්ටියකට දාල පස් වලින් වැහුවා. එයාලත් අන්තිමට දිව්‍යලෝකෙ යන්න ඇති. අපරාදෙ, මමත් එදා එයාල එක්ක ගියා නම් මටත් ඒ එක්කම දිව්‍යලෝකෙ යන්න තිබුනා.

**කෙටිකතා තරගාවලිය- තුන්වන ස්ථානය**

**" කැලෑ මල් "**

**ආර්. පී. ඉසංකා සෙව්වන්දි ගුණතිලක**

**තාක්ෂණ පීඨය**

**රුහුණ විශ්වවිද්‍යාලය**

*************************************************************************

**CORONA WAS HERE. !**

**Ccorona was here**

**Quarantined half a year**

**Riches had their lesure**

**While the poor mostly suffer.**

**Corona was here**

**Humans trapped in fear**

**Animals walks in clear**

**Nature wins this year**

**Corona was here**

**Showing everyone out there**

**That money has no power**

**When it against the nature.**

**Corona was here**

**Doctors and nurses and soldiers were there**

**They save us from fear**

**Have to praise them forever**

**Corona disappears**

**Teaching us a lesson here**

**That its our responsibility out there**

**To protect our nature together**

**Poem First Place**

**R.Y.L. Ranasinghe**

**Faculty of Allied Health Scienes**

## The wear of the life

**By susith nimantha siriwardhana**

**Yes they introduced it**

**Long time ago for the safe**

**Now it is an essential**

**You may know or not the sake**

**HERE I am fine and great in mood**

**No one knows what s on the way**

**And again I am crying and in a bad mood**

**Who knows I am broken any way**

**When I get home"I take off it**

**The day and almost impossible task**

**No one around and I am on it**

**No fakes or lies s make a blast**

**Thank you dear pandemic**

**For this wonderful dress spark**

**Life was really hard**

**Withot a mask**

**Poem Second Place**

**W.S.M. Siriwardhana**

**Faculty of Humanities and Social Sciences**

## A Call From daddy

**By Susith Nimantha Siriwadhna**

**You may be inside your home**

**It dosen ‘ t mean you ‘re alone**

**Make a call sweet take your phone**

**Here I am Hello little John**

**Find who you are inside your soul**

**Make paint or mess with your tone**

**Hide your worries let’ sing a song**

**I ‘ll hold my arms open wide**

**Let’s shot to the world we’re outside**

**Don’t give up the end is in sight**

**If we’re together,can win this fight**

**Poem Third Place**

**W.S.M. Siriwardhana**

**Faculty of Humanities and Social Sciences**

**CHINTHANA PRANAMA COMPETITION - POEMS CAEEGORY**

Caution by Corona

You can’t see me in your naked eye
But I can kill even the strongest gus
Still the powerful nations sick and die
But you can think differently to get up rise
I’ve been waiting and looking at you thousand times
But you never waited to look back at your life
Then I decided to come and make your realized
Life is health happiness and self - satisfy

Nature is my mother and she made me
Couldn’t bear what you’ve done as a human being
You cut her trees and you pollute all her seas
With chemicals fuels and all the things you need

Now I locked down your countries with huge surprise
Then you could have adeep breath and flashback your life
Were you a good parent, son, lover with beautiful mind?
If not here’s I give you a one last time

The freedom you lost during lockdown
Caged animals feel it whole life from dusk till down
Nuclear wepons all bombs and guns
Became worthless within this few months

This is thelesson I wanted to teach you
Spread love, be kind and always be true
For humans animals the nature you live
If not be caution next time you have to leave

**First Place English Medium Free Version**

**W.M.S.J.Bandara**

**FM/FW/2016/032**

**Faculty of Fisheries and Marine Science and Technology**

## The Blesssing that came in Disguise

You are the monster who took

Thousands of lives………………..

Do you think that you have defeated us?

No…………………. You are worng

You defeated the greedy lives of the people

The time when,

People didn’t even have time to look after themselves

The time when,

parents, Chidren, relatives and friend were far apart.

The time when,

People wear chasing after money like a race

You eliminated that drought time in a wonderful way.

You gave the opportunity to,

Taste the fruit and vegetable grown in the graden.

You gave the opportunity to,

Spend more time with loved ones.

Our lives have gone backwards because of you.

But you wear a blessing to us n disguise.

You who came to defeat us were defeated.

When we forget ourselves again,

When people chase after money like crazy monkeys again,

When w can no time to live for ourselves again


Come back, but please do not take lives

**Second Place English Medium Free Version**


**Name : A.J.L. Subasinghe**

**Faculty of Management & Finance**


## ආලේඛ්‍ය □ත්‍ර



ජේෆ්රි බවා මහතාගේ
එච්. ඒ. ටී. ප්‍රසාත්
ප්‍රථම ස්ථානය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය



ආචාර්ය රෝනි ද මැල් මහතා
එන්. පී. එස්. දමයන්ති
දෙවන ස්ථානය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය




ආචාර්ය රෝනි ද මැල් මහතා
ටී. ඩී. එම්. ජී. එල්. සිල්වා
තෙවන ස්ථානය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය


## ප්‍රකාශන චිත්‍ර



ඩබ්. ඒ. ඩී. නවෝද්‍යා
ප්‍රථම ස්ථානය
විද්‍යා පීඨය



එම්. පී. එස්. සී. මුතුකුමාරණ
දෙවන ස්ථානය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය



වී. ඒ. එච්. මෙන්ඩිස්
තුන්වන ස්ථානය
ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය

## පොස්ටර් චිත්‍ර



ආර්. අයි. එම්. කෞෂල්‍යා රත්නායක
ප්‍රථම ස්ථානය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය



එස්. ටී. දනුෂිකා ධනන්ජනි

දෙවන ස්ථානය

විද්‍යා පීඨය



**කේ. එස්. ඒ. කොට්ටගේ**

**තුන්වන ස්ථානය**

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය**